# තට්ටුමාරු කට්ටිමාරු ඉඩම් භුක්ති ක්‍රම

ඇම්. පී. මුවර්
ජී. වික්‍රමසිංහ

පර්යේෂණ අධ්‍යයන මාලා අංක 26 1978 ජූලි

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
114 විජේරාම මාවත – කොළඹ 7

2009/06

# කට්ටුමාරු කට්ටිමාරු - ඉඩම් භුක්ති ක්‍රම

ඇම්.පී. මුවර්
පී. වික්‍රමසිංහ

පර්යේෂණ අධ්‍යයන මාලා අංක 26

1978 ජූලි

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 7.

22890

මෙම පර්යේෂණ වාර්තාව සිංහලට පරිවර්තනය කරන ලද්දේ,
පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී,
ඩී. තෙන්නකෝන් විසිනි.

සිංහල පරිවර්තනයේ සංස්කරණ කටයුතු
කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ශූ. සපුකොටන මහතා විසින් කරන ලදී.

සිංහල ප්‍රකාශනයේ මුද්‍රණය
1980 ජූලි මස.

# පෙ ර ව ද න.

තට්ටු මාරු සහ කට්ටි මාරු ඉඩම් භුක්ති ක්‍රමය මෙරටෙහි සමහර පළාත්වලට විශේෂයෙන් තෙත් කලාපීය පහත සහ මැද රටෙහි ආවේණික ලක්ෂණයක්ව පවතී. එකී පළාත්බඳව වුව ද, ගමින් ගමට භුක්ති ක්‍රමයෙහි ක්‍රියාකාරිත්වය බොහෝ දුරට වෙනස් වේ.

මෙම ඉඩම් භුක්ති ක්‍රමයෙහි මූලෝත්පත්තිය හා ඉතිහාසය දැනුදු නොපැහැදිලි ය. මෙම ක්ෂේත්‍රය අළලා සෑහෙන පර්යේෂණ කෘතීන් කෙරී නැතත්, කෙරී ඇති අධ්‍යයනයන් කිහිපය මෙම ඉඩම් භුක්ති ක්‍රමය, එම ක්‍රමය බලපාන ඉඩම්වල අඩු ඵලදායිතාවයට හේතු වන බව පෙන්වා දී ඇත. අවාසනාවකට මෙන් ප්‍රාදේශීය වී නිෂ්පාදනය කෙරෙහි බාධකයක් සේ සළකනු ලබන මෙම ඉඩම් භුක්ති ක්‍රමය නැති කිරීම් වස් දැඩි ප්‍රයත්නයක් පසුගිය කාලය තුළ සිදු වී නැත.

මෙම අධ්‍යයනය ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය හා එංගලන්තයේ සසෙක්ස් විශ්ව විද්‍යාලයේ සංවර්ධන අධ්‍යයන ආයතනය ඒකාබද්ධව සිදු කෙරුණු 'ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ සුළු ගොවි අංශයේ ඵලදායි ශ්‍රම අන්තර් ග්‍රහණය නම් මාතෘකාව යටතේ වූ පුළුල් පර්යේෂණයකින් පැන නැඟුණ අතුරු නිෂ්පාදනයකි.

දැනට ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට අනුබද්ධ වී සිටින සංවර්ධන අධ්‍යයන ආයතනයේ, එම්.පී. මුවර් සහ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ, පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී, පී. වික්‍රමසිංහ යන මහතුන් විසින් මෙම ප්‍රකාශනය සකස් කරන ලදී.

මෙරටෙහි පැවැතෙන ඉඩම් භුක්ති ක්‍රම ගැන උනන්දුවක් දක්වන විද්වතුන් හට මෙම ප්‍රකාශනය ප්‍රයෝජනවත් වන බව මට නිසැක ය.

ටී.බී. සුබසිංහ
අධ්‍යක්ෂ.

ස් තු ති ය.

මෙම නිබන්ධනය තෙත් කලාපීය පහත රට කෘෂිකාර්මික සේවා නියුක්තිය පිළිබඳ පර්යේෂණයකින් පැන නැගුණ අතුරු කෘතියකි. එකී පර්යේෂණයට අදාළ ක්ෂේත්‍ර සමීක්ෂණය කෙරෙන අතරතුර දී තට්ටු මාරු, කට්ටි මාරු ඉඩම් භුක්ති ක්‍රමය සම්බන්ධයෙන් ගැමියන් තුළ පෙනෙන්නට තිබුණ බලවත් නොකැමැත්ත කතුවරයන් ගේ සිත් තුළට වැදුණි. මෙම ඉඩම් භුක්ති ක්‍රමය සම්බන්ධයෙන් ක්ෂේත්‍රයෙහි පවතින සමාජ විද්‍යාත්මක ආකල්ප, නිෂ්පාදනය සහ සේවා නියුක්තිය කෙරෙහි මෙකී භුක්ති ක්‍රමයෙන් ඇති කරනු ලබන බලපෑම් හා මෙම භුක්ති ක්‍රමය සම්බන්ධයෙන් ලිය වී ඇති විග්‍රහාත්මක කෘති පිළිබඳව සවිස්තරාත්මක විමර්ශනයක් කිරීමට හේතු වූයේ මෙම අත්දැකීම යි.

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සහ එක්සත් රාජධානියේ විදේශ සංවර්ධන අමාත්‍යාංශයේ විදේශ පර්යේෂණ, ආර්ථික, සමාජ කොමිටියේ නොමඳ අනුග්‍රහය මෙම පර්යේෂණ කෘතිය සඳහා පිරිනැමිණ. ක්ෂේත්‍ර දත්ත එක් කිරීමේ දී සහාය වූ ආර්.එල්.පී. ධර්මවික්‍රම යූ.ඒ. හේමචන්ද්‍ර, වී. සැම්සන්, ඩබ්ලිව්.එම්. විජේපාල, පී.එම්. විමලසිරි යන මහතුන්ටත් ප්‍රාග් කෘති අවස්ථාවෙහි දී ප්‍රයෝජනවත් විවරණයක් ඉදිරිපත් කිරීමෙන් සහාය වූ ඩබ්ලිව්.ඩී. අයිලප්පෙරුම සහ අයි.කේ. වීරවර්ධන යන මහතුන්ටත් මනා ලෙස යතුරු ලියනය කර දුන් ජසින්තා /පර්නෑන්ඩස් මහත්මියටත් කතුවරයන් ගේ ස්තුතිය පිරි නැමේ.

එම්.පී. මුවර්
පී. වික්‍රමසිංහ

# ප ටු න.


| | පිටුව |
|---|---|
| පෙරවදන | I |
| ස්තුතිය | II |
| පටුන | III |
| වගු ලැයිස්තුව | V |
| සාරාංශය | VI |
| 1. හැඳින්වීම | I |
| 2. පාරිභාෂික ශබ්ද විග්‍රහය | I |
| 3. තට්ටු මාරු-කට්ටි මාරු ක්‍රම පිළිබඳ විෂය අධ්‍යයනය | 4 |
| 4. භුක්ති ක්‍රමයෙහි පැවැත්ම | 7 |
| 5. භුක්ති ධාවය - එහි සංදර්භය | 8 |
| 6. ප්‍රාදේශීය ව්‍යාප්තිය | 14 |
| 7. මාරු භුක්තිය පිළිබඳ ප්‍රකාශිත අධ්‍යයනයන් | 17 |
| I. පී. ඔබේසේකර : 'ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ඉඩම් භුක්තිය'. | 17 |
| II. අයි.කේ. වීරවර්ධන සහ අයි. කොලොන්නගේ : 'තට්ටු මාරු කට්ටි මාරු' විෂය අධ්‍යයනය. | 20 |
| III. පී. ගනේවත්ත : කුඹුරු ගොවිතැනෙහි තට්ටු මාරු සහ කට්ටි මාරු භුක්ති ක්‍රම | 21 |
| 8. ග්‍රාමීය විෂය අධ්‍යයන. | 22 |
| I. ඉහළ ලේල්වල | 22 |
| II. මහගන්ගොඩ | 25 |
| 9. මාරු භුක්ති ක්‍රම පිළිබඳ ගැමියන් ගේ ආකල්ප | 26 |
| 10. වී අස්වැන්න සහ වගා ක්‍රම මත මාරු භුක්ති ක්‍රමයෙහි බලපෑම | 29 |
| 11. කුඹුරු ඉඩම් අර්බුද (ඉඩම් ආරවුල් සහ ගැටළු) | 35 |
| 12. තහනම් කිරීම (නැති කිරීම), ප්‍රතිසංස්කරණය හෝ ඒ අයුරින් ම තිබෙන්නට හැරීම ද? | 41 |

13. ප්‍රතිසංස්කරණ ක්‍රමෝපායයක් 43

උප ග්‍රන්ථය I – මාරු භුක්ති ක්‍රම කාර්ය සිද්ධි ව්‍යාප්තිය පිළිබඳ සංඛ්‍යා විද්‍යාත්මක විග්‍රහය 48

උප ග්‍රන්ථය II – නියැදි ග්‍රාමීය ප්‍රදේශයන්හි මාරු භුක්ති ක්‍රමය පිළිබඳ සංඛ්‍යාන විද්‍යාත්මක දෘෂ්ටි කිහිපයක් 49

උප ග්‍රන්ථය III – බෙදුම්කරයන් ගේ කාර්ය පටිපාටිමය පිළිවෙළ පිළිබඳ අදහස් කිහිපයක් 51

උප ග්‍රන්ථය IV – ගොඩ ඉඩම් සම්බන්ධයෝ පවතින සංඝීය අයිතිය 54

සටහන් 57

## වගු ලැයිස්තුව.

වගුව

1 1975 දිස්ත්‍රික් මට්ටමින් මාරු භුක්ති ක්‍රමය යටතේ ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණයන් ගේ ප්‍රතිශතයන්.

2 ඉහළ ලේල්වල : මාරු භුක්ති ඉඩම් කට්ටි උරුමකරුවන් ඉඩම් බෙදා වෙන් කිරීම් පිළිබඳ දක්වන අදහස්.

3 මහගන්ගොඩ : මාරු භුක්ති ඉඩම් කට්ටි උරුමකරුවන් ඉඩම් බෙදා වෙන් කිරීම් පිළිබඳ දක්වන අදහස්.

4 වී අස්වැන්න හා පෝර භාවිතය කෙරෙහි මාරු භුක්ති ක්‍රමයේ බලපෑම : ඉහළ ලේල්වල සහ මහගන්ගොඩ – මහ 1976/77.

5 වී ගොවිතැනෙහි ශ්‍රම යෙදවුම් කෙරෙහි මාරු භුක්ති ක්‍රමයේ බලපෑම. ඉහළ ලේල්වල මහ 1976–77.

6 නියැදි ග්‍රාමීය ප්‍රදේශයෙහි භුක්ති ක්‍රමයේ සංකීර්ණතාවයේ මට්ටම.

7 මාරු භුක්තියෙහි සංකීර්ණතාවය හා නියැදි ග්‍රාම ප්‍රදේශයේ භුක්තිය පිළිබඳ ගැටුම් හා අර්බුද.

8 නියැදි ග්‍රාමයන්හි මාරු භුක්ති ඒකක ව්‍යාප්තිය අක්කර වලින්.

9 නියැදි ග්‍රාමයන්හි මාරු භුක්ති ඒකක ව්‍යාප්තිය – උරුමකරුවන් ගණන මගින්.

10 මාරු භුක්තිය යටතේ ඇති කැබලි ව්‍යාප්තියේ ප්‍රතිශතය – සමීක්ෂණ සිදු කෙරුණ වර්ෂය ඇතුළත, භුක්ති බල ප්‍රදේශ මගින්.

11 තමාට අයිතිය ඇති ප්‍රමාණයට සියළු ම උරුමකරුවන් අතර දැනට පවතින මාරු භුක්ති ඉඩම් සියල්ලම ස්ථිරවම බෙදා වෙන් කර දුන හොත් ඇති වන කැබලි ව්‍යාප්තියේ ප්‍රතිශතය.

# සාරාංශය.

I. තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමයේ ස්වභාවය හා ආනිසංසයන් ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. එක ගමකට සීමා වූ විෂය අධ්‍යයනයකින් පදනම් වන නිගමනයන් බොහෝදුරට වැරදි මඟක යොමු වීමට හේතු වේ. මෙම නිබන්ධය, ග්‍රාම ප්‍රදේශ පහක විෂය අධ්‍යයනයන් තුලනාත්මකව විමර්ශනය කෙරෙන, බලාපොරොත්තු තැබිය හැකි සාමාන්‍ය වටිනාකමක් සහිත නිගමනයන් පෙරමුණු කෙරේ.

II. තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රමය, තෙත් කලාපීය අභ්‍යන්තර හා මැද රටට කේන්ද්‍ර වූ ප්‍රාදේශීය වශයෙන් පවත්නා ක්‍රමයකි. මෙය ක්‍රමයෙන් ක්ෂය වී යන මුත්, සාපේක්ෂව නාගරික බලපෑමකින් තොර, ග්‍රාමීය ප්‍රදේශවල පවතින බව පෙනේ.

III. තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමය, අතීතයෙහි පැවැති සමාජයීය, තාක්ෂණික හා ආර්ථික ලක්ෂණයන් ගෙන් යුත් වී ගොවිතැනට යෝග්‍ය වූ ක්‍රමයකි. කෙසේ වුව ද, එය අදට සම්පූර්ණයෙන් ම අයෝග්‍ය වූවක් වන අතර, පෞර භාවිතය, අස්වැන්න, සේවා නියුක්තිය සහ වී ගොවිතැනෙහි නව අත්හදා බැලීම් ද හීන කරවන්නකි.

IV. මෙම ක්‍රමයෙන් ඇති වන හානිය ගැමියන් මනාව වටහා ගෙන ඇති අතර, ගොවිතැන් කිරීම කෙරෙහි එය ඇති කර වන අහිතකර බලපෑම් නිසාත්, එය ආරවුල් හා ගැටුම් ඇති කිරීමට මුල් වන නිසාත් ඔවුහු මෙම ක්‍රමයට නොකැමැත්ත පළ කරති.

V. තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමය පවතින්නේ ප්‍රධාන වශයෙන් සාධාරණවූත්, ලාභ සහිත වූත්, මෙන් ම ප්‍රේමන් සහ නීතිමය වටිනාකමකින් යුත් බෙදුම්කරයන් පිළිබඳව ආයතනයක් නැතිකම හේතුවෙනි.

VI. තට්ටුමාරු කට්ටිමාරු භුක්තිය සම්බන්ධයෙන් රජය තීරණය කළ ද, භුක්ති ක්‍රමය සංකීර්ණ නිසාත්, ඉඩම් බෙදා වෙන් කිරීම පිළිබඳ ප්‍රශ්නය පවතින නිසාත්, භුක්ති ආරවුල් සමහරක් බොහෝ කලක් එසේම පවතිනවා ඇත. කෙසේ වුව ද, ඉඩම් බෙදීම සඳහා සුදුසු ආයතන ඇති කිරීමෙන් ඉඩම් කොටස් හිමි වැඩිදෙනා අතර සිය කැමැත්තෙන් ඇති වන ගිවිසුම් මත ආරවුල් වැඩි ගණනක් විසඳිය හැකි වේ යයි විශ්වාස කළ හැක.

VII. සුදුසු නීතිමය ආයතනයක් පිහිටුවීම තුළින් මෙම භුක්ති ක්‍රමය තුරන් කර දැමීම සඳහා අවධානය යොමු කළයුතු යි.

1. හැඳින්වීම.

කිසියම් ඉඩම් කොටසක් වගා කිරීමේ දී අයිතිකරුවන් අතර සිදු වන වාර්ෂික මාරුව තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රමයෙහි සාරය වේ. මෙම භුක්ති ක්‍රමය ශ්‍රී ලංකාවේ සිංහල ප්‍රදේශවලට අතිවිශේෂ වනවා සේම කුඹුරු ඉඩම් සඳහා පමණක් අදාළ වේ. මෙය සවිස්තර ලෙස පර්යේෂණයට ලක්ව නොමැති අතර, එහි මූලෝත්පත්තිය, ඉතිහාසය, ක්‍රියාත්මක භාවය හා ආනිශංසයන් පිළිබඳ අප තුළ ඇත්තේ මඳ දැනුමකි. කෙසේ හෝ අපට මෙහෙය වුන ලද සවිස්තර පර්යේෂණ නිබන්ධ කිහිපය භුක්ති ක්‍රමයෙහි වටිනාකම පිළිබඳව ප්‍රබල සහ ආරවුල් සහිත (ගැටළු සහිත) දෘෂ්ඨීන් උපදවා තිබේ. මෙම අවුල් සහිත භාවය ඇති වී තිබෙනුයේ එක් විෂය අධ්‍යයනයක් එක් ගමකට පමණක් එල්ල වූ නිසා ය. මෙම භුක්ති ක්‍රම භාවිතයෙහි ඓතිහාසික හා වර්තමාන ක්‍රම රටාව එකම ප්‍රදේශයේ වුව ද, ගමින් ගමට පුළුල් ලෙස විවිධ වන නිසා එක් ගමක විෂය අධ්‍යයනයන් සාමාන්‍යකරණයට ලක් කිරීම වැරදි මඟ පෙන්වීමක් බව අපි පහතින් පෙන්වා දෙමු. තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමය ගැන ගැමියන් ගේ ආකල්පයන් ගේ අපහැදිලිතාව යන්හි පුළුල්කමට අනුකූලව පර්යේෂකයන් අතර ඇති නොඑකඟතාවයෙන් තවත් සාධකයක් පිළිඹිබු කරයි. ගොවිතැන් කටයුතු කෙරෙහි ඇති කර වන අහිතකර බලපෑම් හා එයින් හට ගන්නා ආරවුල් හා නොසන්සුන්තාවයන් නිසා මෙම භුක්ති ක්‍රමය ඉවත් කර දැමීමට සාමාන්‍ය වශයෙන් ගැමියන් සූදානම්ව සිටින බවට සාධක මෙම කෘතියෙහි දී පසුතැනක ඉදිරිපත් කොට ඇත්තෙමු. ගැමියෝ එම ක්‍රමය මකා දැමීමට ස්වකීය කැමැත්ත ප්‍රකාශ කරති. නමුත් කුඹුරු ඉඩම්වලට ඇති ඔවුන් ගේ අයිතිය වෙනස් කිරීම හෝ කැප කිරීම (පරිත්‍යාග කිරීම) පිළිබඳව විමසන විට දී භුක්ති ක්‍රමය මකා දැමීමට ඔවුන් තුළ ඇති දැඩි කැමැත්ත පසු බසින බව පෙනේ. නීතිමය බෙදුම්කර මගින් විසඳුම් සෙවීමට යෑමේ දී ප්‍රායෝගිකව ඇති වන ගැටළු හා ගැටීම් හේතුවෙන් ගැමියන් පාඩුවේ සිටීම මෙම භුක්ති ක්‍රමයේ ඇති සංකීර්ණතාවය පැහැදිලි කෙරේ. මූලික කටයුත්ත වී ගොවිතැන වර්ධනය කිරීම ද නැත්නම් ග්‍රාමීය සමාජ ව්‍යුහයේ භුක්තිය ගන්නා තැන විය යුතු ද යන්න අනුව පර්යේෂකයන් ගේ ආකල්පයන් ද වෙනස් වේ.

තට්ටුමාරු කට්ටිමාරු පිළිබඳ ප්‍රකාශිත විෂය අධ්‍යයනයන් තුනකින් හා අපේ ම විෂය අධ්‍යයනයන් දෙකක් ඇසුරෙන් ලත් තොරතුරු විග්‍රහ කිරීමෙන් භුක්ති ක්‍රම දෙස මධ්‍යස්ථ අදහසක් (දෘෂ්ටිය) සේම එහි ආනිශංසයන් ද දත්තයන් ගේ හීනතාවය වැනි බාධකයන් අතර වුව ද හැකි ලෙසකින් හෝ ඉදිරිපත් කිරීමට කතුවරයන් බලාපොරොත්තු වේ.

2. පාරිභාෂික ශබ්ද විග්‍රහය.

තට්ටුමාරු කට්ටිමාරු පිළිබඳව ප්‍රකාශිත කෘතීන්හි සැලකිය යුතු කොටසක් වෙන්ව ඇත්තේ පාරිභාෂික ශබ්ද විග්‍රහයකට ය[1]. මෙම භුක්ති ක්‍රමයට අදාළව භාවිත විවිධ සිංහල වචනයන් ගේ ශබ්දීම හෙවත් විකාශනය පිළිබඳව පවතින නොඑකඟතාවය මෙන් ම ප්‍රදේශයෙන් ප්‍රදේශයට ගැමියන් විසින් භාවිත වචනයන් ගේ ව්‍යාජ හා විචල්‍ය භාවය ද හේතුවෙන් යථාතත්වය යටපත් වී ගොස් තිබේ. භුක්ති ක්‍රමයෙහි පැහැදිලිව ඝනෙන සංකීර්ණ භාවයන් හා විවිධ භාවයන් නිසා නියම පැහැදිලි කිරි

මක් පවා බොහෝ දුරට පසුබා සිටී. යථාතත්වයේ පවත්නා අවුල් සහගත තත්වය අතරින් පිළිවෙලින් එකිනෙකට මාරු වන තට්ටුමාරු මූල ධර්මය සහ කට්ටිමාරු මූලධර්මය යන සරළ තාර්කික මූල ධර්මයන් දෙක පැහැදිලිව දැකීම හැමවිටම පහසු නොවේ.

මෙම භුක්ති ක්‍රමයේ අදහස්වලට සම්බන්ධ ගැමියන් විසින් භාවිත පාරිභාෂික වචනයන් ගේ ව්‍යුත්පත්තියන් හා ප්‍රාදේශීය විවිධත්වයන් පිළිබඳ ලියා ඇති දෙයට සම්මාදන් වීමට හෝ නැමියාවක් දැනුමක් මෙම කතුවරයන් සතුව නැත. සාමාන්‍ය වශයෙන් භාවාත්මක අගයකින් යුක්ත යයි පෙනෙන්නට තිබෙන පාරිභාෂික ශබ්ද කිහිපයක් පළමුව පහදා දීමෙන් හා දෙවනුව නිරවද්‍ය යෙදීමෙන් භුක්ති ක්‍රමයේ ස්වභාවය තේරුම් ගැනීමේ දී පාඨකයාට මුහුණ පාන්නට වන ප්‍රශ්න අවමයකට අඩු කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

I. තට්ටුමාරු නියාමය :

තට්ටුමාරු භුක්ති ක්‍රමය නම් පුද්ගලයන් දෙදෙනකු ගේ හෝ වැඩි සංඛ්‍යාවක් අතර බෙදී ගිය කුඹුරු ඉඩම් කැබැල්ලක් වාර්ෂික මාරුවක් මත වගා කිරීමට ඇති අයිතිවාසිකම යි. ඉඩම භෞතික වශයෙන් බෙදෙනවා වෙනුවට වගා කිරීමට හිමි කම් ඇති අයවළුන් (කොටස් කරුවන්) ඉඩම වගා කිරීමේ දී වාර්ෂිකව මාරු වේ. ලුහුඬු සිදු විය හැකි ප්‍රත්‍යක්ෂයක් උදාහරණ ලෙස ගෙන විමසා බලමු. එක් පුද්ගලයකු සතු ඉඩම ඔහුගෙන් පසු ඔහු ගේ දරුවන් දෙදෙනාට හිමි වේ. මේ නිසා එක් අයෙකු වගා කිරීම 1977-78 කෘෂිකාර්මික වර්ෂයේ දී කරන අතර, අනෙකා 1978-79 දී වගා කරයි. මේ ආදී පිළිවෙළට එම භුක්ති ක්‍රමය දිගටම පැවැතේ. වගා කිරීමේ වාරය හිමි වීමේ පිළිවෙළ තීරණය වනුයේ වයස අනුව ය. වැඩිමහල් පුද්ගලයාට ප්‍රථම අවස්ථාව හිමි වනුයේ. 'තට්ටුමාරු' යන යෙදුමේ එක් අර්ථ කථනයක් එහි අදහස පැහැදිලිව ප්‍රකාශ කරයි. 'එනම් කුඹුරු ඉඩම වරක් තට්ටු කිරීම යි.' මෙම භුක්ති ක්‍රමය පිළිගැනීම පිටුපස තිබූ අදහස දැන් මනාව පැහැදිලි විය. එනම් ඉඩම් කැබැල්ලක් කුඩා කැබලි වලට කැඩී යාමෙන් වළක්වා ගැනීම යි.

II. කට්ටිමාරු නියාමය :

මෙහි දී අයිතිකරු ගේ මරණයෙන් හෝ විශ්‍රාම ගැනීමෙන් පසු ඉඩම බෙදී යයි. උරුමකරුවන් අතර ස්ථිරව කොටස් බෙදා ගන්නවා වෙනුවට තමාට උරු ම ප්‍රමාණයට සරිලන කොටසක් දේපල වලින් පිළිවෙළින් වාර්ෂිකව හෝ වර්ෂ කිහිපයකට සීමා වන පදනමක් මත වගා කිරීමට අයිතිය ලබා ගනී. ලුහුඬු ප්‍රත්‍යක්ෂයක් ගෙන බලමු. මිනිසෙක් ඔහු ගේ කුඹුර 'ඒ' සහ 'බී' වශයෙන් කොටස් දෙකකට බෙදයි. 1977-78 කෘෂි වර්ෂයේ ඔහු ගේ පුතා වන පීටර් 'ඒ' ඉඩම වගා කරයි. ඒ අතරම ඔහු ගේ අනෙක් පුතා වන ජේම්ස් 'බී' කොටස වගා කරයි. මේ ලෙසට වාර්ෂිකව ඉඩම් කොටස හා පුද්ගලයන් මාරු වේ. මේ නියාමය අනුව කොපමණ උරුමකරුවන් සිටියත් සහභාගි විය හැකි

ය. වගා කිරීමට ඇති ඉඩම් කට්ටි ගණන වෙනස් නොවන අතර, උරුමකරුවන් අධික වන විට භුක්ති චක්‍රය සම්පූර්ණ වීමට සෑහෙන කාලයක් ගනී. උදාහරණයක් වශයෙන්, දේපලක් ඉඩම් කැබලි හතකට බෙදී ඇතත්, එක් පුද්ගලයෙකුට කොටස් 4 ක් උරුම නම් ඔහු සෑම වර්ෂයකම නොතැනක හෝ ඉඩම් කැබලි 4 ක් වගා කරයි. සමහර අවස්ථාවල දී කුඹුරක් එක ළඟ පිහිටි කැබලි කිහිපයකට බෙදී පවතින විට දී ද, කට්ටිමාරු භුක්ති ක්‍රමය පැන නැඟී ඇති බව පෙනේ. උදාහරණ : ගමක විවිධ කොටස්වල පිහිටි කුඹුරු කැබලි තුනක් ඇති විට, උරුමකරුවන් තිදෙනා අතරේ කට්ටිමාරු ක්‍රමයකට වග කිරීමට එකඟතාවයක් ඇති කර ගනී. කට්ටිමාරු නියාමය පසුපස ඇති තාර්කිකත්වය නම්, වර්ෂයෙන් වර්ෂයට වෙනස් ලෙස බලපාන පරිසරයක සාපේක්ෂ වටිනාකමක් ඇති විවිධ කුඹුරු ඉඩම් වල පළිබෝධ හා සතුන් ගෙන් වන හානි, ජල සැපයුම්, පාංශු ක්ෂාරය, වැනි සාධක මුල් කොට ගෙන වන හොඳ හෝ නරක අවස්ථාවන් සමාන කර ගැනීම යි.

III. ඒකාබද්ධ තට්ටුමාරු කට්ටිමාරු :

ඉහතින් දැක් වූ පරිදි තාර්කිකව හා ප්‍රායෝගිකව තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රම සම්බන්ධ සරල ප්‍රභේදයන් හඳුනා ගැනීම පහසු ය. 6 වැනි වගුවෙන් අප විසින් සාරාංශ කොට දක්වා ඇති සාධක අනුව එකම භුක්ති ප්‍රභේදයක තට්ටුමාරු හා කට්ටිමාරු නියාමයන් දෙකම ඒකාබද්ධව සිදු වනු බොහෝ විට දැකිය හැකි ය. මෙයින් අදහස් කරන්නේ කුමක් ද යන්න පිළිබඳව උදාහරණයන් පහත 3 වන කොටසේ ඉදිරිපත් කොට ඇත. මෙම සම්බන්ධ තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ප්‍රභේදයන් අනෙක් සරල තට්ටුමාරු හෝ සරල කට්ටිමාරු නියාමයන්ට වඩා සංකීර්ණ බැවින් භුක්ති ක්‍රමය වටහා ගැනීමේ දී හා විස්තර කිරීමේ දී බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට හේතු වේ.

IV. 'තට්ටුමාරු – කට්ටිමාරු ක්‍රමය' යන්න යෙදී ඇත්තේ භුක්ති ක්‍රමය සම්බන්ධයෙන් වන සියලු ම සංකීර්ණ නියාමයන් හා භුක්ති ක්‍රමය ඇතුළත් ප්‍රභේදයන් විෂයෙහි ය. නියමිත අවස්ථාවේ දී 'මාරු භුක්තිය' යන්න අප විසින් යොදා ඇත්තේ කියවීමේ පහසුව පිණිසය.

අප කර ඇතිවාක් මෙන් ම තට්ටුමාරු සහ කට්ටිමාරු නියමයන් අතර දැඩි වෙනසක් ඇති කර ගැනීම එතරම් ම අවශ්‍ය නොවන බව සටහන් කර ගත යුතු ය. වෙන් වූ බිම් කැබලි කිහිපයක සම්බන්ධීකරණ මාර්ගයක් වශයෙන් තට්ටුමාරු නියාමය, පදනම් කර ගෙන කට්ටි මාරු නියාමය යෙදී පැවැතීම විකල්ප වශයෙන් ඉදිරිපත් කළ හැකි ය. මේ අනුව යමෙකුට සමහර ප්‍රදේශවල මෙම තට්ටුමාරු කට්ටිමාරු නියාමයන් දෙකම වෙනුවෙන් එක් භාෂික ශබ්දයක් යොදන්නේ ඇයි ද යන්න වටහා ගන්නට ඉඩ තිබේ. මෙම විකල්පය වැරදි නොවෙතත් එමගින් භුක්ති ක්‍රමය පිළිබඳ සාකච්ඡා හා විග්‍රහයන් ගේ අපහැදිලිතාවයක් ඇති වීමට ඉඩ තිබේ. මේ කරුණු නිසා එම නියාමයන් දෙක පැහැදිලි ලෙස වෙන් කර දක්වමු.

## 3. සම්බන්ධ තට්ටුමාරු කට්ටිමාරු පිළිබඳ විෂය අධ්‍යයනයක්.

දැනටමත් ඇති වී ඇති අවුල් සහගත භාවය වෙනුවට පාඨකයා තුළ විෂයය කෙරෙහි උනන්දුවක් ඇති කිරීම් වස් භුක්ති ක්‍රමයේ අව්‍යාජ චිත්‍රය ආලෝකමත් කිරීමට මෙම විෂය අධ්‍යයනයෙන් අපි බලාපොරොත්තු වෙමු. සැබෑ ජීවිතයෙන් ගැණුනු මෙම ප්‍රත්‍යෙකයහි ඇත්තේ සාමාන්‍ය විවිධත්වයකි.

ප්‍රත්‍යෙකයේ ආරම්භය 1865–1885 අතර කාලයේ යයි අනුමාන කෙරේ. මෙහි ආරම්භක මුත්තන් දැන් මිය ගොස් හෝ වයසින් අවුරුදු 50 ඉක්ම ගොස් ය. මුල දී කාලයක්ව තිබුණ ඉඩමෙහි කුඹුරු අස්වැද්දුවේ පේදුරුහේවා (පි.එච්) සහ ලොකු ලියනගේ (එල්.එල්.) යන පවුල් දෙක පිළිවෙළිනි. කුඹුරු ඉඩම කුඩා නිම්නයක පතුලේ පටුවට හා බොහෝ දිග හැඩයකින් යුක්ත වූ අතර සාරවත්භාවය අතින් කොටසින් කොටසට විවිධ වේ. මෙම ඉඩමේ ආරම්භකයන් දෙදෙනා ඉඩම 'අ' 'ආ' සහ 'ඇ' වශයෙන් පිළිවෙළින් අක්කර 1.67, අක්කර 1.67 සහ අක්කර 1.25 ප්‍රමාණයේ කොටස් තුනකට බෙදන ලදි. ඔවුහු අ සහ ආ කොටස් දෙක කට්ටිමාරු ක්‍රමයට ද, 'ඇ' කොටස තට්ටුමාරු ක්‍රමයට ද, වගා කළහ.

මුල් පිළිවෙළ සැකැස්ම දැක්විය හැක්කේ පහත සඳහන් පරිදි ය.

| | කැබැල්ල 'අ' | කැබැල්ල 'ආ' | කැබැල්ල 'ඇ' |
|---|---|---|---|
| වර්ෂය 1 | එල්.එල්. | පි.එච්. | එල්.එල් |
| වර්ෂය 2 | පී.එච්. | එල්.එල්. | පී.එච්. |

චක්‍රය සම්පූර්ණ වීමට වර්ෂ දෙකක් ගත වන අතර, මේ කාලය තුළ සියළු ම උරුමකරුවන්ට සෑම කැබැල්ලක් ම වගා කිරීමේ අවස්ථාව ලැබේ. මෙහි දී අප නියත ලෙසම සම්බන්ධ තට්ටුමාරු කට්ටිමාරු නියාමය පිළිබඳව කථා නොකරමු. 'ඇ' කැබැල්ල සම්බන්ධව පවතින තට්ටුමාරු ක්‍රමය සහ 'අ' සහ 'ආ' කැබලි දෙකට සම්බන්ධ කට්ටිමාරු ක්‍රමය අතර පැහැදිලි වෙනස පෙන්වමු.

ඉඩමේ නිර්මාතෘවරයින් දෙදෙනාම තම තමන් ගේ පංගු තම නියම එක් උරුමකරුවකුට නියම කල නිසා දෙවෙනි පරම්පරාවේ දී ද භුක්ති ක්‍රමය නොවෙනස්ව පවතී. විවිධත්වය පටන් ගනුයේ තෙවන පරම්පරාවේ දී ය. පී.එච්. පවුලට අයත් කොටස එකී උරුමකාර ස්ත්‍රිය වන පී.එච්. ජසිනෝනාට ඇගේ දෑවැද්ද වශයෙන් සම්පූර්ණයෙන් පැවරේ. එල්.එල්. පවුලේ කොටස, එල්.එල්. 1 සිට එල්.එල්. 7 වශයෙන් උරුමකරුවන් හත් දෙනෙකුට බෙදේ. ඔවුන් ගේ පියාට වෙනත් තැන්වල ඉඩම් තිබුණ නිසා මෙම ඉඩම් කොටසේ උරු උරුමය දරුවන් හත් දෙනා අතර සමසේ නොබෙදිති. එනිසා එකී එක් අය ගේ උරුම

කොටසේ ප්‍රමාණය වෙනස් වේ. එල්.එල්. 1 උරුමකරු 'ඇ' කැබැල්ල සම්බන්ධයෙන් පවුලේ සම්පූර්ණ උරුමය ලබයි. මේ අතර කැබලි 'අ', 'ආ', කොටස්වල පවුලේ උරුමය අනෙක් උරුමකරුවන් හය දෙනා අතර බෙදේ. මේ කැබලි දෙක වගා කිරීමේ දී එල්.එල්. 2 සහ එල්.එල්. 3 හැර සෑම උරුමකරුවකුම 1/2 ක පංගුවක් ලබන අතර, අනෙක් උරුමකරුවන් එක පංගුවක් ලබා ගනී. මේ අනුපාතයට එක් එක්කෙනා ගේ වගා කිරීමේ වාරය පැමිණේ. මේ පිළිවෙළ නිසා මුල දී 'අ' සහ 'ආ' කොටස් ක්‍රියාත්මක වූ කට්ටිමාරු ක්‍රමය මත දැන් තට්ටුමාරු ක්‍රමයට සම්බන්ධ වී පවතී. මෙම නව සැකැස්ම අනුව සම්බන්ධ තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමය කැබලි 'අ' සහ 'ආ' හි දක්නට ඇත්තේ පහත සඳහන් පරිදි ය.

| | | කැබැල්ල 'අ' | කැබැල්ල 'ආ' | කැබැල්ල 'ඇ' |
|---|---|---|---|---|
| වර්ෂය 1 | .. | එල්.එල්. 1 | පී.එච්. | එල්.එල්. 1 |
| වර්ෂය 2 | .. | පී.එච්. | එල්.එල්. 2 සහ එල්.එල්. 3 | පී.එච්. |
| වර්ෂය 3 | .. | එල්.එල්. 4 | පී.එච්. | එල්.එල්. 1 |
| වර්ෂය 4 | .. | පී.එච්. | එල්.එල්. 5 | පී.එච්. |
| වර්ෂය 5 | .. | එල්.එල්. 6 | පී.එච්. | එල්.එල්. 1 |
| වර්ෂය 6 | .. | පී.එච්. | එල්.එල්. 7 | පී.එච්. |

කට්ටිමාරු ක්‍රමයේ දී පෙනෙන්නට ඇති පරිදි මෙම 'අ' සහ 'ආ' කොටස්වල ක්‍රියාත්මක සම්බන්ධ තට්ටුමාරු කට්ටිමාරු ප්‍රත්‍යෙකයන්හි සෑම හිමිකරුවෙකුමම සෑම කැබැල්ලක්ම වගා කිරීමේ වාරයක් තිබිය යුතු ය යන්න එලෙසම සිදුව නැත. එනම්, එල්.එල්. 1 කිසි දිනක 'ආ' කැබැල්ල වගා නොකරයි. එල්.එල්. 2 හා එල්.එල්. 3 කිසි දිනක කැබැල්ල 'අ' වගා නොකරයි, ආදී වශයෙනි. නියාමයේ පරිදිම ක්‍රියාත්මක වන්නේ නම් කාල චක්‍රය සම්පූර්ණ වීම බොහෝ කාලයක් ගත වනු ඇත. මේ තත්වයේ වුව ද, ඇතුළු කැබැල්ල 'ඇ' සම්පූර්ණයෙන් ම කැබලි 'අ' සහ 'ආ' හි මාරු ක්‍රමයට වෙනස් ය.

පී.එච්. පවුලේ එකම උරුමකරු වන පී.එච්. ජසිනෝනා ඇය ගේ කොටස් සියල්ලම පිළිවෙළින් ඇය ගේ සහෝදරයෙකු හා මස්සිනා කෙනෙකු වන පී.එච්. කරෝලිස් හා එච්.එච්. හේමසිරි යන දෙදෙනාට අඳයට දී ගම අතහැර ගොස් ඇති නිසා දැනට මෙම කැබලි තුනම එක් වී එකම ප්‍රත්‍යෙකයක් වශයෙන් දක්නට ඇත. කාලයකට පසු පී.එච්. ජොසිනෝනා කැබැල්ල 'ආ' සම්බන්ධව ඇගේ සියළු ම උරුමයන් සමසේ බෙදා කරෝලිස් හා හේමසිරි යන දෙදෙනාට අඳයට වගා කිරීමට දෙන ලදී. තවත් කාලයකට පසු කැබලි 'අ' සහ 'ඇ' අයිතිය පිළිවෙළින් කැබැල්ල 'අ' හේමසිරිටත්, කැබැල්ල 'ඇ' කරෝලිස්ටත් අඳයට වගා කිරීමට පවරන ලදී.

එල්.එල්. පවුලේ පංගු විකිණීමෙන් හා විවාහ නිසා විසිරී ගොස් ය. මෙම පවුලෙන් දැන් ඉතිරිව ඇත්තේ උරුමකරුවන් දෙදෙනෙකි. දැන් පිළිවෙළ සැකැස්ම දැක්විය හැක්කේ පහත සඳහන් පරිදි ය.

| | කැබැල්ල 'අ' | කැබැල්ල 'ආ' | කැබැල්ල 'ඇ' |
|---|---|---|---|
| වර්ෂය 1 | ඉඩම් හිමි ගොවියා එස්.ටී. රයිනිස්* | හිමියා: පී.එච්. ජසි නෝනා<br>අඳ ගොවියා: එම්.එච්. හේමසිරි සහ පී.එච්. කරෝලිස් | හිමියා : එල්.එල්.ඇලිස් නෝනා<br>අඳ ගොවියා : එල්.එල්. 6 |
| වර්ෂය 2 | හිමියා : පී.එච්. ජසිනෝනා<br>අඳ ගොවියා : එම්. එච්. හේමසිරි | ඉඩම් හිමි ගොවියා : එම්.එච්.සාර්ලිස්* සහ එම්.ඒ. සිමන් ** | හිමියා : පී.එච්.ජසිනෝනා<br>අඳ ගොවියා : පී.එච්. කරෝලිස් |
| වර්ෂය 3 | ඉඩම් හිමි ගොවියා : ඒ.පී. පීටර් * | හිමියා : පී.එච්. ජසිනෝනා<br>අඳ ගොවියා : එම්.එච්.හේමසිරි සහ පී.එච්. කරෝලිස් | අයිතිකරු : එල්.එල්.ඇලිස් නෝනා<br>අඳ ගොවියා : එල්.එල් 6 |
| වර්ෂය 4 | හිමියා : පී.එච්. ජසිනෝනා<br>අඳ ගොවියා : එම්.එච්. හේමසිරි | ඉඩම් හිමි ගොවියා : එස්.ටී. රයිනිස්** | හිමියා : පී.එච්. ජසිනෝනා<br>අඳ ගොවියා : පී.එච්. කරෝලිස් |
| වර්ෂය 5 | ඉඩම් හිමි ගොවියා එල්.එල්. 6 | හිමියා : පී.එච්. ජසිනෝනා<br>අඳ ගොවියා : එම්.එච්. හේමසිරි හා පී.එච්. කරෝලිස් | හිමියා : එල්.එල්.ඇලිස් නෝනා<br>අඳ ගොවියා : එල්.එල්. 6 |
| වර්ෂය 6 | හිමියා : පී.එච්. ජසිනෝනා<br>අඳ ගොවියා : එම්.එච්.හේමසිරි | ඉඩම් හිමි ගොවියා : එස්.ටී. රයිනිස්* | හිමියා : පී.එච්. ජසිනෝනා<br>අඳ ගොවියා : පී.එච්. කරෝලිස් |

* – උරුමයෙන් හෝ දෑවැද්ද වෙනුවෙන් එල්.එල්. පවුලේ පංගු ලැබුණ අය

** – මිළ දී ගැනීමෙන් එල්.එල්. පවුලේ පංගු ලැබූ අය

මෙම කැබලි තුනම එකතුව ඉඩමේ සම්පූර්ණ විශාලත්වය අක්කර 4.58 කි. මෙයට උරුම කරුවන් හත් දෙනෙකි. එක්කෙනා ගේ උරුම ප්‍රමාණයන් භාගයකි වශයෙන් දක්වන්නේ නම් ෙ මෙසේ ය. මුළු ඉඩම් ප්‍රමාණයෙන් පී.එච්. ජසිනෝනාට අයිති 1/2 ; එස්.ටී. ඊයිනිස් 12/66; එම්.එච්. සාර්ලිස් 2/66 ; එච්.ඒ. සීමන් 2/66 ; ඊ.පී. පීටර් 4/66 ; එල්.එල්. ඇලිස්නෝනා 9/66 ආදි වශයෙනි.

## 4. භුක්ති ක්‍රමය – පැවැත්ම හා පිළිවෙළ.

සරල තට්ටුමාරු හා කට්ටිමාරු නියාමයන් වශයෙන් කෙලින්ම එන ප්‍රතෙයකයන් හැරෙන්නට සෑම ප්‍රතෙයකයක්ම එකිනෙකාට විශේෂ වූ ලක්ෂණයන් ගෙන් හා ඉතිහාසයකින් යුක්ත වේ. සංකීර්ණ වී ඇති ප්‍රමාණය ඉතා විශාල ය. වාර්තා වී ඇති සම්බන්ධ තට්ටුමාරු කට්ටිමාරු ප්‍රතෙයකයන් අතුරෙන් බොහෝ සංකීර්ණගත ප්‍රතෙයකය නම් උරුමකරුවන් 479 දෙනෙකු අතර, අවුරුදු 16 කින් අවසාන වන කාල චක්‍රයක මාරුවන බිම් ප්‍රමාණයෙන් අක්කර 2.06 ක් වූ කුඹුරු කට්ටි යෙහි භුක්ති ක්‍රමයයි[3]. ඔබේසේකර වීරවර්ධන සහ කොලොන්නගේ යන අය ගේ සුපරීක්ෂාකාරීව විභාගව ඇති විෂය අධ්‍යයනයන් තුළින් ඒ ඒ පුද්ගලික ප්‍රතෙයක වර්ධනයේ සිත් බැඳ ගන්නා විනෝදජනක සවිස්තරයන් හමු වේ. ඉඩකඩ ගැන සළකා තවදුරටත් විෂය අධ්‍යයනයන් ඉදිරිපත් කිරීමෙන් අපි පරිස්සම් වූයෙමු. භුක්ති ක්‍රමයේ නියම ක්‍රියාත්මක පැත්ත පිළිබඳ බොහෝ වැද ගත් අදහස්, ඇගැයීම්, ආදර්ශ පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රතෙයකයක් ඉහතින් දැක්වූයෙමු. ඒ අනුව භුක්ති ක්‍රමයේ පැවැත්ම පිළිබඳ අදහස් කිහිපය පහත සඳහන් පරිදි විග්‍රහ කළ හැකි ය.

(I) කාලීන හා අවකාශීය වශයෙන් උරුමකම් පිළිබඳව සැළකිය යුතු විවිධතාවයක් සිංහල සංස්කෘතියෙහි දක්නට තිබේ. නොවෙනස් වූ පිළිවෙත නම් දේපල දරුවන් අතර බෙදී මේ දී දිය යුතු ප්‍රමාණය හා දිය යුත්තේ කාට ද යන්න තීරණය කරනුයේ බූදල් හිමියා ගේ අභිමතය පරිදි වීම ය. ඉහතින් එල්.එල්. පවුල අතර උරුමය බෙදී ගිය අයුරු උදාහරණ සහිතව දැක්වීමු. මේ අනුව තට්ටුමාරු කට්ටිමාරු භුක්තියේ බෙදීමට අපහසු කුඩාම කුඹුරු කැබැල්ල තෙක් බෙදී ගිය අයුරු පැහැදිලි ය. සියලු ම උරුම කරුවන් පිරිමි උරුමකරුවන් ම පමණක් ම වුව ද, ඔවුන් ගේ මුත්තන් ගෙන් උරුම වූ සියලු ඉඩම් කැබැල්ලකින් ම උරුම කොටස් හිමි කර ගන්නේ නම් ඇත්තවශයෙන් දැන් ඇති සාමානය විවිධත්වයට වඩා අතිශය සංකීර්ණ විටට තිබුණි.

(II) තට්ටුමාරු කට්ටිමාරු පංගු මිළ දී ගැනීම හා විකිණීම ආදිය නිසා භුක්ති ක්‍රමය වාණිජමය වී තිබේ. අප ගේ විෂය අධ්‍යයනයෙන් පෙන්වා දී ඇති පරිදි එස්.ටී. ඊයිනිස් විසින් ඔහුට දෑවැද්දට ලැබුණ එල්.එල්. පවුලේ පංගුවල කොටස් හයෙන් ලත් කොටසට අමතරව තවත් කොටස් දෙකක් මිළ දී ගන්නා ලදී. මේ මිළ දී ගැනීම් නිසා ඒ ඒ ප්‍රතෙයකයේ විවිධත්වය සීමා වෙන අතර උරුම කොටස් ඒකාබද්ධ වීමේ පිළිවෙළ කුත් ඇති වේ.

(III) තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමය යටතේ ඇති කුඹුරු කැබලි වලින් සැලකිය යුතු කොටසක් 'අඳ' ක්‍රමයට ගොවිතැන් කරයි. උරුමකරුවන් දෙදෙනෙක් හෝ කිහිප දෙනෙක් වගා කිරීම සඳහා තම උරුමයන් එක් අඳ ගොවියෙකුට පවරයි. මෙය භුක්ති ක්‍රමයේ නියම ක්‍රියාත්මක අංශය මනාව පැහැදිලි කරයි. පුද්ගලයන් කිහිප දෙනෙකු ගේ උරුමයන් ඉතාම කුඩා පංගුවලට සීමාවීමේ දී මේ තත්වය ඇති වේ.

(IV) බොහෝ කුඩා ප්‍රමාණයේ පංගු ඇති විට එකී උරුමකරුවෝ වගා කිරීමේ උරුමයට ඉදිරිපත් නොවෙනවා පමණක් නොව, තම උරුමයට ලක් වන බිම් කුලියට පවා ලබා ගැනීමට උනන්දු නොවෙති. කුඩා පංගු හිමියන් ඒ අස්වැන්න සඳහා තම අයිතිය ප්‍රකාශ කිරීම වෙනුවට දැඩි උනන්දුවක් දක්වනුයේ තම උරුම වාසි ප්‍රමාණයෙන් ගණනය කිරීම හා නාමික උරුම අයිතිය දිගටම ගෙන යෑම ය.

(V) තනි අයිතියක් එක් අයෙකුට වැඩි උරුමකරුවන් අතරට ගිය විට තට්ටුමාරු භුක්ති ක්‍රමය අනුව හෝ නැත්නම් එකිනෙකට අයත් ප්‍රමාණයට උරුමකරුවන් අතර භෞතික වශයෙන් බෙදා ගැනීමට ද ඉඩ තිබේ. අප ගේ විෂය අධ්‍යයනයේ දී එල්.එල්. පවුලට අයත් උරුමය උප කොටස් වලට බෙදී යාමේ දී ඉහතින් දැක් වූ ක්‍රම දෙකම භාවිතා වූ බව පෙනේ.

(VI) ඕනෑම ප්‍රත්‍යෙකයක ක්‍රියාත්මක අංශයන් ප්‍රධාන වෙනස් කිරීම්වල දී සියලු ම පංගු උරුම කරුවන් ගේ කැමැත්ත අවශ්‍ය වන නමුදු බොහෝ විට මෙවැනි යොදා ගැනීම් වලින් වැඩි හරියක් පිළිපැද ඇත්තේ පංගු උරුමකරුවන් ගෙන් ඉතා සුළු කොටසක් වන අතර, සමහර අවස්ථාවල අනෙක් උරුමකරුවන්ට කිසිම දැන්වීමක් නොකර පවා ඔවුන් ගේ කැමැත්තෙන් තොරව එවැනි වෙනස් වීම් සිදු විය හැක.

කෙටියෙන් බලන විට පරම්පරාවෙන් පරම්පරාවට මාරු වී යන තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ඉඩම් ආශ්‍රයෙහි සංස්කෘතික සම්ප්‍රදායික පිළිවෙත් වෙතින් සැකැසී සාමාජික රාමුවක් ඇති අතර, සම්ප්‍රදායික නීති රීති වෙත අන්ධ වහළුන් වීමු කෙරෙන් ගැමියෝ බොහෝ දුරස්ට වේ. දේපල උරුමය තීන්දු කිරීම සඳහා වන ආයතන, උරුම පංගු වාණිජකරණයට ලක් වීම, අඳ ඉඩම් භුක්තිය යන ඒවා විසින්, වෙනත් කිසියම් වැඩ කරන හෝ අයිති තනි දේපලක ක්‍රියාකාරී රටාවන් තුළට සාමාන්‍ය හෝ තදබල වෙනස්වීම් හඳුන්වා දීම් වස් ඇති ඉඩකඩ පිළිබඳ ඉඟියක් ඇති කරවයි.

5. භුක්ති ක්‍රමය - එහි සංදර්භය.

මාරු භුක්තිය, ශ්‍රී ලංකාවේ සිංහල ප්‍රදේශවලින් බැහැර කවර තැනක හෝ එලෙසම අප දන්නා තරමින් දක්නට නැත. දකුණු හා අග්නිදිග ආසියාවේ වී වගා කරන ප්‍රදේශවල සමාන භෞතික හා සමාජ පරිසරයන්හි සම්පූර්ණයෙන් ම මෙය දක්නට නැත්තේ මන්ද යන්න පිළිබඳ හේතු සාධක අප සතුව නැත. එනිසා භුක්ති ක්‍රමයේ ආරම්භය පැහැදිලි කිරීම අසීරුය. කෙසේ වෙතත් බිහි

වී වර්ධනය වූ ප්‍රදේශයන්හි පරිසරයට භුක්ති ක්‍රමය සම්බන්ධ කිරීමේ හැකියාව තිබේ.

පළමු කොටම කිව හැක්කේ මාරු භුක්තිය පිළිබඳ එකිනෙක ප්‍රභේදයන් ගෙන් වැඩි කොටසක් මූලෝත්පාදනය වූයේ මෑතක දී බව ය. එනම්, පසු වූ පරම්පරා දෙකක සිට හතරක් දක්වා කාලය අතර නැත්නම් මීට පෙර අවුරුදු 50–100 ක කාලයක තුළ දී බව ය. මේ කාලය තුළ ජනගහණය සේම අක්කර ප්‍රමාණය ද සෑහෙන ප්‍රමාණයකින් වැඩි වූ නිසා යම්කිසි සුළු විමතියකට හේතු වේ. වීරවර්ධන හා තොලොන්තගේ අදහස අනුව විවිධත්වය බහුල ප්‍රධාන භුක්ති ප්‍රභේදයන් 17 හෝ 18 වන සියවස්වල සිට එනම් දැනට පරම්පරා 4 සිට 6 ක කාලයක පෙර දී ඇති වී වර්ධනය වූ බව ය. ඔබේසේකර 1970 ගණන්වල දී කරන ලද ඔහු ගේ අධ්‍යයනයෙන් ආරම්භය තවත් කලින් විය හැකි යයි පෙන්වයි. ඉතාම සුළු භුක්ති ප්‍රභේදයන් ප්‍රමාණයක් යුරෝපීය පාලන යුගයට පෙර මූලෝත්පත්ති වූ බව පෙනෙන්නට ඇත ද, නිසැකවම සම්පූර්ණයෙන් වාගේ 16 වැනි ශත වර්ෂයේ අග භාගය හරියේ දී රටෙහි යම් කොටස්වල විශේෂයෙන් ම තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රමය පුළුල් ලෙස ව්‍යාප්ත වූ ප්‍රදේශවල ආරම්භව පටන් ගත් බව එයින් පැහැදිලි කරයි. භුක්ති ක්‍රම සංස්ථා මූලෝත්පත්තිය විදේශීය පාලනයට පෙර වුව ද, එහි භෞතික ව්‍යාප්තිය ස්ථාපිත වූයේ යටත් විජිත කාලයේ දී ය.

තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමයේ ව්‍යාප්තිය කාලනිර්ණය ගැන අප සතුව ඇත්තේ අඩු දැනුමක් නිසා ප්‍රධාන පර්යේෂණ කාර්යයක් කිරීමට ඉතිරිව ඇත. දින වකවානු ගැන දැනීමක් නැති වුව ද, භුක්ති ක්‍රමය බිහි වී වර්ධනය වූ ආකාරය පිළිබඳව නැවත ගොඩ නඟා ගන්නා කිසියම් පරිසරයක් තුළින් භුක්ති ක්‍රමය පැහැදිලි කිරීමේ කාර්යයට අපට හවුල් විය හැකි ය. අප විසින් සකසෙන, නැවත ගොඩ නංවීම කිසියම් ප්‍රමාණයකට අනුමාන වටිනාකමකින් යුක්ත වන අතර, දැනට දන්නා සාධක ස්වල්පය කෙරෙන් තාර්කිකව බැහැර කිරීමකට ද පදනම් විය. තට්ටුමාරු කට්ටිමාරු ක්‍රම යට අතීතයේ තිබූ ජනප්‍රිය භාවයත් අද ගොවියන් ගේ පවතින අප්‍රසාදයත් පිළිබඳව බුද්ධිමත් නිර්ණයක් සැපයෙන අයුරු එයින් මනාව පෙන්වා දෙනවා පමණක් නොව, සාධකයන්ට මනාව ගැල පෙන වෙනත් නියායක් නොමැති බව ද අපි දනිමු.

අප ගේ ප්‍රතිනිර්මාණ කටයුත්තේ දී (නව ගොඩනැන්වීම) එහි ආරම්භක ප්‍රධාන කල්පනාව ලෙස ගන්නේ ශත වර්ෂ කිහිපයක් මුළුල්ලේ දීර්ඝ කාලීන ජනගහණ වර්ධන සාධකය යි. දෙවැනි සම්බන්ධ සාධකය නම් කුඹුරු ඉඩම් බිම් ප්‍රමාණය වැඩිව ඇත්තේ ජනගහණයට සාපේක්ෂව අඩුවෙනි. මේ නිසා ජනගහණයට සාපේක්ෂව වී බිම් ප්‍රමාණය බොහෝ වැඩි බව සහ ශ්‍රමය හිඟව තිබූ බව පැහැදිලි ය. (ක්‍රි.ව. 1700 සිට 1940 අතර කාලය) ඔවුන් ගේ ජීවිත කාලය තුළ දී ම වී ගොවිතැන් ක්‍රම වෙනස් වී ආ ආකාරය ගැන පැරණි ගැමියන් ගේ කියමන් වලට මෙම ලඝුඩ සාධකය ගැලපෙන්නේ නම් අතීතයේ වී ගොවිතැනේ සමාජයීය හා භෞතික පරිසරය යළි ගොඩ නඟා ගැනීමට අපට හැකි වේ. තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමයේ පරිණාමයට අදාළ වූ මෙම විශේෂය පරිසරයේ ප්‍රධාන ලක්ෂණ දෙකකි. පළමුවැන්න නම් අද තත්වයට සමාන කරන විට එකල ඉඩම්වලට වඩා ශ්‍රමය හිඟ සාධකය විය. මේ නිසා වගා තාක්ෂණයට පදනම් වූයේ ඉඩම් විනාශය යි. එනම් සෑම ඉඩම් අක්කරයකම අස්වැන්න උපරිම කරනු වෙනුවට හිඟ

ශ්‍රමයෙන් වැඩි ඵල ගැනීමට විස්තෘත (ඉඩම් විතතිය) වගා ක්‍රමයට එනම් අයිති අක්කර සියල්ලම වගා කිරීම සඳහා වැඩි කැමැත්තක් විය. මේ නිසා අද සහ අතීතයේ යොදා ගන්නා වගා ශිල්පීය ක්‍රම අතර ප්‍රධාන වැදගත් වෙනස්කම් තුනක් විය[4].

(I) ශ්‍රමයේ හිඟතාවය නිසා අද පවතිනවාට වඩා සාපේක්ෂ වශයෙන් ජලාපවහන සහ වාරි මාර්ග ක්‍රම පවත්වා ගෙන යෑම, ඉදි කිරීම වැනි කාර්ය වල දී අඩු උත්සාහයක් ගෙන ඇත්තේ. කුඹුරේ වැඩ පටන් ගැනීමට පළමුව වාරිමාර්ග ඇලවල් හා ජලාපවහන මාර්ග සුද්ධ කිරීමට හෝ වාරිමාර්ග වැව් බැමි, සොරොව්, ප්‍රතිසංස්කරණය කිරීමට කාලය මිඩංගු කිරීමේ දී පැරණි ගොවියාට තිබුනේ අද ගොවියාට වඩා අඩු අවකාශයකි.

(II) ශ්‍රමය හිඟය නිසා කුඹුරුවලට පෝර යෙදීමේ දී පවා සාපේක්ෂ වශයෙන් මිඩංගු කොට ඇත්තේ සුළු කාලයකි.

(III) ඉඩම් බහුල නිසා ගොවීන් පුරුද්දට සීටියේ වර්ෂයකට එක් වරක් පමණක් (වගා කාලය දීර්ඝ වූ) වී වගා කිරීමට ය. බොහෝ ප්‍රදේශවල දෙවරක් වගා කිරීමට පටන් ගත්තේ මෑතක සිට ය. එක් වරක් පමණක් වගා කිරීමේ දී පසේ ස්වාභාවික සාරවත් බව ක්‍රම ක්‍රිහිපයකින් වර්ධනය වෙන්නට විය. ඉඩම මාස කිහිපයක් හිස්ව තිබෙන නිසා වල් පැල වැඩෙයි. එසේ ම ගොවියෝ පිදුරු පාවිච්චියට නොගෙන ඉඩමේ ම විසුරුවා දමයි. මේ ක්‍රම නිසා පසේ චේන්ද්‍රිය අගය වැඩෙයි.

තමා ගේ වාරයේ දී හැම වගා කරන්නෙක් ම අඩු ආයෝජනයකින් වැඩි නිෂ්පාදනයක් ලබා ගැනීමට උත්සාහ කිරීම තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමය යටතේ වගා අයිතිය මාරුවීමේ දී නොවැලැක් විය හැකි ලෙස එකට යන සිදුවීමකි. සවිස්තරව දක්වනවා නම්, ප්‍රතිඵලය එම අවුරුද්දේම නොලැබෙන නිසා වාරිමාර්ග ඇලවල් වැඩි දියුණු කිරීම, ඉඩම් මට්ටම් කිරීම, පසේ චේන්ද්‍රිය තත්වය වර්ධනය කිරීම වැනි ක්‍රම කෙරේ ආයෝජනයන් කිරීමට වගා කරන්නෝ නැඹියාවක් නොදක්වති. මෙයින් පැහැදිලි වන සුළු අදහස නම් උනන්දු වෙන් කුඹුර දියුණු කිරීමෙන් එහි ප්‍රතිලාභය යනුයේ ඊළඟ වර්ෂයේ වගා කරන්නට වීමයි. අතීතය පිළිබඳව බලන විට එකල තට්ටුමාරු කට්ටිමාරු ගොවියා දීර්ඝකාලීන ආයෝජන යන් කිරීමට සූදානම් නොවීම සම්බන්ධයෙන් ශ්‍රුතින් දක්වන ලද වගා කිරීමේ ශිල්පීය ක්‍රම අල්ලා ගෙන හැර පෑ වැදගත් අදහස් තුන බලපා ඇත්තේ ඉතා සුළු වශයෙනි. ප්‍රාථමික වාරිමාර්ග හා ජලාපවහන ව්‍යූහ රටාව සඳහා සාපේක්ෂ වශයෙන් ස්වල්ප වූ නඩත්තු කිරීම් පමණක් අවශ්‍ය වූ අතර, භූමියේ විශාල ප්‍රමාණ වශයෙන් පසේ වැඩීමේ ක්‍රියාවලිය ද, ගොවියා ගේ ක්‍රියාත්මක සහභාගිත්වයෙන් තොරව සිදු වුණි.

මෙහි දී අපට අදාළ අතීත වගා පරිසරයේ දෙවැනි ප්‍රධාන ලක්ෂණය නම් එකල ගොවි තැන් කිරීම බොහෝ ම ආපදා සහිත වීම ය. මෙයින් අප අදහස් කරන දෑ පරිස්ස මෙන් පැහැදිලි කිරීමට ඇතිවාක් මෙන්ම එයට බොහෝ විස්තරයන් ද ගෙන ආ යුතුව ඇත.

අදට වඩා එකල මුළු අස්වැන්න ඍතුවෙන් ඍතුවට වෙනස් වූවේ ද යන්න මෙහි දී අපට බල නොපායි. අප ගේ අදහස නම් අනෙක් කුඹුරකට සාපේක්ෂව කිසියම් එකම කුඹුරක බොහෝ වාර්ෂික විචල්‍යතාවයක් අදට වඩා එදා ස්ථිර ලෙසම තිබුනේ ය යන්නයි. මෙය එසේ වීමට ප්‍රධාන කරුණු දෙකකි. එකක් නම් මූලික වාරිමාර්ග හා ජලාපවහන ව්‍යුහය සමඟ අස්වැන්නට මූලික වශයෙන් ම බලපෑවේ වර්ෂාපතනය යි. මහා වර්ෂාපතනයක දී පහත මට්ටමේ කුඹුරු ජල ගැල්මට හා විනාශ වීමට ලක් වන අතර, ඉහළ මට්ටමේ කුඹුරුවලට යෝග්‍ය තත්වයක් උදා කරයි. නියඟ කාලයක දී සිදු වනුයේ මෙහි අනෙක් පැත්ත ය. දෙවැන්න, අවට විශාල කැලෑ වලින් වැසී තිබීම නිසා දිවයිනේ බොහෝ පළාත්වල අද දක්නට නැති වන සතුන් ගෙන් විශාල වශයෙන් අලාභ හානි සිදු වී ය. මේ අනුව අදට වඩා අතීතයේ දී වපුරන වී බීජ ප්‍රමාණයට ලැබෙන නිපැයුම් අනුපාතය බොහෝ අඩු විය[5]. වාර්ෂික අස්වැන්නෙන් සෑහෙන කොටසක් බීජ වී වශයෙන් අවශ්‍ය වන නිසා වපසරියේ සම්පූර්ණ පාඩුව තදබල ප්‍රශ්නයක් විය.

ඉහතින් විස්තර කරන ලද ගොවිතැන් කිරීමේ අවිනිශ්චිත පරිසරයට අනුව ඉඩම් භුක්ති ක්‍රම සැකසුව බව පෙනේ. එනම්, (අ) එක් වගා කරුවෙකුට ගමක විවිධ කොටස්වල පිහිටි විවිධ ඉඩම් කැබලි කිහිපයක් වගා කිරීමට ලැබීම, සහ (ආ) මාරු භුක්ති ක්‍රමය වගා කරුවන් කිහිප දෙනෙක් අතරේ බෙදී යන අවස්ථා අනුව, බොහෝ ආපදා සහ අවිනිශ්චිත කැබලි කෙරේ ආරක්ෂණයක් ඇති වීම, බොහෝ ආපදා කුඹුරු නොකඩවා මාරු භුක්තියට වගා කිරීමේ දී එහි භෝග ආපදාවේ හානිය පුද්ගලයන් කිහිප දෙනෙකු අතරේ බෙදා ගැනීමට හැකි වේ. කට්ටි මාරු ක්‍රමය නියත වශයෙන් ම මෙම අවශ්‍යතාවය සපුරාලයි.

අතීතයේ ගොවිතැන් කිරීමේ පරිසරය පිළිබඳ අප ගේ පැහැදිලි කිරීම්වලට අනුව ප්‍රධාන නිගමනයන් දෙකක් ඉදිරිපත් කෙරේ. එකක් නම් අතීතයේ මාරු භුක්ති වගා ක්‍රමයෙන් වී වගාවේ ඒ ඒ මට්ටම් කෙරේ අහිතකර බලපෑම් ඇති වූයේ ඉතා ස්වල්ප වශයෙනි. අනෙක් කාරණය නම් පෞද්ගලික ආර්ථික හදිසි විපත් ආපදා ආදිය අවම කිරීම පිණිස ඉඩම් භුක්තියක අවශ්‍ය අංග යන් කට්ටිමාරු ක්‍රමයෙන් ගෙන ඒම ය. මෙම නිගමනයන් ගෙන් ප්‍රශ්නය පැහැදිලි නොවේ. එනම්, මෙම රාමුවට තට්ටුමාරු නියාමය ගැලපෙන්නේ කෙසේ ද යන්නයි. තට්ටුමාරු කට්ටිමාරු නියාමයන් ගේ තාර්කික පදනම පිටුපස පිළිවෙළින් සැලකිය යුතු වෙනසක් පෙනෙන්නට තිබෙන බව බැලූ බැල්මට ම සිතේ. එයින් පළමුවැන්න නම් කැබලි බෙදියාමෙන් වැලකීමේ අදහසයි. දෙවැන්න නම් කැබලි උප බෙදීම් උරුමකරුවන් සංඛ්‍යාව අතර මාරු වීමට සැකසීම යි.

මෙම නියාමයන් දෙක එකට ක්‍රියාත්මක වන ආකාරය ගැන අප විභාග කොට බැලුව හොත් මෙම පැහැදිලි නොඑකඟතාවයේ වැදගත්කම හීන වේ. එක් එක් කැබලි මත පමණක් අවධානය යොමු වූවහොත් අමිශ්‍ර තට්ටුමාරු ක්‍රමයෙන් පැහැදිලිව අදහස් කෙරෙන්නේ අයෝග්‍ය උප කොටස් බෙදීම් වලින් ආරක්ෂාවීම බව පෙනේ. නමුත් තට්ටුමාරු භුක්ති ක්‍රමයේ අදහස් මගින් මෙම අභිප්‍රායන්ට ළඟා වීමේ දී එය අර්ථවත් වනුයේ (අ) අනෙකුත් තට්ටුමාරු ප්‍රත්‍යකයන් හා අනෙකුත් කට්ටිමාරු ප්‍රත්‍යකයන් ද සහ සම්බන්ධ තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමයන් සමාන වන, සහ (ආ) සාමාන්‍ය වශයෙන් යමෙකුට විසිරී ගිය ඉඩම් කැබලි කිහිපයක් අයිතිව තිබූ විට යන අවස්ථාගත පරිසරයක

දී පමණි. යමෙකුට 'අ' කැබැල්ල වසර කීපයකට වරක් පමණක් වගා කිරීමට හැක්කේ ඔහුට වගා කිරීමට වෙනත් ඉඩමක් වෙන තැනක තිබෙන නිසා ය. තට්ටුමාරු සහ කට්ටිමාරු නියායන් ඒවා එකිනෙකට විශේෂිත වූ විවිධ අභිප්‍රායයන් ගෙන් යුක්ත බව පෙනෙන්නට තිබුණත් අව්‍යාජ පැවැත්මෙහි දී ඒවා එකිනෙකට උණ පූරකයක් වේ.

වගා ශිල්ප ක්‍රම මත කළ බලපෑමට හැර ගැමියන් ගේ ඉඩම් පිළිබඳව තිබූ ආකල්පයට භූමිය මත ජනගහණය පීඩනය වැඩිවීම, ප්‍රබල බලපෑමක් විය. අදට වඩා කුඹුරු බහුලව තිබූ සහ ශ්‍රමයට සහ වපසරියට ලැබූ නිපැයුම අඩුව තිබූ කාලයේ ගැමියන් බොහෝ දුරට සැලකිල්ලට ගත්තේ ඉඩම් කොටස සෑම වර්ෂයකම වගා කිරීමේ අයිතියට වඩා තමාට අවශ්‍ය විටෙක ප්‍රයෝජනයට ගැනීමට හැකි සේ ඉඩමේ අයිතිය තබා ගැනීම යි. පසුගිය අවුරුද්දේ අස්වැන්න ප්‍රමාණය වී ගබඩා කර ගෙන ඇති ප්‍රමාණය, නීතිමය ගාවන බදු බරෙන් නිදහස් වීමට ඇති හැකියාව, සහ උදව්වට ලබා ගත හැකි කම්කරුවන්, වයසට යෑමෙන් වන බලපෑම්, ලෙඩ රෝග හා මරණ ආදී සාධක අනුව වර්ෂයෙන් වර්ෂයට ගෘහයන් විසින් වගා කළයුත්තේ කුමන ඉඩම් ප්‍රමාණයක් ද යන්න වෙනස් වේ. 1980 වන තුරු වී වගා කරන ගොවියාට ධාන්‍ය බද්ද ගෙවීමට බල කරන ලදී. ගැමියන් ගේ කල්පනාවට අනුව බදු ප්‍රමාණයේ කාලයට හා ප්‍රදේශයට අනුව ඇති විවිධතාවය පදනම් රහිත පැනවීමකට වඩා වෙනත් යම් පදනමක් තිබෙන බව පෙන්වයි. බදු එකතු කිරීමේ දී බොහෝ තැඹුරු ලෙස දෙපක්ෂය අතර ජයග්‍රහණය සඳහා තරඟයක් පැවතිනි. නිතරම වාගේ බල කිරීම් කෙරිණි. (ඔබේසේකර පිටු 108-114) වී අස්වැන්න මත වූ මෙම පදනම් රහිත බදු බර නිසා වී ගොවිතැන අධෛර්යමත් වූ බවට සැක නැත. ඔබේසේකර ගේ විස්තරයට අනුව එකල ධාන්‍ය බද්ද එක් කිරීමේ බලධාරීන් ඉඩම් වගා නොකර අත හරින ලද අයුරු නිතරම පාහේ සොයා ගත් බව අපි දනිමු.

ලේල්වල ගැමියන් (8 වැනි කොටස බලන්න) කියන්නේ ඉඩමක නාමික අයිති ඇති විට එය නියම වශයෙන් ම ප්‍රමාණ කර ගැනීමට සහ නොකඩවා ගොවිතැන් කිරීමට පැරණියන් උනන්දු වූයේ මඳ වශයෙන් බව ය. ක්‍රියා කිරීම පිණිස සියළු ම නාමික අයිතිවාසිකම් දැන ගැනීමට සැලසීම, නොකඩවා කර ගෙන යා යුතු වූ හෙයිනි. මෙවැනි ඉඩමක් තිබෙන කල්හි නාමික අයිතින් ගෙන් වගා වාරය පිළියෙළ වන්නේ කෙසේ ද යන්න ගැන විසඳා ගැනීමේ දී එයටම ආවේණික වූ පිළිවෙළක් වූ අතර, වගා සැකැස්ම උපකාරී වන ඉඩම් භුක්ති ක්‍රම ද විය. මෙහි දී අදහසේ අනුමානතාවය වැනි යමක් නිතරම භුක්ති ක්‍රමයේ ලක්ෂණයක් වශයෙන් පෙනෙන්නට තිබුණි. මෙම නොපැහිදිලිතාවය අඩම්මා කර ගෙන ඉඩම මත නීතිමය පාලනයක් ඇති කිරීමට එහි වටිනාකම කෙරේ උනන්දු වන්නන් කෙරෙහි තිබූ බලය ඔබේසේකර පහදා දී ඇත. (11 වැනි කොටස) ඉඩම් බොහෝ හිඟ වන විට ගැමියන් සාමාන්‍ය වශයෙන් තම අයිති ඉල්ලීම් පිළිබඳව උපරිම ලෙස නියම පදනමක් මත කටයුතු කිරීමට පත් වී ඇති බව ලේල්වල අධ්‍යයනයෙන් ඉදිරිපත් වේ. මෙම ආකල්පිය වෙනස්කම් නිසා ඇති වන ගැටුම්වල ආරම්භය ඇති වූයේ ඉහත නියමාකාරයට ම බෙදා ගැනීම් නොකළ කාලයක ය. මෙම ආරවුල් සහිත හිමිකම් වලට නැවත විසඳීම් සොයනු වෙනුවට තිබෙන පරිදි කර ගෙන යෑම බොහෝ පොදු උපාය මාර්ගයක්ව පවතී.

මුළු රටටම එකසේ බලපවත්වන එකම සංසිද්ධියකින්, එනම් මිනිසා–ඉඩම් අතර අනුපාතයෙන් බිඳී එන භෞතික හා ආර්ථික පරිසරයක් මත තට්ටුමාරු කට්ටිමාරු සම්බන්ධයෙන් අප ගේ තර්ක පදනම් වී තිබේ. නිත්‍ය විශේෂ පරිසරයන්ට අදාළව භුක්තිය හා ගොවිතැන් කිරීමේ පරිසර පද්ධතිය ගැළපීමේ දී තවත් අදහස් දෙකක් සෙවිය යුතුව ඇත. පළමුවැන්න අවධානය වූයේ තට්ටු මාරු කට්ටිමාරු පිළිබඳ ඉහළ ලේල්වල විෂය අධ්‍යයනයෙනි (8 වැනි කොටස). එහි දී තට්ටු මාරු කට්ටිමාරු ක්‍රමය හා ජලය බෙ[illegible] භෞතික සැකැස්ම අතර ඒකාබද්ධතාවයක් ඇති බව පර්යේෂකයින්ට පෙනී ගියේ ය. සොරොව් වලින් ජලය බෙදී ගියේ ප්‍රධාන කුඹුරු යාය මැදින් දිවෙන ඇල මාර්ගයකිනි. වගා කරුවාට ජල මට්ටම පාලනය කර ගත හැකි පරිදි හැම ලියැද්දකටම ජලය බෙදී යාමේ සැකැස්මක් ඇත. ලියැද්ද අතුරු කොටස්වලට බෙදී යන විට මෙම ජල සම්පාදනය සැකැස්ම වෙනස් වී වැඩි වන ප්‍රමාණය ගොවියන් අතර ජලය බෙදීම හා ඉවත් කිරීම පිළිබඳ සම්බන්ධීකරණ වැඩ පිළිවෙළක් අවශ්‍ය වේ. මෙය බොහෝ විට අවුල් සහගත තත්වයන්ට හේතු වේ. මෙම තත්වයන් ගෙන් මිදීමට වගාකරුවන් තට්ටුමාරු භුක්ති ක්‍රම දෙස නැඹුරු වූ බව එක් කාරණයකි. එම විශේෂ විෂය අධ්‍යයනය හැරුණු විට සමාජ විද්‍යාත්මක ප්‍රවේශයෙන් පිට පරිසර විද්‍යාත්මක ප්‍රවේශයකින් භුක්ති ක්‍රම ගැන පර්යේෂණ කෘති කෙරී නැත.

ප්‍රාදේශීය වැදගත්කමකින් යුත් දෙවෙනි පරිසර විද්‍යාත්මක සාධකය නම් දිවයිනේ මාරු භුක්තිය බොහෝ විට පොදු වූ කොටසෙහි එනම් තෙත් කලාපයේ පහත රටෙහි දක්නට ඇති අඩි ගණනක් සිනිඳු මඩ සහිත නිසා ජලාපවහනය දුර්වල පහත් කුඹුරු ය. (හැල් කුඹුරු වශයෙන් හඳුන්වන කුඹුරු ඉඩම්) මේවායෙහි සී සෑම හා අස්වනු නෙළීම වැනි කාර්ය සඳහා අධික මහන්සියක් දැරිය යුතු ශ්‍රම ප්‍රසාද රහිත ය. මෙම පසෙහි ඓන්ද්‍රිය ගුණය අධික නිසා ඓන්ද්‍රිය ද්‍රව්‍ය එක් කිරීම හානිකර ය. එබැවින් අවුරුද්දක යෙදෙන වගා ප්‍රයත්නයක ප්‍රතිඵල ඊළඟ අවුරුදුවලට බල නොපාන නිසා මේ කුඹුරු තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රමයට යෝග්‍යය.

ඉහත ඡේදවල දී අප තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රමයේ මූලෝත්පත්තිය ගැන පැහැදිලි කළෙමු. අප කර ඇත්තේ අදට වඩා ඉඩම් මත අඩු ජනගහනයක් සිටි කාලයක ආර්ථික හා පාරිසරික තත්වයන්ට භුක්ති ක්‍රමය ගැළපීමේ දී සාධාරණ නියායන් මත පිළිවෙළක් සැපයීම පමණකි. මෙයින් භුක්ති ක්‍රමයේ වර්ධනය වැළැක් විය නොහැකි එකක් බව නොකියයි. වෙනත් රටවල වෙනත් වී වගා කරන්නන් විවිධ අංශයෙන් සමාන තත්වයන් කෙරේ අවස්ථාවෝචිත සේ කටයුතු කර ඇති බැවින් ලාංකිකයන් පමණක් එසේ නොකළේ යයි සිතීමට හේතු නැත. අතීතයේ පැවති සමහර තත්ව පද්ධතීන්ට භුක්ති ක්‍රමය ගැළපුනේ කෙසේ ද යන්න නිදර්ශනාත්මක ලෙස දැක්වීම තුළින් භුක්ති ක්‍රමයේ උත්පත්තිය පිළිබඳ අප ගේ විග්‍රහයට සවිස්තර වචනයක් දීම අප ගේ ප්‍රධාන අරමුණයි. වැදගත් ම අංග මාත්‍රය නම් එකී ආර්ථික හා පාරිසරික තත්ව දිගු කල් නොපැවතී බව ය. අද කුඹුරු බොහෝ හිඟ ය. මේ නිසා පරිස්සම් සහගත අස්වැන්න උපරිමකරණ කෘෂිකාර්මික ක්‍රම අවශ්‍ය ය. වාර්ෂිකව දෙවරක් වී වගා කිරීම නිසා රසායනික හා රෙන්ද්‍රිය පෝර එක් නො කරන්නේ නම් පසේ සාරවත්කම හීන වී යයි. වාරිමාර්ග හා ජලාපවහන යටිතල ව්‍යුහය පරිස්සම් සහගත ලෙස නඩත්තු කිරීමට හා පුළුල් කිරීමට ලක් කළ යුතු ය. ඒ ඒ

පුස්තකාලය
LI...



22890

විශේෂිත කුඹුරුවලට අළුත් වී වර්ග අතුරෙන් ගැලපෙන්නේ කුමන වී වර්ගය ද යන්න කෙරේ අත්හදා බැලීම් කිරීමට ගොවියන් උනන්දු කළයුතු ය. මේ ආකාරයේ ආයෝජනයන්ට වගා අයිතියේ මාරුවීම හේතුවෙන් උනන්දුවක් ඇති නොවේ. අනෙක් අතට වාරිමාර්ග හා ජලාපවහන යටිතල ව්‍යුහය දියුණුවී කුඹුරු මට්ටම් ශකරී, වල් සතුන් ගේ උවදුර දුරු වී ඇති නිසා තත්වය වෙනස් ය. වෙනස් කුඹුරු කිහිපයක සාපේක්ෂ අස්වැන්නේ අවුරුද්දෙන් අවුරුද්දට වන වෙනස් කම් එදාට වඩා අද අඩු ය. ඒ නිසා කුඹුරු මාරු කිරීම අදට එතරම් ම අනවශ්‍ය ය. පහතින් සවිස්තරව තාර්කිකරණය කොට ඇති ලෙස අප ගේ මතය නම් ආර්ථික තත්වයන් ගේ වෙනස්වීම් තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රම කෙරේ ප්‍රතිබලපෑම් කර ඇත්තේ ආර්ථික ලෙස වැඩි පුර ඇති යමක් වශයෙන් ම පමණක් නොව, කෘෂිකාර්මික සංවර්ධනයට හානි කර වූවක් වශයෙනි.

6. ප්‍රාදේශීය ව්‍යාප්තිය.

වගුව 1 1975 මාරු භුක්තිය යටතේ ඇති කුඹුරු ප්‍රමාණයේ දිස්ත්‍රික් මට්ටමේ ප්‍රතිශතය.

| දිස්ත්‍රික්කය | ප්‍රදේශය | තට්ටුමාරු කට්ටිමාරු යටතේ ඇති කුඹුරු ප්‍රමාණයේ ප්‍රතිශතය |
|---|---|---|
| කෑගල්ල | තෙත් කලාපයේ පහත රට සහ පහත මධ්‍ය රට | 36.3 |
| කළුතර | | 36.1 |
| රත්නපුර | | 33.9 |
| ගාල්ල | | 18.2 |
| මාතර | | 13.6 |
| කොළඹ | | 5.9 |
| කුරුණෑගල | අන්තර් කලාපයේ පහත රට ප්‍රදේශය | 3.3 |
| හම්බන්තොට | | 3.0 |
| මහනුවර | තෙත් කලාපයේ ඉහළ මධ්‍ය රට | 1.6 |
| මාතලේ | මධ්‍ය හා ඉහළ රට වියළි කලාපය | 0.9 |
| බදුල්ල | | 0.6 |
| නුවරඑළිය | | 0.6 |
| අනුරාධපුරය | වියළි කලාපය | 0.6 |
| අම්පාර | | 0.6 |
| පුත්තලම | | 0.3 |
| මඩකලපුව | | 0.1 |
| මොණරාගල | | 0.1 |
| ත්‍රිකුණාමලය | | 0.1 |
| පොළොන්නරුව | | 0.1 |

| | | |
|---|---|---|
| වව්නියාව | දෙමළ ප්‍රදේශ | 0.0 |
| මන්නාරම | | 0.0 |
| යාපනය | | 0.0 |
| සම්පූර්ණ දිවයිනේ ම | | 5.5 |

* මූලාශ්‍රය : ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

මාරු භුක්ති ක්‍රමයේ කාර්ය සිද්ධිය ශ්‍රී ලංකාව පුරාම ඒක හා සමාන නොවේ. එය ද්වීපව්‍යාප්ත සංසිද්ධියකට වඩා ප්‍රාදේශිකත්වයක් ගනී. අංක 1 වගුව සංඛ්‍යා ලේඛන විග්‍රහය කෘෂිකාර්මික පලදාව වර්ධන කමිටු වාර්තාවලින් සැකසුන ඒවා ය. ඒවා සමහර වාර්තා සැපයීමේ ආයතනයන් ගේ ක්‍රියාත්මක දුර්වලතාවයන් හා පාරිභාෂික ශබ්ද පිළිබඳ ප්‍රාදේශීය විවිධතාවයන් නිසා ඇති වන වැරදි වලින් යුක්ත ය. මෙම මූලාශ්‍රයෙන් ම මීට පෙර සැපයුන සමහර සංඛ්‍යා ලේඛන අසාමාන ය. කෙසේ හෝ අප අරමුණ සඳහා මේ සංඛ්‍යා ලේඛන සෑහේ.

අංක 1 හා පසුපිටේ ආදර්ශ සිතියම මෙම භුක්ති ක්‍රම තෙත් කලාපීය මධ්‍ය හා පහත රට ප්‍රදේශයෙහි ඒකරාශී වී ඇති සැටි පෙන්වයි. මධ්‍ය ප්‍රදේශයේ කෑගල්ල හා රත්නපුරත්, පහතරට ප්‍රදේශයේ කළුතරත් යන දිස්ත්‍රික්කවල වැඩිපුර ඒකරාශී වී ඇති බව පෙනේ. මේ ප්‍රදේශවලින් ක්‍රමයෙන් ඈත් වන විට භුක්ති ක්‍රම කාර්ය සිද්ධිය ක්‍රමයෙන් අඩුවෙමින් යනු පෙනේ. සවිස්තර සිතියමකින් මෙම රටාව මනාව පැහැදිලි කරනු ඇත. වියළි කලාපයේ මාරු භුක්ති ක්‍රමය ඇත්ත වශයෙන් ම දැන ගන්නට නැත. මුළු රට පුරාම මාරු භුක්ති ක්‍රමයේ භූගෝලීය ව්‍යාප්තිය විසින් හේතු සාධක පැහැදිලි කරයි. එය වෙන කිසියම් සංස්කෘතික, ඓතිහාසික, ස්වාභාවික පරිසරාත්මක හෝ වගා ක්‍රමවලට නිතරම පැහැදිලි ලෙස සම්බන්ධතාවයක් නොදැක්වීය. තට්ටුමාරු කට්ටි මාරු ක්‍රම සිංහල සම්ප්‍රදායික සංස්කෘතියේ කොටසක් ලෙස සමහර විටෙක හඳුනා ගෙන ඇතත්, මතක තබා ගත යුතු කරුණක් නම් සිංහල සංස්කෘතියේ හද බිම වැනි මහනුවර හා කන්ද උඩරට ප්‍රදේශයෙහි විශේෂයෙන් ම කඳුකර දිස්ත්‍රික්ක කිහිපයකම මෙම ලක්ෂණය දුර්ලභව පැවතීම යි.

මාරු භුක්තියේ සහසම්බන්ධතාවය පිළිබඳ සංඛ්‍යා විද්‍යාත්මක විග්‍රහය අනුව එය පොදු වී ඇත්තේ තෙත් කලාපයේ පහත සහ මධ්‍ය රටෙහි දිස්ත්‍රික්ක හයක පමණි. මෙම ප්‍රදේශ සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමේ අධ්‍යාපන තත්වය, නාගරික සම්බන්ධතාවය කෘෂි නොවන රැකියා නියුක්තිය සහ අර් අර්ධ කාලීන ගොවිතැන් කිරීම ආදී ගුණාංගයන් ගෙන් යුක්තය. පූර්ණ කාලීන වගා කරුවන් වන සුළු ඉඩම් හිමියන් කොටසකත්, මාරු භුක්තියෙහි කුඹුරු ඉඩම් කොටසකත් අතර තිබූ සම්බන්ධතාවයක් ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශ මට්ටමේ සිට පවා ඇති බව උප ග්‍රන්ථය 1 හි දී අප ගේ සංඛ්‍යා විද්‍යාත්මක විග්‍රහයෙන් පැහැදිලි වෙයි. අප මෙය පැහැදිලි කරන්නේ කෙසේ ද? පළමු කොටම සංඛ්‍යා විද්‍යාත්මක සම්බන්ධතාවයක් ඇති සාධක කෙලින් ම හෝ වක්‍රව හේතු ඵල සම්බන්ධතාවයක් ඇති බව ඔප්පු නොකරයි. අදාළ ප්‍රදේශ පිළිබඳ අප ගේ පසුබිම් දැනීම තුළින් ලැබෙන පැහැදිලි තත්වය මත සංඛ්‍යා විග්‍රහ කර ගත යුතුව ඇත. තට්ටුමාරු කට්ටිමාරු සුළු අයිතිකරුවන් ඔවුන් වෙනත් රැකියාවක නැයැලීමෙන් හෝ ගම් හැර ඈත පලාත්වලට යෑමෙන්

තම පංගු අයිතිය අහෝසි වීමේ නැඹුරුතාවයකට පත්ව ඇති බව විෂය අධ්‍යයන කිහිපයකට අනුව අපි දනිමු. අර්ධකාලීන ගොවිතැන් කිරීම, තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමයට දෙ ආකාරයකින් සතුරු වන බව පෙන්වීමට සාධක හොඳ හැටි තිබේ. පළමුකොටම අර්ධකාලීන ගොවිතැන් කිරීම එහි කෘෂිකාර්මික නොවන රැකියා අවස්ථා බොහෝ ඇති බව පැහැදිලි කරයි. සමහරු කෘෂි අංශයේ ද කෘෂි නොවන අංශවල ද පසුපෙළේ ම නියැලෙන අතර, වඩා ලාභ දායක තත්වයක් යටතේ කෘෂි නොවන රැකියා කටයුතු සඳහා කෘෂි අංශය සම්පූර්ණයෙන් අත්හැර දමති. මෙසේ තම ආර්ථික අවධානය කෘෂි නොවන අංශ කෙරේ යොමු කළ අය තම කට්ටිමාරු තට්ටුමාරු අයිතින් රැක ගැනීම සඳහා වෙහෙස නොවේ. අවුරුදු කිහිපයක් මෙසේ සිටීමෙන් හෝ විකුණා දැමීමෙන් අයිතිය අහෝසි වේ. මෙවැනි පරිසරයක දී වැඩි අවධානයක් ඇති අයට මිල දී ගැනීමෙන් හෝ ඒකාබද්ධ කිරීමෙන් අවසාන වශයෙන් නීතිමය හෝ සත්‍ය වශයෙන් ම තට්ටුමාරු කට්ටිමාරු ප්‍රභේදකයන් බෙදුම් ක්‍රමයට ලක් කිරීමෙන් සරල නිදහස් හිමිකාවයක් ඇති කිරීම පහසු ය. අර්ධ කාලීන වගා පරිසරයකට මෙවැනි වැඩ පිළිවෙළක් අවශ්‍ය නොවේ. කෘෂි නොවන රැකියා අවස් අවස්ථා ඇති විට පියවරුන් කෘෂි නොවන කාර්ය අංශවල පිවිස් වීමට වැඩි කැමැත්තක් නොදක්වා දක්වන තම දරුවන් ඔනුවෙන් තම කුඹුරු ඉතිරි කොට වෙනත් රැකියාවලට යති. මේ තත්වය යටතේ පූර්ණ කාලීන ගොවිතැන් කිරීම ඇති ප්‍රදේශවලට වඩා තට්ටුමාරු කට්ටිමාරු ප්‍රභේදකයන් නිතර නිතර පැන නැඟීමේ තත්වය හීන වෙන අතර, අඩු සංකීර්ණතාවයක් ද පෙන්වයි.

තට්ටුමාරු කට්ටිමාරු හා කෘෂි නොවන රැකියාවල නියුතු උරුමකරුවන් අතරේ අයිතිවාසිකම් පිළිබඳ අසංසන්දනාත්මකත්වයක් ඇත. බොහෝ සේ නාගරිකරණයට ලක් වූ සහ කෘෂි අංශයේ නොවන රැකියාවල නියුතු වූවන් වූවත් වැඩි ලෙස ඒකරාශී වූයේ නිරිත දිග වෙරළබඩ ප්‍රදේශයේ ය. එසේම අධ්‍යාපනික අංශයෙන් ඉහළ මට්ටමක ද, වඩා හොඳ සංනිවේදන හා නවීන අදහස් උදහස් වලට මනා සේ විවෘත වීමේ ඉහළ තත්වයක ද වේ. මෙම නාගරික බලපෑම හේතු කොට තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමය පිළිබඳ පැරණි උසස් අගැයුම් සහ පංගු උරුමය දිගටම පැවතීම ගම්වැසියාට ඇති වටිනාකමක් ය යන අදහස් උදහස් යටපත් වී යෑමට නැඹුරු තාවයක් පෙන්වයි.

පූර්ණකාලීන ගොවිතැන් කිරීම හා තට්ටුමාරු කාර්ය සංසිද්ධිය අතර සංඛ්‍යාත්මක සම්බන්ධතාවයන්ට නිත්‍ය හේතු කුමක් වූවත්, මෙත් කලාපයේ පහත රට තවරදාක හෝ නොවූ ලෙස ග්‍රාමීය ප්‍රදේශ කරා කාවැදී ගෙන යමින් පවතින පෘථුල ලෙස ව්‍යාප්තව ඇති නාගරික බලපෑම් නිසා භුක්ති ක්‍රමය යටපත් වී යෑමකට නැඹුරුතාවයක් දක්වන බව පෙන්වීමට සෑහෙන පදනමක් ඇත. භුක්ති ක්‍රමයේ කාර්ය සංසිද්ධිය පෙරට වඩා අද අඩු ය. 1951 බෙදුම් පනත මගින් බෙදුම් නීතිය ප්‍රතිසංස් කරණය කිරීමට පෙරාතුව පැවති නීතිය යටතේ බොහෝ ඉඩම් බෙදීමට ලක් විය. මෙහි දී එකී නීතිය අනාගත අගය ගැන අනුමාන කළ ධනවත් සමහරුන්ට සුළු ඉඩම් හිමියන් ඉවත් කොට ඉඩමේ විශාල පංගු ප්‍රමාණයක් තමා ගේ අයිතියට ගැනීමට මහෝපකාරී විය[9]. නීතිමය ක්‍රියාවලියක් නිතරම අවශ්‍ය නොවේ. බොහෝ තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ප්‍රභේදකයන් උරුමකරුවන් අතර සහයෝගයෙන් කැබලි වලට බෙදා ගත් බව සාක්ෂි වලින් පෙනේ[10]. පහතින් ඔබ දකින පරිදි බොහෝ තට්ටුමාරු කට්ටිමාරු ප්‍රභේදකයන් කොල්ලකාරී ස්වභාවයන් පිටු දකින, පිළිගත

හැකි නියාමාකාර ආයතනික රාමුවක් හිඟ නිසා උරුමකරුවන් ගේ කැමැත්තක් නැතිව වුව ද, කෙරී ගෙන යමින් පවතින බව පැහැදිලි ය.

## 7. මාරු භුක්තිය පිළිබඳ ප්‍රකාශිත අධ්‍යයනයන්.

මාරු භුක්තිය පිළිබඳ බොහෝ ප්‍රකාශනයන් ඇතත්, විස්තරාත්මක ලෙස සාකච්ඡා වී ඇත්තේ විෂය අධ්‍යයන තුනක දී පමණි. මෙම විෂය අධ්‍යයන තුන පිළිබඳව වෙන වෙනම සැපයෙන කෙටි සාරාංශයන්, තවදුරටත් සාකච්ඡා කිරීමට මඟ පෙන්වනු ඇත.

### (1) පී. ඔබේසේකර ගේ 'ලංකාවේ ග්‍රාමීය ඉඩම් භුක්තිය'.

මෙය දැනට ප්‍රකාශිත භුක්ති ක්‍රම විෂය අධ්‍යයනයන් ගෙන් දීර්ඝතම කෘතිය වන අතර, ශාස්ත්‍රීය චරිතාකමකින් ගැබ් වී සහ ලියවී ඇත්තේ ය. ශාස්ත්‍රීය කවයන්ට නිසැකවම බොහෝ සේ විෂය වී ඇතිවාක් මෙන් ම ඇත්තවශයෙන් ම පහසුවෙන් ලබා ගත හැකි ප්‍රකාශිත කෘතියකි.

මෙම කෘතිය කියවීමට පහසු නොවේ. ප්‍රධාන සංදර්භයේ දී කතුවරයා විසින් ඇතුලත් කරන ලද ප්‍රත්‍යක්ෂ මූලික සාක්ෂි බොහෝ වන අතර, ශ්‍රී ලංකාවේ කුඩා ග්‍රාමීය ප්‍රජාවක් සම්බන්ධ බොහෝ නියායාත්මක සමාජ විද්‍යාත්මක අධ්‍යයන ඇතුළත් ප්‍රත්‍යෙකයකි. ග්‍රන්ථය අවබෝධ කර ගැනීමේ දී පාඨකයාට බොහෝ වගු හා සටහන් අනුගමනය කිරීමට සිදු වේ. එසේ ම වෙන් වෙන් වශයෙන් වූ විෂය අධ්‍යයනයන් බොහෝ ප්‍රමාණයක් ද අනුගමනය කිරීමට සිදු වේ. මෙහි දී ඔබේසේකර ගන්නේ ඓතිහාසික ප්‍රවේශය යි. ඔහු 1961 දී ග්‍රාමයේ ජනගහණයේ සමහර සාමාජිකයන් ගැඹුරින් සාකච්ඡාවට ලක් කිරීමෙන් 1790 හෝ ඊටත් පෙර කාලයකට ආපසු දිවෙන ඉඩම් අයිතිය පිළිබඳ පැවති රටාවන් ප්‍රති නිර්මාණය කරයි. නියායාත්මක හා ප්‍රත්‍යක්ෂ මූලික නියුක්ති වලින් ඝාහොසත් නිසා මෙම කෘතිය සාරාංශ කිරීම දුෂ්කර වී ඇත. අප ගේ සාරාංශය වඩා දීර්ඝ වනු වැළැක්වීම පිණිස මාරු භුක්තිය පිළිබඳ සාමාන්‍ය අගැයීමක් කිරීමේ දී අප ගේ උත්සාහයට වඩාත්ම ගැලපෙන අංශයන්ට අවධානය යොදවමින්, මෙම විග්‍රහය අදහස් කිහිපයකට පමණක් සීමා කරමු.

(අ) මෙම අධ්‍යයනයට ලක් වූ මැදගම ගම ගාල්ල දිස්ත්‍රික්කයේ හිනිදුම ප්‍රදේශයේ පිහිටියේය. දිස්ත්‍රික්කයේ අනෙක් ප්‍රදේශවලට සාපේක්ෂව හිනිදුම ප්‍රදේශය කඳු සහිත පිවිසීමේ සුගමතාවය හීන සංනිවේදන තත්වය දිළිඳු සහ සමාජයීය හා සංස්කෘතික වශයෙන් ගතානුගතික[11] ය. ඔබේසේකර මේ තත්වය පැහැදිලි ලෙස හඳුනා ගෙන ඔහු ගේ තේමාවට මාධ්‍ය කොට ගත්තේ ය. පැරණි යන් ගේ චර්යා සහ සංස්කෘතික ගතානුගතික පිළිවෙත් වෙන් කොට පෙන්වන මායිමක් ලෙස මැදගම යොදා ගැනීම ඔහු ගේ ක්‍රමය විය (පිට 6). එසේ ම නවීන බලපෑම් වලින් ජය ගැනීමට පෙර පහත රට ප්‍රදේශයේ විශේෂ ලක්ෂණයක්ව පැවැති සමාජ හා භුක්ති ක්‍රමය පිළිවෙළ සැකැස්ම පෙන් වන ආදර්ශකයක් ලෙස මෙම ගම අදාළ කර ගත් බව එයින් පැහැදිලි ය.

(ආ) මැදගම සම්බන්ධයෙන් ඇත්තේ (සමාජ විද්‍යාත්මක දෘෂ්ටියෙන්) ගමේ සියළු ම කුඹුරු ඉඩම් වැසී යන පරිදි වූ එකම තට්ටුමාරු කට්ටිමාරු ප්‍රභේදයකි. ගමේ නිර්මාතෘවරු විසින් කුඹුර පළමුව සකස් කර ගත් අතර පසුව එය උරුමකරුවන් අතර තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රමයට පත් වූ අයුරු ඔබේසේකර පැහැදිලි කර පෙන්වයි. ඔබේසේකර ගේ මෙම එකම ගමේ පුළුල් තට්ටුමාරු කට්ටිමාරු ප්‍රභේදක සාධකය ඔහු ගේ අධ්‍යයනයෙන් පැහැදිලි කරන්නේ කුමක් ද යන්න සඳහා තීරණාත්මක වේ. ඔහු ගේ විෂය මාරු භුක්තිය පිළිබඳව නොව, ඉඩම් භුක්තිය සම්බන්ධ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයකි (පිටු 8). ඔහු ගේ මධ්‍යය තේමාව ඉදිරිපත් වන්නේ අත්පත් වූයේ කොයි ලෙසකින් වුවත් ගමේ ඉඩම් පංගු යිහිව ඇත්නම් එය ගම්වැසි භාවයේ ප්‍රධාන නිර්ණායකයක් ලෙස ගැමියන් විසින් පිළිගනු ලැබීම යි. ඔවුන් ගේ සියළු ම අයිතිවාසිකම් බැඳීම් හා සබඳතා ඇතුළත්ව සම්පූර්ණ ග්‍රාමීය සමාජිකත්වය රඳා පවත්නේ ග්‍රාමීය කුඹුරු හා ගොඩ ඉඩම් පංගු උරුමය මතය යන ඔහු විශ්වාස කරන ග්‍රාමීය සම්ප්‍රදායක පිළිවෙළ සැකැස්ම යටතේ මැදගම කෙරෙන් නැති වී ඝන අවශේෂයක් පිළිඹිබු කෙරෙයි. පහත රට පිවිසීමේ සුගමතාවය හීන ප්‍රදේශ වල තට්ටුමාරු කට්ටිමාරු නීතිමය ලෙස අතුරු කොටස් වලට බෙදීමේ දී ග්‍රාමීය ප්‍රජාවගේ සමාජ විද්‍යාත්මක හා උසස් මූලිකාර්ථයන් විනාශයට ලක් කිරීමේ දර්ශකයක්ව පැවති බව එයින් තර්කනය වී ඇත.

ඉතාම පැහැදිලිව ඔප්පු කිරීමට හැකියාවක් නැති බව ඔහු පෙන්වා දී ඇතත් ඔබේසේකර ගේ මෙම තර්කයෙන් සම්පූර්ණයෙන් ම පැහැදිලි වන්නේ ඔහු විශ්වාස කරන ලෙස ඒකීය ග්‍රාමීය තට්ටු මාරු කට්ටිමාරු ප්‍රභේදයන් පහත රට පුරා රීතියක් වශයෙන් පැවති බවය මෙම අභ්‍යුපගමය ඔහු ගේ තර්කයට තීරණාත්මක වන්නේ ඒකීය ග්‍රාමීය ව්‍යාජ ප්‍රභේදයකින් තොර වූ විට ඔහු අදහස් කරන ග්‍රාමීය සාමාජිකත්වයේ හැඟීම එක් [illegible] පමණක් යොමු වීමට හැකි හෙයිනි. භුක්ති ප්‍රභේදයන් කිහිපයක් විද්‍යාමාන වන විට එක් එක් තට්ටුමාරු කට්ටිමාරු ප්‍රභේදය වෙනුවෙන් ඔහු ගේ අදහස සපුරා ගැනීම පිණිස ගන්නා උත්සාහය තේරුම් රහිත පුනරුක්ති දෝෂයන් ගෙන් යුක්ත වීමට ඉඩ තිබුණි. මෙම ඒකීය ග්‍රාමීය ප්‍රභේදයන් පිළිබඳ අභ්‍යුපගමය සම්බන්ධයෙන් ගැඹුරෙන් ස්ථිරවම අපට කිවහැක්කේ එය ඔබේසේකර ගේ සමහර තර්කයන්ට කිහිපාකාරයකින් තීරණාත්මක වූවත් පැහැදිලිවට මිත්‍යාවක් වන බව යි.

පෙනෙන විදියට නම් ගම පුරා පැතිර පවත්නා තට්ටුමාරු කට්ටිමාරු චාරිත්‍රාගත ප්‍රභේදයකට ඇත්තේ මැදගම ගම පමණි. මෙම වාර්තාවේ දී විග්‍රහ වී ඇති අනෙක් විෂය අධ්‍යයන හතර අතුරෙන් කිසිවක දැනට ක්‍රියාත්මක තට්ටුමාරු කට්ටිමාරු භුක්තියක ගම පුරා පැතිර පැවති ආකාරයේ ප්‍රලේඛ්‍යපත්තියක් නොපෙන්වයි. ඉහළ ලේලිවල සම්බන්ධයෙන් බලන විට දැනට පවතින තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රම පැන නැඟුනේ ගමේ ආරම්භයත් සමඟ ය. කඳු සහිත, ජනාවාස ඉතාම කුඩා, හිනිදුම වැනි ප්‍රදේශයක එකම ගමක ගම් පුරා පැතිරි ඒකීය තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමයක් පැවතීම පොදු විය හැකි ය. ගැමියන් ගේ ඇඩි සම්බන්ධයක් ඇති කඳුකර භාවය අඩු ප්‍රදේශවල ප්‍රාථමික සමාජය (හෝ ස්වාභාවික ගම්මානය) සාමාන්‍යයෙන් විශාල ය[13]. පරිපාලන කොට්ඨාශ නැතනම් ප්‍රදේශයේ වෙනස් වීම් සමඟ කිසිදු සම්බන්ධතාවයක් නැති බව උප ග්‍රන්ථය 1 හි ප්‍රයෝජනයට ගෙන ඇති සංඛ්‍යා වලින් පැහැදිලි වන අතර, හිනිදුම වැනි කඳු සහිත පිවිසීමේ සුගමතා වය

හීන ප්‍රදේශවල මාරු භුක්තිය බොහෝ කාලයක් පැවැත්මට නැඹුරුතාවයක් දක්වයි. එවැනි ප්‍රදේශ වලට පවා අද තට්ටුමාරු කට්ටිමාරු ඉඩම් භුක්තියට අදාළ ඉඩම් මුළු කුඹුරු ප්‍රමාණයෙන් කිසියම් ප්‍රමාණයක කොටසක් පමණි. සියලු ම සාක්ෂි වලින් ඉදිරිපත් වනුයේ මැදගම ගම පුරා පැතිරි තට්ටුමාරු කට්ටිමාරු ප්‍රත්‍යයන් මෙන් ම අතීතයේත් අසාමාන්‍ය සිද්ධියක් බව ය.

(ඇ) මැදගම හුදකලා භාවය හා ගතානුගතිකත්වය හැර වර්තමාන තට්ටුමාරු කට්ටිමාරු පංගු ව්‍යාප්තිය, පංගු මිළ දී ගැනීමට උත්සාහ කරන්නන් ගේ ක්‍රියා කලා පයට බොහෝ දුරට ණය ගැතිව ඇත. සාධාරණයෙන් හෝ අසාධාරණයෙන් සුළුවෙන් ආරම්භ කොට පසුව විශාල පංගුවක් හෙක් ග්‍රාමීය තට්ටුමාරු කට්ටිමාරු යායක වගා අයිතිය ලබා ගැනීමේ දී ඉඩම් මිළ දී ගන්නන් විසින් ඔහු ගේ වාසිය තකා යොදා ගන්නා උපක්‍රම ඔබේසේකර ගැඹුරින් සාකච්ඡා කොට ඇත.

(ඈ) මැදගම, කට්ටුමාරු කට්ටිමාරු ක්‍රමය යටතේ කුඹුරු ඉඩම් සම්බන්ධව පොදු අයිතියක් තිබෙනවා සේම ගොඩ ඉඩම්වල (වී වගා නොකරන ඉඩම්) පොදු අයිතියක් දක්නට ඇත. ඔබේසේකර මේ තත්වය විස්තරාත්මකව සාකච්ඡාවට ලක් නොකරයි (පිටුව 294). නමුත් මැදගම ගොඩ බිම් අයිතිය පිළිබඳ නියායාත්මක බෙදීම් කුඹුරු ඉඩම්වලට සමානය. ගමේ කුඹුරෙන් අයිති පංගුවටම සමාන කොටසක් ගොඩ ඉඩමෙන් ද අයිතිය. මේ ගොඩ ඉඩම් ගමේ ආරම්භක ගොඩ ඉඩම් යායට අයත් කළ හැකි ය. බොහෝ ගොඩ ඉඩම්වල ගස් භෝග වගා කළ නිසා මාරු භුක්තිය ක්‍රියාත්මක කිරීම අපහසු ය. ඒ නිසා ගොඩ ඉඩම් අයිති පංගුවල නිවාස ඉදි කර ගැනීමටත්, ගස් භෝගයන් ගේ අස්වැන්න පංගු කරුවන් අතරේ බෙදා ගැනීමටත් පුරුදු විය. හතරවන උප ග්‍රන්ථයේ දී මේ තත්වය විස්තරාත්මකව සාකච්ඡා කොට ඇත. මෙය ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පරිසරයට පොදු දෙයක් බැවින් මැදගම ප්‍රත්‍යයෙහි සියලු ම ග්‍රාමීය සාමාජිකයන්ට ගමේ පොදු ගොඩ ඉඩම් අයිතියක් ක්‍රමාකාරයක් ව. යෙන් පවතී යන්න අදහා ගැනීමට හේතු කාරණා නැත.

(ඉ) ඔබේසේකර ඔහු ගේ අධ්‍යයනය පටන් ගත්තේ කෘෂි කාර්මික ශිල්ප ක්‍රමය හෝ කෘෂි ආර්ථික විද්‍යාත්මක ලක්ෂණයන් ඔහු ගේ කෘතියේ විෂය කාරණා සඳහා සෘජුව අදාළ නොවන බව පවසමිනි. (පිටු 8) පොතේ වැඩි හරියක් ම ඔහු ගේ සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණය මගින් පාලනය වී ඇත. නමුත් එක් අවස්ථාවක මෙම ක්ෂේත්‍රයේ දී තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රමයේ ශක්තිමත් පැවැත්මට පැමිණෙන අහිතකර භාවයන් හේතුවෙන් ඉඩම් පංගු අයිතිකරුවන්ට ඔවුන් ගේ කොටස් එකට එක් කිරීම මගින් (හෝ අඳ භුක්තියට පැවැරීම) මාරු ඉඩම් ඒකක අතිරේක උප කොටස් වලට බෙදීමෙන් වැළැකී සිටීමට පෙළඹෙන අයුරු විග්‍රහ කර පෙන්වයි (පිටු 206–7). මෙවැනි තර්කයක් සම්පූර්ණ වටිනාකමකින් යුක්ත ය. නමුත් ග්‍රන්ථයේ සංදර්භයේ දී එය එසේ නොවේ. මාරු භුක්තිය කෘෂිකාර්මික ක්‍රියාවන් කෙරේ බලපාන ආකාරය විමසීම ඔහු ගේ අධ්‍යයනයට අදාළ නොවන බවට ග්‍රන්ථය ආරම්භයේ දී ප්‍රකාශිත අවධානය සම්පූර්ණ කර ගැනීමට ඔබේසේකරට නොහැකි වීනි නම් භුක්ති ක්‍රමයට ඔහු විසින් ම අවධානාත්මක ආලෝකයක් හෙළූ එක් අංශයකින් (පැත්තකින්) පමණක් ප්‍රවේශය නොකළයුතුව තිබුණි. මොහු අඩු තරමින් වත් මෙම භුක්ති ක්‍රමය විසින් කෘෂිකර්මය කෙරේ හානි කර ප්‍රතිඵල ගෙන දෙන බවට ඉඟියක් පවා නොකරයි.

ඔබේසේකර විසින් තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රමය අගැයීමකට වඩා එය ආරක්ෂා කිරීම පදනමක නොදැනුවත්වම සිටි බව පෙනෙන්නට තිබේ යයි කීම හේතු කාරණා සහිතය. ඔහු මෙය කිසිම අවස්ථාවක පැහැදිලි කරන්නේ නැත. මෙහි දී තීන්දුව එන්නේ ඔහු ගේ ග්‍රන්ථයේ සහ එහි කා සාකච්ඡාවට ලක් වූ සහ සාකච්ඡා නොවූ කරුණු අවශ්‍ය පරිදි හරවා පෙරලා ගැනීම තුළිනි. ඉහත ඡේද මගින් අප විවාද කළ පරිදි භුක්ති ක්‍රමය කෘෂිකාර්මික කටයුතු කෙරේ බලපාන ආකාරය පිළිබඳ ඔහු ගේ සාකච්ඡා පැහැදිලිවම එක් අංශයකට යොමු වී ඇත. ගම පුරා පැතිරී තට්ටුමාරු කට්ටිමාරු ප්‍රභේදයන් තෙත් කලාපීය සිංහල ගමක සම්ප්‍රදායික හා සමාජ සංවිධානාත්මක පතුනම් වලින් එකක් ලෙස සාමාන්‍ය වශයෙන් ගෙන හැර පෑමට ඔහු බොහෝ උත්සාහ කොට ඇත. ඒ නිසා තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමයේ පරිරක්ෂණය හා ගතානුගතික පර්යාය පරීක්ෂණය අතර එක්තරා ආකාරයක බැඳීමක් පවතින බව ඔහු පෙන්වා දෙයි. මෙවැනි පැහැදිලි කිරීමකට මුල් වූ ආනුභාවික (ප්‍රත්‍යක්ෂ මූලික) පදනම සම්පූර්ණයෙන් ම දුර්වල ය.

## (II) අයි. කේ. වීරවර්ධන සහ අයි. කොලොන්නගේ ගේ 'තට්ටුමාරු කට්ටිමාරු' විෂය අධ්‍යයනය.

ඔබේසේකර ගේ මාරු භුක්ති ක්‍රමය පිළිබඳ කුහවුරු විස්තරයට ප්‍රතිවිග්‍රහ දැක්වූයේ අප පමණක් නොවේ. ඔබේසේකර ගේ කෘතියෙන් ඇති වන හානිකර ප්‍රතිවිපාක මඟ හැරවීම පිණිස ඔවුන් ගත් ඇඩි උත්සාහය සඳහා වීරවර්ධන හා කොලොන්නගේ ගේ වාර්තාවේ වැඩි කොටසක් වෙන් වී තිබේ. මෙම කතුවරයන් දෙදෙනා එකල ගොවි කාරක සභා මට්ටමේ ග්‍රාමීය පදනමේ ගොවියන් ගේ ආයතනික අංශයන් අධීක්ෂණය කෙරුණ, ඒ හා කෙළින් ම සම්බන්ධ වූ රාජ්‍ය අංශය වන ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් විය. මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාවෙන් ඉඩම් භුක්ති ක්‍රමයට ආසන්නම හා කාර්යමය වශයෙන් අදාළ විය. මේ නිසා මෙම භුක්ති ක්‍රමය මෙකී දෙපාර්තමේන්තුවට අංශ දෙකකින් ප්‍රශ්නයක්ව පැවතුනි.

පළමුව භුක්ති ක්‍රමයේ සංකීර්ණභාවය නිසා අයිතිය හා භුක්තිය පිළිබඳ නිවැරදි සහ සත්‍ය වාර්තා පිළියෙළ කිරීමට අසීරු විය. (කුඹුරු නාම ලේඛනය)[14]. දෙවනුව ගොවි කාරක සභාවලට නිතරම හිසරදයක් වූ අවුල් වියවුල් සහිත තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ප්‍රභේදයන් තුළ නිතරම වගා කිරීමේ අයිතිය පිළිබඳ ආරවුල් ඇති වීම ය. ගැටළු අධික භුක්ති කාර්ය සංසිද්ධි බහුල ගමක මෙවැනි විෂය අධ්‍යයනයක් කිරීමට මෙම කතුවරයන් මෙහෙය වූයේ මෙකී පසුබිම යි[15].

මහගම උතුර (කළුතර දිස්ත්‍රික්කය) 1971 දී කුඹුරු වලින් 2/3 ක් ම එක්තරා ක්‍රමයක තට්ටු මාරු කට්ටිමාරු භුක්ති ක්‍රමයක පැවති අතර, මේවා සියල්ලම වාගේ සම්බන්ධ තට්ටුමාරු කට්ටිමාරු ප්‍රභේදයන් ය. සංකීර්ණත්වය නියමයක්ව තිබුණි (රීතියක්ව තිබුණි). එක් ප්‍රභේදයක් එනම් අක්කර 2.08 ක කුඹුරක් කොටස්කරුවන් 479 දෙනෙක් අතරේ අවුරුදු 16 කින් අවසාන වන චක්‍රයක පවතින බව පෙනේ. (පිටු 22–23) සමහර අයිතිකරුවන්ට විවිධ තට්ටුමාරු කට්ටිමාරු ප්‍රභේදයන්හි වෙන් වෙන් කොටස් 30 ක් පමණ අයත්ව තිබුණි. (පිටු 12(. ගොවි කාරක සභාවේ හා අනෙක් ගැමියන් ගේ සහයෝගයෙන් එක් කර ගන්නා වැදගත් දත්ත ගැඹුරු ලෙසකින්

වාර්තාවේ දී විග්‍රහ වී තිබේ. වීරවර්ධන හා කොලොන්නගේ මෙම භුක්ති ක්‍රමය කෘෂිකාර්මික සංවර්ධනයටත් යහපත් ග්‍රාමීය සමාජ සම්බන්ධතාවයට සතුරු බව තරයේ විශ්වාස කරති. ඔබේසේකර ගේ මාරු භුක්තිය ග්‍රාමීය සමාජයට ඇති සම්බන්ධතාවයන් පිළිබඳ තර්ක භුක්ති ක්‍රමය තුළ ඇති උරුමවාසිකම් පිළිබඳ අවුල් පිළිබඳ තර්ක මගින් පැහැදිලි ලෙසම පසුබා තිබේ (පිටු 69). ඔවුන් සොයා ගෙන ඇති පරිදි පංගු උරු මකරුවන් ගෙන් වැඩිම ප්‍රමාණයක් (657 න් 596 ක්) තට්ටුමාරු කට්ටිමාරු භුක්තිය අහෝසි කර දැමීමට එකඟත්වය දැක්වූ අතර, කුඩා ප්‍රමාණයක් (31 දෙනෙක්) අහෝසි කිරීමට උපයෝගී වන පංගු මාරු කළ හැකි ක්‍රමයක් ගැන කල්පනා කර බැලීමට කැමැත්ත පළ කළේය[16] (පිටු 83). අවසාන වශයෙන් අදට නොගැලපෙන (අද ස සාම්ප්‍රදායට පටහැනි) හා හානි කර භුක්ති ක්‍රමය දිගට පැවැත්ම පිළිබඳ තීරණය කිරීමට කිසිවක් නැත. මෙම කතුවරයන් භුක්ති ක්‍රමයේ අහෝසි භාවය ඇති වන විවිධ ප්‍රවේශකයන් කිහිපයක් ෙ කෙරෙහි අවධානය යොමු කරවයි.

(III) පී. ගනේවත්ත ගේ 'තට්ටුමාරු හා කට්ටිමාරු' - කුඹුරු ගොවිතැනේ මාරු භුක්ති ක්‍රම.

වියළි කලාපයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මාරු භුක්ති ක්‍රමය කලාතුරකින් සිදු වන ප්‍රදේශයක සුළු පරිමාණයේ ක්ෂේත්‍ර සමීක්ෂණයක ප්‍රතිඵලයකි. මෙම කෙටි වාර්තාව. වැවෙන් ජලය සැපයෙන පුරාණ ගම්මාන සමීක්ෂණය කර ඇත්තේ. මෙම ගම්වල තට්ටුමාරු භුක්ති ක්‍රම කලාතුරකින් ඇතත් අළුතෙන් වාරි පහසුකම් සැලසූ අස්වැද්දූ කුඹුරුවල දක්නට නොලැබේ. ගමේ කුඹුරු ඉඩම් අක්කර 51 න් අක්කර 5 ක පමණක් පවතින සරල තට්ටුමාරු ප්‍රභේදයන් පහක් සහ අක්කර තුනක සරල කට්ටිමාරු ප්‍රභේදයන් දෙකක් පමණකි, ඇත්තේ. සම්බන්ධ තට්ටුමාරු කට්ටි මාරු ප්‍රභේදයන් දක්නට නැත. භුක්ති ක්‍රමය පුළුල් ව්‍යාප්තියක් නැති අතර, බොහෝ සේ සරල සහ මෑතක දී හටගත් ඒවා ය.

ගනේවත්ත අදාළ පාරිභාෂික ශබ්ද විග්‍රහයක් කරයි. එසේ ම ඒ ඒ ප්‍රභේද වෙනම විග්‍රහ කරයි. එසේ ම භුක්ති ක්‍රමයේ වාසි සහ අවාසි පෙන්වයි. ගොවියන් අතර විශ්වාසවලට අනුව ආයෝජන යන් පසුබා සිටින හෙයින් කෘෂි නිෂ්පාදනයට බලපාන අයුරු පෙන්වයි. භුක්ති ක්‍රමය නිසා සියළුම ගම්වැසියන්ට කුඹුරකට අයිතියක් තිබෙන හෙයින්, සියළු පවුල් කෙරෙහි එක්තරා ආකාරයකින් සාමාන්‍ය මට්ටමේ සෑහීමකටත් අසහන හා අවුල් සහගත තත්වයන් අඩු කිරීමටත් හේතු වන බවට ගනේවත්ත හේතු ඉදිරිපත් කරයි. මෙම ගමෙහි මෙකී තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රමය දිගටම පැවත ආයේ: සංකීර්ණ තත්වයකින් දැයි යන අවසාන නිගමනයේ දී කතුවරයාට යෝග්‍යත්වයක් තිබුණා වි ය යුතුම ය. ඉහතින් අනෙක් කතුවරයන් සාකච්ඡා කළාසේම තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රමය ස මී සමීක්ෂණයට ලක් වූ ගම කෙරෙහි ඒ ඒ විශේෂිත අංශයන් ගෙන් පිළිබිඹු තාවයක් පෙන්වන බවට නිගමනයකට එළඹෙයි. මෙවැනි නිගමනයන් ගෙන් යම් කිසි ප්‍රමාණයක හෝ සමහරවිට සාමාන්‍ය කරණියත්වය සැක සහිත වේ.

## 8. කෘෂකයාගේ ග්‍රාමීය විෂය අධ්‍යයන.

### 1. ඉහළ ලේල්වල.

මෙම ගම ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම උප දිසාපති කොට්ඨාශය තුළ පිහිටියේ ය. ගොවිගම කුලයට වැඩි කොටසක් අයත් වන මෙය පැරණි ගමකි. ඥාතීත්ව සම්බන්ධතාවය ප්‍රබල රාමුවකින් යුතු වන අතර, ගොඩ බිම් පොදු අයිතියක පවතී. සම්ප්‍රදායික පහත රට ගමක විශේෂ ලක්ෂණ යන් ගෙන් එය පරිපූර්ණ ය. ගමේ ජනතාව සාපේක්ෂ වශයෙන් සමෘද්ධිමත් සේම මනා අධ්‍යාපන යක් ලැබුවෝ වෙති. වැඩි කොටසක හැම කුටුම්භයකින් ම අඩු තරමින් එක් අයෙකු හෝ රජයේ කාර්යාලවල නිලතල දරති. සාමාන්‍ය වශයෙන් බලන විට ගමේ සෑම කුටුම්භයන් තුනකටම එක් කුටුම්භයක එවැනි රැකියාවල නියුතු අයෙකු සිටියි. බොහෝ අය දිනපතා නාගරික මධ්‍යස්ථානවලට රැකියා කටයුතු ආදිය සඳහා පැමිණෙයි.

කුඹුරු ඉඩම් හා ගෙවතු වලින් වට වූ ප්‍රධාන සහ ඊට අනුබද්ධ උප නිම්නයන් ගෙන් ගම සමන්විත වේ. අවට කඳු ගැට ගැමියන්ට අයිති කුඩා හා විශාල තේ වතු වලින් සමන්විත ය. රජයේ රැකියා කුඩා තේ ඉඩම් සහ තේ වතුවල රැකියා ආදිය කුඹුරු වගාවට අමතරව ගැමියන් ගේ වික ල්ප ආදායම් මාර්ග වේ. ඉඩම් හිඟතාවය නිසා වැඩි අස්වැන්න දෙන වී වර්ග පාවිච්චි කළත්, ආදායම් වැඩි කරන වගා ක්‍රම පැල සිටුවීම, පේලියට ඇට ඇමීම ආදී ක්‍රියා පිළිවෙළ අනුගමනය කළත්, අස්වැන්න මධ්‍ය තරමක පවතී. 1976/77 මහ කන්නයේ සාමාන්‍ය අස්වැන්න අක්කරය කට බුසල් 23 කි. 1977 යල අස්වැන්න අක්කරයකට 19 කි. ගැමියන් ගේ සමාජ චර්යාවට අනුව බැඳුවක ගණුමකට වඩා ගමේ කුඹුරු ඉඩමක් තිබීම වැදගත්කමක් ගනිනා අතරම වගකිව යුතු සාමාජිකත්වයක එනම් ගම්වැසි භාවයට සම්පූර්ණ ආයතනත්වය සහ ගමේ කුඹුරු හා ගොඩ ඉඩම්වලට නිත්‍යානුකූල උරුම වාසිකම් තිබීමේ තත්වය ඉතාම සමීප ලෙස ගෞරවණීය සමාජ තත්වයන්ට සංග මය වේ. තමන් ගේ මුතුන් මිත්තන් විසින් අස්වද්දා ගෙන භුක්ති විඳි ගමේ ඉඩම් දිගටම භුක්ති විඳි ගමේ ඉඩම් දිගටම භුක්ති විඳීමේ අයිතිය තමන් සතු බව ගැමියෝ අදහති. ඉතාම සුළු තට්ටුමාරු කට්ටිමාරු පංගු උරුමකරුවන් පවා තම පංගු කැප කිරීමේ දී අසතුටු වන්නේ ඇයි ද යන්න මෙයින් පැහැදිලි ය. කෙසේ වෙතත් 9 වන පරිච්ඡේදයේ දී දක්වන පරිදි ගැමියන් තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමයට තදින් ම විරුද්ධත්වයක් දක්වති. පාරම්පරික ඉඩමක පංගුවක් අයිතිව තිබීම හා එම අයිතිය අසතුටුදායක මාරු භුක්තියක් ක්‍රියා කිරීම යන දෙක ඔවුහු මනාව පැහැදිලි කර ගෙන සිටිති.

ගොවි කාරක සභා ලේඛනයට අනුව ගමේ කුඹුරු ඉඩම් වලින් 40% (ගොවි කාරක සභා දෙකක්) මාරු භුක්තිය යටතේ පවතී. කෙසේ වුව ද, මේ සංඛ්‍යා අසම්පූර්ණය. ඒ ඒ තට්ටුමාරු කට්ටිමාරු ප්‍රභේදයන් පිළිබඳ විස්තර තොරතුරු අනුව ඇති සංකීර්ණත්වය නිසා පුළුල සහගත ලෙස තේරුම් කර වටහා ගැනීමට පවා අසීරු ය. බොහෝ සංකීර්ණ භුක්ති ප්‍රභේදයන්හි පංගු කරුවන් පවා අදාල සම්පූර්ණ උරුම විස්තරය නොදැන ඊළඹීම රීතියක් වශයෙන් පවතී. සැම දෙ දෙනාම තම හෝ තම අසල්වැසි හෝ නෑදෑයකු ගේ අයිතිය පිළිබඳ වුව ද, දන්නේ සුළු වශයෙනි.

සංකීර්ණ වූ භුක්ති ප්‍රභේදක පිළිබඳ සවිස්තර පැහැදිලිව තෝරා බේරා ගැනීමේ දී පර්යේෂකයාට ගෙටලී කිහිපයකට පවා යැමට සිදු විය. කුඹුරු නාම ලේඛනයේ තොරතුරු සකස් කරනු ලැබ ඇත්තේ ස්වේච්ඡා සහ සමහර විට උද්‍යෝගයෙන් තොර මහජන සේවකයන් වන ගොවි භාරක සහා සාමාජිකයන් විසිනි. මූලික වශයෙන් ඔවුන්ට ගෙයක් ගෙයක් පාසා ගොස් ඒ තොරතුරු එක් රැස් කිරීමට උපදෙස් දී තිබුණ ද ක්‍රියාත්මක අංශයෙන් එය එසේ නොවීය. කුඹුරු ඉඩම් නාම ලේඛනයේ එහි තත්ව සැකසුමට අනුව ඉතාම අපහසු කාර්යයක් වූ තට්ටුමාරු කට්ටිමාරු භුක්ති අයිතිය පිළිබඳ පුළුල් විස්තර අඩංගු කිරීමේ දී ඔවුන් නිතරම නොඉවසිලිමත් වූ බව මතක තබා ගත යුත්තකි. මේ නිසා සමහර උරුම කරුවන් අවස්ථාවෙන් ප්‍රයෝජන ගනිමින් එකම උරුමකරු තමන් යනුවෙන් ලේඛනගත කර ගන්නා ලදී. පසුව අයිතිය දැක්වීමේ දී මෙය ප්‍රධාන සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන බව භුක්ති ගැටළු කිහිපයකින් පැහැදිලි විය. වෙනත් කුඹුරු කැබලි මාරු භුක්තිය යටතේ ලියා පදිංචි නොකරන ලද්දේ මන්දෝත්සාහී නිසා හෝ වෙනත් දෝෂ නිසා ය. මෙහි අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ මාරු භුක්තියට භාජනය වූ කුඹුරු අඩුවෙන් ලියා පදිංචි වීම ය.

ඉහළ ලේල්වල තට්ටුමාරු කට්ටිමාරු භුක්තිය සම්බන්ධයෙන් පෙන්වන වැදගත් අදහස නම්, එහි ගැමියන් ගේ විස්තර තොරතුරුවලට අනුව, එය වර්ධනය වී ඇත්තේ ප්‍රාදේශීය භෞතික පරිසරයට අනුව යන්න ය. කුඹුරු යායවල් වට වී ඇත්තේ බෑවුම් සහිත කඳු වලිනි. දෙවන ලෝක යුද්ධයට පසුව නිම්නයේ ප්‍රධාන දිය පාර ගැඹුරු හා විශාල කිරීමට උත්සාහ කොට ඇත. ඊට ප්‍රථමව කුඹුරු ජලාධික මඩ බහුල වගුරු වශයෙන් පැවතිනි. වර්ෂාව අඩු යල කන්නයේ පමණකි, වගා කෙළේ. කඳු බෑවුම් සහිත වීමත්, කුඹුරු වගුරු සහිත වීමත්, නිසා අධික වර්ෂා කාලයට මතුපිට පස සෝදා යාමකට ලක් විය. මෙය වී ගොවිතැනට විශාල අවදානමක් විය. මේ තත්වය මඟ හැරවීමට ලියැදි අතර, නියර ශක්තිමත් හා විශාල ලෙස බඳින ලදි. මෙයට සම්බන්ධව පිදුරු පීරි විශාල වශයෙන් (තාවකාලික ලෙස) දමා ගංවතුර කාලයේ ජල මට්ටම පරීක්ෂා කිරීමේ දී ගමන් කිරීමට හැකි වනු ලෙස වැටි සාදා ගන්නා ලදි. මෙම වැටි දෙපස එළවළු සහ අල වර්ග ද වගා කළහ.

තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමය මෙම ස්වභාවික පරිසරයට දෙ ආකාරයකින් සම්බන්ධ වේ. පළමුව, ලියැදි වෙන් කළ විශාල නියර මගින් ගංවතුරෙන් වන හානි සහ මතු පිට පස සෝදා යාමේ පාඩුව මඟහරවා ගැනීමට නොහැකි විය. මාරු භුක්ති ක්‍රමය මගින් මෙහි අවදානම් තත්වයේ බර වගා කරන්නන් කිහිප දෙනෙක් අතරේ බෙදී යයි. විවිධ තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රම අතුරෙන් තනි කට්ටිමාරු ක්‍රමය තුළින් පාඩුව සමාන කිරීමේ මූලික අදහස් පැහැදිලි කරයි. (2 සහ 5 කොටස) අප දන්නා සීමය අධ්‍යයන ප්‍රදේශ පහ අතුරෙන් පැහැදිලි පොදු භුක්ති ක්‍රමයක් ලෙස තනි කට්ටිමාරු ක්‍රමය ඇත්තේ ඉහළ ලේල්වල පමණි. (වගුව 6) ඓතිහාසික වශයෙන් දිගු කලක් වී ගොවිතැනේ අවදානම් බව කට්ටිමාරු භුක්ති ක්‍රමය මගින් විවිධ ගොවීන් අතර බෙදී ගිය ගමන් නිසා විය හැක.

මාරු භුක්තිය සහ ස්වභාවික පරිසරය අතර සම්බන්ධතාවයේ දෙවැන්න නම් ලියැදි නියර මගින්

උප කැබලි වලට බෙදීම අයෝග්‍ය සේම වගා කටයුතු කිරීමේ දී ද අපහසු තාවයයි. මෙම මඩ කුඹුරු නැවත බෙදීමේ දී මායිම් සහ ජල පාලන මාධ්‍ය වශයෙන් නියර බැඳීමේ දී යෝග්‍ය පස් ගැනීම ද දුෂ්කර ය. ජලය පාලනය කිරීමේ දී ලියැඳි අතුරු කොටස්වලට බෙදීම ප්‍රශ්න යක් වේ. මේ තත්වය යටතේ ලියැද්ද නොබෙදා මාරු භුක්තිය යටතේ වගා කිරීම ඵලදායි විය. ඉහත කාලවල දී විශාල ලියැඳි (ඉඩම් කැබලි) අයෝග්‍ය නොවූයේ ඒවා කයිය ක්‍රමයට වගා කළ අතර, බොහෝ විට කණ්ඩායමක් විසින් වගා කොට අස්වැන්න පමණක් බෙදා ගන්නා ලද හෙයිනි.

මෙසේ ඉහළ ලේල්වල හි කුඹුරු ඉඩම් කෙරෙහි බල පෑ සමාජයීය සැකැසුම් පිළිවෙළවල් ස්වභාව පරිසරයේ තාක්ෂණික ලක්ෂණයන් හා එහි අනෙක් පැත්තට වඩා ගැලපී සකස් වී ඇති බව පෙනේ. සෑම සමීකරණයක් ම කෙසේ හෝ වෙනස් වී ඇත්තේ සැලකිය යුතු තත්වයකින් ස්වභාව ධර්මය විකරණය වීම අනුගමනය කරමිනි. ප්‍රධාන දිය ඇල ප්‍රතිසංස්කරණ කළ නිසා ජලාපවාහනය මනා ලෙස සිදු විය. එහෙත් ඇල ගැඹුරු වීම නිසා නිම්න පත්ල පහළ මට්ටමක ජලය පැවතිනි. ඒ නිසා කුඹුරු ඉඩම්වලට ජලය බෙදීම අසීරු විය. දැනට ප්‍රශ්නයක්ව ඇත්තේ ජලයේ හිඟ කමයි. මේ නිසා ජලාපවහනයට සම්බන්ධ වූ ඇල ගොවියන් විසින් නොසලකා හරිනු ලැබුහ. මෙම ඇලවල් (පිටවාන) දැන් අවහිර වී තිබේ. තේ වතුවලින් ඛාදනය වන වැලිපස කෙළින්ම කුඹුරු ඉඩම් මත තැන්පත් වේ. මෙය වගාවට තවත් බාධාවකි. මේ නිසා ශ්‍රමය වැඩිපුර යොදා ඇලවල් සුද්ද කිරීම ඉඩම් මට්ටම් කිරීම සහ අනෙක් යටිතල ව්‍යුහ සංවර්ධනය කිරීමට ඇත. මාරු භුක්ති ක්‍රමය මෙකී ආයෝජනයන්ට අනුබල දෙන තත්වයක නොපවතින නිසා එය තවදුරටත් මෙකල ස්වභාවික පරිසරයට අදාළ නොවේ.

ඉහළ ලේල්වල කුඹුරු ඉඩම්වල පෙනෙන අසාමාන්‍ය ලක්ෂණයක් වූ ගොවියන් විසින් එළවළු හා අනෙක් භෝග වර්ග වගා කරන කුඹුරුවලට ඉහළින් පිහිටි ඉස්සුනු පස් ගොඩැල්ලක් වැනි 'කලාවිට' වශයෙන් හැඳින් වෙන ඉඩම් කොටසකි. ගොයම් කපන කාලය එන විට මෙහි එළවළු හා අල වර්ග පල ගන්නා නිසා එයින් පසු කමතක් වශයෙන් යොදා ගන්නා බව ගැමියෝ පවසති. කාල යක් තිස්සේ විශාලත්වයෙන් හා සංඛ්‍යාවෙන් මෙම 'කලාවිට ඉඩම්' වෙනස් වී තිබේ. තට්ටු මාරු කට්ටිමාරු ඉඩම් වල මෙම කලාවිට තමන් ගේ ම පුද්ගලික ප්‍රයෝජනය පිණිස යොදා ගැනී මට පුද්ගලයෝ පුරුදුව සිටිති. මෙවැනි බොහෝ ඉඩම්වල ස්ථිර භෝග එනම්, තේ , පොල් සහ උක් වැනි දෑ වගා වී ඇත. මේවා මේ නිසා තමතත් ලෙස පාවිච්චි කිරීම අසීරු ය. අවට කුඹුරු යට වන පරිදි තම 'කලාවිට' ඉඩම් විශාල කිරීමට සමහරු වෙහෙසෙති. මෙවැනි බලයෙන් ඉඩම් අල්ලා ගැනීම් වලට විරුද්ධව තට්ටුමාරු කට්ටිමාරු ගොවියෝ සංවිධානය වීමක් හෝ ඉදිරිපත් වීමක් පෙනෙන්නට නැත. මෙසේ කුඹුරු ඉඩම් කුඩා වීම නිසා පංගු උරුම කරුවන් අතර ආරවුල් ඇති වීමට ඉඩ තිබේ. මෙසේ තම උරුමයෙන් එන සම්පූර්ණ ප්‍රදේශය වගා කිරීමට කරන සියළු ම උත්සාහයන් ගෙන් සෑහීමකට පත් නොවන්නේ මුල් පංගුව ක්‍රමයෙන් අඩු වී ගොස් ඇති හෙයිනි.

(II) මහගන්ගොඩ.

මහගන්ගොඩ ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ උප දිසාපති කොට්ඨාශයේ ගොවි කාරක සභා බල ප්‍රදේශයකි. මෙම ගම වෙරළේ සිට සැතපුම් 4 ක් ඔබ්බෙන් පිහිටි අතර, සාම්ප්‍රදායික රැකියාව මාළු ඇල්ලීම වූ කරාවේ කුලයේ මිනිසුන් ගෙන් සමන්විත ය. ගැමියන් දිගු කලක සිට වී සහ ගොඩ ඉඩම් භෝග වගා කරන්නන් වූ අතර, විශේෂ ගොඩ ඉඩම් වගාව වූයේ කුරුඳු ය. නමුත් ඉහළ ලේලීවල මෙන් ගොවිතැනම මුල් කොට ගත්තවුන් නො වේ. මහගන්ගොඩ පස වැලි සහිත නිසරු වන අතර, වී අස්වැන්න පහළ මට්ටමක පවතී. 1976/77 කෘෂි කාර්මික වර්ෂයේ දෙකන්නයේ සාමාන්‍ය අස්වැන්න අක්කරයකට බුසල් 18 සහ 17 ආදී වශයෙනි. පොහොසත් ගෙවල් වලින් වැඩි කොටසක රජයේ කාර්යාලවල රැකියාවල නියුතු අය වෙති. මේ කොටස ඉහළ ලේල්වල ප්‍රමාණයට වඩා අඩු ය. නමුත් මහගන්ගොඩ වෙනත් රැකියාවල නියුතු බොහෝ අය නගරවල වැටුප් ලබන රැකියා කරති. එය විශේෂයෙන් ගොඩ නැඟීම් අංශවල ය. නාගරික සම්බන්ධය හා ගමට පිටින් ගෙනෙන ආදායම් ප්‍රමාණය අතර වැඩි වෙනසක් මේ ගම් දෙක අතර, දක්නට නැතත් ඉහළ ලේල්වල ගැමියන්ට කුඹුරු ගොවිතැන වටිනා කමෙන් හා ආකල්පයන් ගෙන් යන දෙ අංගයෙන් ම වැදගත්කමක් ගනී. මෙවැනි වැදගත්කමක් ඇති දර්ශක යක් අස්වැන්නු නෙලන කාලයේ දී හමු වේ. ඉහළ ලේල්වල ගැමියන් ඔවුන් ගේ ගතානුගතික දේව විශ්වාස කෙරේ විශාල භක්තියක සිට අස්වැන්න නෙලන කාලයේ දී සෑම පියවරක් පාසාම එක්තරා ආකාරයක චාරිත්‍ර වාරිත්‍ර ක්‍රමයක් අනුගමනය කරන අතර, ඒ වෙනුවට මහගන්ගොඩ කුඹුරු අස්වැන්න කපා අහුරා ගැනීමේ දී ඒ වෙනුවට උග්‍ර වාණිජ ස්වරූපයක් ගනී. ගොවියෝ කිහිප දෙනෙක් පමණක අලෞකික වරයන් පතා අළුත් බත් පන්සල් හෝ පූජනීය ස්ථාන කරා ගෙන ගොස් පූජා කිරීමට හුරු පුරුදුව සිටී.

මහගන්ගොඩ ගොවි කාරක සභා ප්‍රදේශයේ මාරු භුක්ති ප්‍රභේදයක් තිබුනේ නවයක් පමණි. එයට අයත් වනුයේ මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් 7% ක් පමණි. සම්පූර්ණ විස්තර නැතත් සියළු ම ඉඩම් භුක්ති ලැයිස්තු ගත වී ඇත. තවදුරටත් ප්‍රභේදක තුනක් එනම් දෙකක් තනි තට්ටුමාරු ක්‍රම යට ද, එකක් තනි කට්ටිමාරු ක්‍රමයට ද, ආදී වශයෙන් තිබූ භුක්ති ඉඩම් අවුරුදු තුනකට පෙර දී ගොවි කාරක සභාවේ කුඹුරු නාම ලේඛනය පිරවීමට සිදු වූ හෙයින්, උරුමකරුවන් අතර, පොදු කැමැත්තට අනුව බෙදා දී තිබේ. කොළඹින් ලබා ගත හැකි සංඛ්‍යාවලට අනුව බටපොල කෘෂිකාර්මික පලදා වර්ධන කමිටු ප්‍රදේශයේ මුළු කුඹුරු ඉඩම් වලින් 2% කි මාරු භුක්තිය යටතේ ඇත්තේ. ගොඩ ඉඩම් හා මඩ ඉඩම් වලින් වැඩි කොටසක් පිටගන්කාරයන් සතුව ඇති අතර, කුඹුරු ඉඩම් වලින් 1/2 තරම වගා කරනුයේ ඉඩම් හිමිකම යටතේ ය. මහගන්ගොඩ කුටුම්භ යන් ගෙන් 2/3 ක් ම කුඹුරු නොමැති සහ කුඹුරු ගොවිතැන් නොකරන ගණයට අයත් ය.

ඉඩම් භුක්ති ක්‍රමයේ එවැනි ලක්ෂණ වලින් හා ගොවි අංශයෙහි ක්‍රියාත්මක සම්බන්ධ තාවය අඩුකම නිසා මහගන්ගොඩ ගම ඉහළ ලේල්වල මෙන් කුඹුරු ඉඩම් සමඟ තිට්ටු සම්බන්ධභාවයක් නොපෙන් වයි. තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමයට ඇති අකමැත්ත ඉතා පොදු දෙයක් වී ඇති අතර, එය ස්ථිර වී තිබේ. (9 වැනි කොටස බලන්න). ගැමියන් විසින් තට්ටුමාරු කට්ටිමාරු භුක්ති

නොබෙදීමට හේතු වශයෙන් දී ඇති වැදගත්ම කරුණ නම් කුඹුරු බිම්ය උප කොටස්වලට බෙදීම නිසා ගොවිතැන් කිරීමට අපහසු කුඩා ලියැදි ඇති වීම ය. සමහර කුටුම්භයන් එක තට්ටුමාරු කට්ටිමාරු පංගු එක හැර ඉඩම් නැති කොටස් බව පෙනී ගියේ ය. මෙම භුක්ති ස්ථිරවම බෙදීමෙන් ඔවුන්ට ඇති වන වාසිය නම් වර්ෂයක් පාසා වගා කිරීමට ඉඩමක් ලැබීම ය.

මහගන්ගොඩ කුඹුරු ඉඩම් පිහිටියේ හදිසියෙන් ම ජලය බැස යන වැලි සහිත ඉහළ ඉඩම්වල ය. කුඹුරු අයින දිගේ දිවෙන ජලය බැස යන ඇළ(පිටවාන) හැර වෙනත් වාරි ක්‍රමයක් එහි නැත. විධිමත් ජල පාලනයකට අපහසු ය. නියරවල් කුඩා වූ අතර, නිතර වාගේ අළුත්වැඩියා කරයි. මේ නිසා තට්ටුමාරු කට්ටිමාරු ඉඩම් ස්ථිරවම බෙදන්ට නොහැකි මන්ද යන්නට තාක්ෂණික හේතු සාධක නැත.

මහගන්ගොඩ වැඩි කොටසක් ජනාවාස වූයේ II වන ලෝක යුද්ධ කාලයේ ය. වැඩි දෙනෙක් රජයේ ඉඩම් සහතිකරුවන් වූ අතර, අනෙක් අය බලයෙන් ඉඩම් අල්ලා ගත් අය ය. ගොවි කාරක සභා බල ප්‍රදේශය තුළ හෝ අප ගේ සම්පූර්ණ ඇනීමේ හැටියට මුළු ප්‍රදේශය ම ඒකක යක් වශයෙන් ගොඩ ඉඩම් වගාවේ දී ඒකාබද්ධ අයිතිය (පොදු අයිතිය) පිළිබඳ ප්‍රතෙයකයක් ක්‍රිහිපයකි, ඇත්තේ.

9. මාරු භුක්ති ක්‍රම පිළිබඳ ගැමියන් ගේ ආකල්ප.

වෙනත් විෂයයක් පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණ ගණනාවක් පවත්වමින් සිටි අවස්ථාවේ දී, ගැමියන් හා පැවති සාකච්ඡා මඟින් මාරු භුක්තිය පිළිබඳ ඔවුන් ගේ දැඩි අරුචිය ප්‍රකාශ වූ හෙයින්, අප ගේ අවධානය එය කෙරෙහි යොමු වූයේ. භුක්ති ක්‍රමයේ පැවැත්මට පූර්ව අප්‍රසාදය දැන ගැනීමේ ආශාවෙන් අපි එහි පැවැත්ම හා ගැමියන් ගේ ආකල්ප පිළිබඳ ක්‍රමානුකූලව තොරතුරු රැස් කිරීමට පටන් ගත්තෙමු.

ඉහළ ලේල්වල රැන්ඩම් නියැඳි ක්‍රමයට තෝරා ගත් පංගු උරුමකරුවන් 54 දෙනෙකු ගෙන් අඩු වියදමකින් සාධාරණ ලෙස කරනවා නම් ඔවුන් තම පංගු උරුම ප්‍රතෙයකයන් ස්ථිරව කැබලි වලට බෙදීමට කැමති ද'? නැද්ද?' යන්න පිළිබඳ ස්ථිරව විමර්ශනය කරන ලදී. ඔවුන් ගේ උත්තර 2 වැනි වගුවේ පරිදි ය.

වගුව 2.

ඉහළ ලේල්වල - මාරු භුක්ති ක්‍රම ප්‍රභේදය බෙදීම පිළිබඳ උරුමකරුවන් ගේ ආකල්ප.

| බෙදීමට පක්ෂව උත්තරකරුවන් 51 දෙනෙකු විසින් දෙන ලද හේතු. | මෙම හේතු දැක් වූ උත්තරකරුවන් සංඛ්‍යාව. |
|---|---|
| 1. එය ඉඩම වැඩි දියුණු කිරීමට මිනිසුන් උනන්දු කරවයි. | 44 |
| 2. එය වී වගාවෙන් වැඩි ලාභ උපදවයි. | 32 |
| 3. එය අවුල් වියවුල්වල අවසානයට හේතු වේ. | 20 |
| 4. එය වී ගොවිතැනේ ඉහළ අස්වැන්නට හේතු වේ. | 14 |
| 5. එය ගොවිතැන් කිරීමේ ගැටළු අඩු කරයි. | 13 |
| 6. තට්ටුමාරු කට්ටිමාරු පිළිවෙළ සැකැස්ම තේරුම් ගැනීම අසීරුය. | 03 |
| 7. පවුල් අසමගියට එක් හේතුවක් නැති කරයි. | 03 |
| 8. ඉඩම් අයිතිය පිළිබඳ ආරක්ෂාවක් ඇති වේ. | 01 |
| 9. මේ නිසා ඉඩම් විකුණා ගැනීමට පහසු වේ. | 01 |
| මුළු ප්‍රමාණය .. .. | 131 |

| උත්තරකරුවන් 03 දෙනෙක් බෙදීමට විපක්ෂව දැක් වූ හේතු. | මෙම හේතු දැක්වූ උත්තරකරුවන් සංඛ්‍යාව. |
|---|---|
| 1. බෙදීම නිසා ලියැද්ද බොහෝ කුඩා වේ. | 01 |
| 2. ඉඩම් මාරුව නිසා හොඳ නරක කැබලි සමානව බෙදී යයි. | 01 |
| 3. නරක භුක්ති ක්‍රමය නොවේ, මිනිසුන් ය. | 01 |
| මුළු ප්‍රමාණය .. .. | 03 |

මහගන්ගොඩ දී තට්ටුමාරු කට්ටිමාරු උරුමකරුවන් 30 දෙනෙකු ගෙන් එවැනි ම ප්‍රශ්න අසනු ලදී. (වගුව 3) ලියැද්ද බොහෝ සේ කුඩා වීමට හැකි වූවත් මොවුහු බෙදීමට කැමැත්ත දක්වති. ඉහළ ලේල්වලට වඩා මහගන්ගොඩ ගැටළු සහ බලයෙන් ඉඩම් අල්ලා ගැනීමේ ගැටළු අඩුවෙන් ය, ඇත්තේ. මහගන්ගොඩ තට්ටුමාරු කට්ටිමාරු ප්‍රභේදය මෑතක දී ඇති වූවා සේම

ඉහළ ලේඛ්වල සමඟ සංසන්දනය කරන විට සරල වීම හේතු වූවා විය හැකි ය. එසේ ම ලේඛ්වල මෙන් නියම (අව්‍යාජ) හා ප්‍රයෝගකාර භුක්ති කරුවන් අතර නොඑකඟතාවයන් ද මෙහි නැත.

වගුව 3.

මහගන්ගොඩ : මාරු භුක්ති ඉඩම් බෙදීම පිළිබඳ උරුමකරුවන් ගේ ආකල්ප.

| බෙදීමට පක්ෂව උත්තරකරුවන් 22 විසින් දෙන ලද හේතු | මෙම හේතු දැක් වූ සංඛ්‍යාව |
|---|---|
| 1. භුක්ති ක්‍රමය දුබල ගොවිතැන් ක්‍රමවලට හේතු වේ. | 18 |
| 2. සෑම අවුරුද්දකම වගා කිරීමට ඉඩමක් තිබීම හොඳය. | 06 |
| 3. භුක්ති ක්‍රමය නිසා දුබලයන් ගේ පංගු බලයෙන් අල්ලා ගැනීමට ඉඩහල් වේ. | 02 |
| 4. අවුරුදු පතා විවිධ ලෙස ඉඩම බෙදා ගැනීම හා නියර අළුත්වැඩියා කිරීම අපහසු ය. | 01 |
| මුළු සංඛ්‍යාව | 27 |

| බෙදීමට විපක්ෂවූ උත්තරකරුවන් පස් දෙනෙකු දැක් වූ හේතු. | මෙම හේතු දැක් වූ සංඛ්‍යාව. |
|---|---|
| 1. බෙදීම නිසා ලියැද්ද බොහෝ කුඩා වේ. | 04 |
| 2. භුක්ති ක්‍රමය නියම ලෙස කෙරී ගෙන යයි. | 01 |
| මුළු සංඛ්‍යාව | 05 |

අනෙක් උත්තරකරුවන් තිදෙනා වෙනත් උත්තර දී තිබේ. දෙදෙනෙකුට ඉදිරිපත් කළ ප්‍රශ්න පිළිබඳ ස්ථිර අදහසක් තිබී නැත. තෙවැනියා ඔහුට අවුරුදු පහකින් හතරක් ම ඉඩමක් වගා කිරීමට උරුමව තිබූ හෙයින් කියා සිටියේ ඉඩම සම්පූර්ණයෙන් ම ඔහුට අයත්ව තිබූ බවත්, එහි තට්ටුමාරු භුක්තියක් නොතිබුණ බවත් ය.

මෙම සියළු ම කරුණු කෙරෙන් නිගමනය වනුයේ ගැමියන් බොහෝ සේ පොදු සහයෝගයෙන් මාරු භුක්ති ඉඩම් ප්‍රතිසංස්කරණයකට කැමැත්තෙන් සිටින බව ය. වීරවර්ධන හා කොලොන්නගේ

මීට සමාන දත්ත කෙරේ යොමු වෙමු. ඔවුන් කෙලින් ම පැහැදිලි ලෙස ගැමියන් ගෙන් ඔවුන් මාරු භුක්තියට අකමැති මන්ද? යන්න අසා විමසා නැති නමුත්, ගැමියන් එය නැති කර දැමීම කැමති ද නැද්ද යන්න පැහැදිලිව විමසා තිබේ. උරුමකරුවන් 657 දෙනෙක් සම්මුඛ සාකච්ඡාවට ලක් වී ඇත. (පිටුව 83). භුක්ති ක්‍රමයෙන් පිට වෙන ක්‍රමයක් පිළිබඳව අදහස් විමසූ විට 91% දෙනෙක් කැමැත්ත ප්‍රකාශ කර ඇත. තැන තැන විසිරී තැබලි එකම යායක දී ඒකාබද්ධ කිරීම පිළිබඳව විමසන ලදුව කැමැත්ත ප්‍රකාශ කලේ 53% කි. ගොවි කාරක සභා ප්‍රදේශය තුළ ඔවුන් ගේ සියලු ම උරුම පංගු එක් ප්‍රදේශයකට එක් කිරීමට ප්‍රශ්න කිරීමේ දී 37% ක් කැමති විය. අන්තිමට තම පංගු තවත් පංගු කරුවෙකුට මාරු කිරීමේ අදහස විමසන ලදුව, එයට කැමැත්ත වූයේ 5% ක් පමණි. ආකල්පීය මත විග්‍රහ සමීක්ෂණයක දී එහි නිරවද්‍යතාවය ඇත්තේ අසන ලද ප්‍රශ්න මාලාවේ සංදර්භය තුළ ය. ගැමියන් පර්යේෂණයන් පිළිබඳ සිතන්නේ මොනවා ද? ඒ ඒ විශේෂිත පිළිතුරු දීමෙන් ලාභයක් හෝ පාඩුවක් වේ යයි ගැමියන් සිතනවා ද? කෙසේ වෙතත් ක්ෂේත්‍ර කටයුතුවල දී ලත් අප ගේ ම හැඟීම් තුළින් ම ගැමියින් ගේ උත්තර ස්ථිර කර ගැනීම සාමාන්‍ය උපනතිය වේ. සමස්ථ වශයෙන් ගැමියන් තදින් ම මාරු භුක්තියට විපක්ෂය. එසේ ම ඉඩම් ඒකාබද්ධ කිරීමේ දී එයට අසතුටුදායක වන්නා සේම විශේෂයෙන් ම අහිමි වන කොටස ගැන ඇත්තවශයෙන් ම පෙන්වනු යේ අසතුටුදායක බව කි. මෙවැනි අසතුටුදායකත්වය විශාල වශයෙන් හෝ අර්ධ ලෙසකින් හෝ ඔවුන් තුළ ඇති සංරක්ෂිත භාවයටම අනුව නොවේ. බුද්ධිමය ලෙස අත්දැකීම් මත බැලුවහොත් නිත්‍යානුකූල බෙදීම් හෝ ඒකාබද්ධ කිරීම් සාධාරණ ලෙස නොකෙරෙනවා පමණක් නොව, කාර්යක්ෂමව ද නොකෙරෙන බව නොරහසකි. විරවර්ධන හා කොලොන්නගේ ඔවුන් ගේ ආකල්ප මූලික සමීක්ෂණයක දී ග්‍රාමීය ජනයා වැඩි වශයෙන් ම මාරු භුක්ති ක්‍රමය වෙනස් වෙනවා දකින්නට කැමැත්තෙන් සිටින බව පැහැදිලි කරයි (පිටු 83). පොදු වශයෙන් මෙය සත්‍ය වන අතර, ප්‍රතිසංස්කරණයෙහි ලා පැනෙන නිත්‍යය කර්තව්‍යයන්ට පංගු උරුමකරුවන් ගේ පරිත්‍යාගයන් පෙරටත් වඩා අවශ්‍ය වන අතර, විපක්ෂතාවය නොවැලැක්විය හැකියි, යන්න එයින් අපට මනාව පැහැදිලි කර දෙයි (13 වන කොටස).

## 10. වී අස්වැන්න සහ වගා ක්‍රම සම්බන්ධයෙන් මෙම මාරු භුක්ති ක්‍රමයෙහි බලපෑම්.

ගැමියන් අතර කුමන විදියේ ව්‍යාකූලත්වයක් තිබුණත් මාරු භුක්ති ක්‍රමය සම්බන්ධයෙන් ඇති ආකල්පයන්ට අදාළව ඇති අදහස් වලින් එකක් නම් පැහැදිලි ය. සියලු ම පංගු උරුමකරුවන් විශ්වාස කරන්නේ මෙම ක්‍රමය වගාවේ තත්වය පහත් කරනවා පමණක් නොව, අඩු අස්වැන්නකට ද හේතු වන බව ය. වීරවර්ධන හා කොලොන්නගේ භුක්ති ක්‍රමයට පහර දෙන ලද්දේ මෙම විශ්වාසයන් පදනම් කර ගෙන ය. මේ පසු පස ඇති තර්ක ඉතාම පැහැදිලි ය. කිසිම පංගු කරුවෙකුට එකම පංගුව අවුරුදු පහා වගා කිරීමට නොලැබේ. එවිට ඉඩම සංවර්ධනය කිරීමට යෙදෙන ආයෝජනයන් ගේ ප්‍රතිලාභය යනු පසුව වගා කරන පංගු උරුමකරුට ය. මෙහි නිශ්ශබ්දව හැඟවෙන ඇති අදහස නම් සියලු ම පංගු කරුවන් ඉඩම සංවර්ධනය සඳහා එකිනෙකා ගේ වාරයේ දී වැඩි වැඩියෙන් ආයෝජනය කිරීම නිසා දීර්ඝ කාලීන වශයෙන් ප්‍රතිලාභය

සියලු ම පංගු උරුමකරුවන් අතරේ සමසේ බෙදී යෑමට හැකියාවක් ඇතැයි යන තර්කය යි. මෙය සමහර භුක්ති ප්‍රත්‍යයයන්හි දක්නට ඇත්තේ පංගු උරුමකරුවන් සංඛ්‍යාව සුළු වූ විට හා ඔවුන් ඉහත උරුමකරු ගේ දරුවන් ගේ කිට්ටුම නෑදෑයන් වූ විට ය. එය මෙකී ප්‍රත්‍යයයන්ට කෙසේ හෝ බොහෝ" සේ පොදු නොවේ. තුන්වැනි පරම්පරාවට අතර ඉඩම බෙදී යන විට (මුල් උරුමකරු ගේ මුණුපුරන්) එම තට්ටුමාරු කට්ටිමාරු භුක්තියේ පංගු උරුමකරුවන් නෑකම් වලින් එකිනෙකාට කිට්ටුම අය නොවන්නට පුළුවන. උරුම පංගු විකුණූ විට, උගස් කළ විට, විවාහ වලින් උරුම වූ විට ද පංගු උරුමකරුවෝ එකිනෙකාට අමුත්තෝ වෙති. මෙසේ පංගු උරුමකරුවන් ඉඩම නඩත්තු කිරීමට හෝ වැඩි දියුණු කිරීමට අපොහොසත් වනුයේ මන්ද යන්න ගැන අප ගේ උත්තරකරුවන් ගේ අවබෝධය පුළුමයට හේතු නොවේ[17].

කුඹුරෙන් කුඹුරට විවිධ වූ කුඹුරු ඉඩම් වල සාරත්වය වැඩි දියුණු කිරීමේ හා නඩත්තු කිරීමේ දී ආයෝජනයන් ගේ ස්වභාවය ඉතාම වැදගත් ය. තට්ටුමාරු කට්ටිමාරු පංගු උරුමකරුවන් හට ඇති බොහෝ පොදු චෝදනාව නම් වාරිමාර්ග හා ජලාපවහන ඇලවල් සුද්ධ කිරීමට හා බැමි නඩත්තු කිරීමේ දී හා ප්‍රතිසංස්කරණය කිරීමට ඔවුන් අපොහොසත් බව ය. මනා ජල පාලනයක් පවත්වා ගෙන යා හැක්කේ එවැනි නඩත්තු කිරීම් නියමාකාරව කෙරෙනවා නම් පමණි. නමුත් අඛණ්ඩව ලෙස වගාවට එන පංගු උරුමකරුවන් අතින් එය මඟ හැරේ. ඉඩම් මට්ටම් කිරීම ද මඟ හැරී ඇත්තේ එකම හේතු සාධක නිසා ය. මාරු භුක්තිය පොදුව පවතින තෙත් කලාපයේ පහතරට අඩු අස්වැන්නට හේතුව වල් පැලෑටි වලින් සිදු වන හානිය යි. වල් පැලෑටි පසේ සාරත්වය උරාගන්නවා පමණක් නොව, උසෙන් අඩු අලුත් වී වර්ග වසා ගෙන ඉහළට වැඩෙයි. වල් පැලෑටි උවදුර සතුවෙන් සතුවට දිගටම පවතී. එක් සතුවක වල් පැලෑටි උවදුර මැඩීමට කටයුතු කළ විට ඊළඟ සතුවේ උවදුරේ තත්වය තවත් අඩු වේ. මාරු භුක්තිය පොදු ප්‍රදේශවල උදැල්ලෙන් කොටා, කුඹුරු සකස් කරනවා සේම හරකුන් ගෙන් මඩ කිරීම ද බොහෝ පොදු ක්‍රමයක් වී තිබේ. මී හරකුන් යෙදීමට වියදම් වැඩි වුවත්, උදැල්ලට වඩා වල් පැල මර්ධනයට කාර්යක්ෂම සේම එහි ප්‍රතිඵලය ඊළඟ කාලය තෙක් ද පවතී. මේ තත්වය නිසා තට්ටුමාරු කට්ටිමාරු ගොවියන් මී හරකුන් යොදා ගැනීමට පෙළඹෙනුයේ අඩු වශයෙනි. මෙවැනි ම තර්කයක් පෝර භාවිතය සම්බන්ධයෙන් ද අදාළ වේ. රසායනික පෝර ප්‍රතිලාභය එම සතුවේම ලැබෙන නමුත් මාරු භුක්තිකරුවන් එය කෙරෙහි පෙළඹී ඇත්තේ මඳ වශයෙනි. කෙසේ නමුත් තට්ටුමාරු කට්ටිමාරු ඉඩම් ජලාපවහනය වාරිමාර්ග ක්‍රම හා ඉඩම් මට්ටම් කිරීම ආදිය දුබල තත්වයේ ය. මෙය පෝර භාවිතයට නොපෙළඹවීමට හේතුවකි. ස්ථිරවම අයිතිය තමාගේම වූ මනාසේ නඩත්තු කොට වගා කරන ඉඩම් වලට පෝර භාවිතය වැඩි ප්‍රතිලාභයක් ගෙන දෙන බව පැහැදිලි ය.

වගුව 4.

පොහොර භාවිතය සහ වී අස්වැන්න කෙරේ මාරු භුක්තියේ බලපෑම.
ඉහළ ලේල්වල සහ මහගන්ගොඩ.

මහ 1976/77.

| ගම | ඉහළ ලේල්වල | | මහගන්ගොඩ | | | |
|---|---|---|---|---|---|---|
| භුක්තියේ ස්වභාවය | ඉඩම්හිමි වගා කිරීම | | අඳ භුක්තිය | | ඉඩම්හිමි වගා කිරීම | |
| | මාරු ක්‍රමයට | පුද්ගලික අයිතයට | මාරු ක්‍රමයට | පුද්ගලික අයිතයට | මාරු ක්‍රමයට | පුද්ගලික අයිතයට |
| අක්කර ප්‍රමාණය * | 28.27 | 14.28 | 24.79 | 7.91 | 4.92 | 6.75 |
| වර්ෂයකට යෙදූ රසායනික පොහොර සාමාන්‍ය රාත්තල් ගණන | 128 | 123 | 105 | 146 | 124 | 145 |
| අක්කරයකට සාමාන්‍ය වී අස්වැන්න (බුසල්) | 23.5 | 30.3 | 23.2 | 26.9 | 23.8 | 29.3 |

මූලාශ්‍රය : ප්‍රශ්න මාලාව සාකච්ඡා කළ අවදියේ ගම්වල රැඳී සිටි කාලය තුළ දී තොරතුරු ලබා ගන්නා ලදි. සමහර ගොවියන් සතියකට දෙවරක් සාකච්ඡාවට ලක් විය. මේ වගුව සඳහා තොරතුරු එක් රැස් කිරීමේ විශේෂ හේතුවෙන් අනෙක් ගොවි යන් සම්පූර්ණ සාකච්ඡාවට ලක් වූයේ අස්වැන්න කපා අහුරා ගත් පසුව ය.

* ඉහළ ලේල්වල නියැඳිය, අප වෙනත් කටයුත්තකට තෝරා ගත් නියැඳි කැබලි වේ. මාරු භුක්තිය යටතේ තිබූ ඉඩම් වලින් සමහරක් මෙම නියැඳියට ද ඇතුළු විය. තොරතුරු සපයා ඇති ඉහිරි මාරු භුක්ති සම්බන්ධ ඉඩම් අක්කර ප්‍රමාණය නියැඳිය තෝරා ගත්තේ තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ප්‍රභේදයන් අතුරින් සසම්භාවී ක්‍රමයට ය. අප ගේ දැනීමේ හැටියට තට්ටුමාරු කට්ටිමාරු සහ පුද්ගලිකව අයිති ඉඩම් අතර පසේ නෛසර්ගික සාරත්වය අතින් ස්ථිර වෙනස්කම් එහි දක්නට නැත. මාරු භුක්තිය බොහෝ සේ පොදු වූ ප්‍රධාන කුඹුරු යායේ කොටසක පිහිටි සෑම ඉඩම් කැබැල්ලකම එහි ස්වභාවික තත්වයන් (පස, ජලය සැපයීම, ජලාපවහනය ආදිය) එකිනෙකට සමාන සමජාතීය බව මහගන්ගොඩින් ලබා ගත් තොරතුරුවලින් පැහැදිලිව පෙනේ. මෙම ගම් දෙකෙන් ම ප්‍රමාණාත්මක තොරතුරු සංඛ්‍යාවක් එක් රැස් කරන ලද්දේ අප තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රමය පිළිබඳ විශාල උනන්දුවක් පෙන්වන්නටත් පෙර ය.

තට්ටුමාරු කට්ටිමාරු කුඹුරු කැබලි වලට ඉතාම අඩු පෝර ප්‍රමාණයක් යෙදෙන බවත්, නිෂ්පාදනය වන වී ප්‍රමාණයන් සාමාන්‍ය කුඹුරු ප්‍රමාණය තරමට වඩා අඩුවෙන් බවත් මෙම ගම් දෙකේම ගැමියන් ගේ තර්ක හා විශ්වාස අනුව නිගමනය වේ. වගුව 4 දී ඇති සංඛ්‍යාත්මක තොරතුරු මේ බව සහතික කරයි. ඉහත වී අස්වැන්න පිළිබඳ සංසන්දනාත්මක පිළිවෙළ අනුනෙන් පුද්ගලික අයිතියට ඇති ඉඩම්වල අස්වැන්න අනෙක් ඒවාට වඩා 25% කින් වැඩි ය. පුද්ගලික වගා කරන ඉඩම්වල පෝර භාවිතය සැලකිය යුතු තරමකින් අනෙක්වාට වඩා ඉහළ මට්ටමක ඇති අතර ප්‍රත්‍යෙකයන් එකක පමණය එය මඳ වශයෙන් පහළ මට්ටමක ඇත්තේ. ඉහළ ලේල්වල විවිධ මට්ටමේ[8] භුක්තීන්හි ශ්‍රම යෙදවුම පිළිබඳ තොරතුරු අනුව ද එය අනෙක් ප්‍රතිඵල හා සමාන වේ. තට්ටුමාරු කට්ටිමාරු වගාවන්ට වඩා පුද්ගලික අයිතිය මත ඇති වගාවන්හි බොහෝ මහන්සි වී වැඩ කරති. (වගුව 5) අඳ ගොවිතැන හා පුද්ගලිකව ඉඩම් අයිතිය මත ගොවිතැන් කිරීම අතර, ඉහත කී වෙනස්කම් දක්නට ඇත්තේ සුළු වශයෙනි. පුද්ගලිකව ඉඩම් හිමි අයිතිය මත වගා කරන ඉඩම් කැබලිවල ඉහළ මට්ටමකින් පොර භාවිතය කිරීමේ දී මහන්සියට වඩා ප්‍රතිඵල එයින් කපා ගන්නා විශාල අස්වැන්න ප්‍රමාණයෙන් පැහැදිලි ය.

වගුව 5.

වී වගාවේ ශ්‍රම යෙදවුම කෙරේ මාරු භුක්තියේ බලපෑම
ඉහළ ලේල්වල - මහ 1976/77.

| ඉඩම් භුක්තියේ ස්වභාවය | ඉඩම් හිමි - වගා කිරීම | | අඳ භුක්තිය | |
|---|---|---|---|---|
| | මාරු භුක්තිය | පුද්ගලික භුක්තිය | මාරු භුක්තිය | පුද්ගලික භුක්තිය |
| අක්කර ප්‍රමාණය* | 11.43 | 14.28 | 16.25 | 14.19 |
| අක්කරයකට යොදන ලද මිනිස් පැය ශ්‍රම ප්‍රමාණය | 371 | 383 | 303 | 319 |

මූලාශ්‍ර : වගා කාලය තුළ සතියකට දෙවරක් බැගින් ගොවියන් හමුවීමෙන් දත්ත රැස් කර ගන්නා ලදී.

* වෙනත් මාර්තෘකාවක් යටතේ පර්යේෂණයකට වී බිම් කැබලි සම්බන්ධ ශ්‍රම යෙදවුම් පිළිබඳ එක් කළ තොරතුරු ආශ්‍රයෙනි.

වී වගා ක්‍රම හා අස්වැන්න සම්බන්ධයෙන් බලපාන මාරු භුක්ති හා පුද්ගලිකව අයිති තත්වය යටතේ කෙරෙන කුඹුරු ඉඩම් වගාවේ දී මතු වී ඝනෙන සාධක සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීමට වගුව 4 හා වගුව 5 හි තොරතුරු මගින් උත්සාහ දරා ඇත. මෙම උත්සාහය සම්පූර්ණ යෙන්ම සාර්ථක වී ඇතැයි නිශ්චිත ලෙස පිළිගත නොහැක. තවද, සම්පූර්ණ නියැදි අක්කර ප්‍රමාණයන් ද කුඩා ය. එසේ හෙයින් මේ ප්‍රතිඵල නිශ්චිත යයි සැලකීම ප්‍රඥාගෝචර

නොවේ. කෙසේ වෙතත් අප ගේ ඇතිමේ හැටියට එකී හේතු හා ප්‍රතිඵල කුඹුරු ගොවි කටයුතු හා අස්වැන්න කෙරෙහි මාරු භුක්තියේ බලපෑම පිළිබඳව වූ ප්‍රථම අර්ථවත් ප්‍රමාණාත්මක විභාගයක් සේ පෙන්නුම් කරයි.

කෙසේ වුව ද, අප ගේ දත්ත මගින් හෝ වෙනත් කිසිවක් මගින් වගා ක්‍රම සහ අස්වැන්න සම්බන්ධයෙන් මාරු භුක්ති ක්‍රමය හා පුද්ගලික අයිතිය යටතේ වගා කිරීමේ ක්‍රමය යන දෙක අතර තවත් යම්කිසි වැදගත් වෙනස් කමක් පෙන්වා දීමට අසමත්ව ඇත්තේ වුවද, තවදුරටත් මාරු භුක්තියේ අයහපත් බලපෑම් නිසා එය නිශ්ප්‍රභා කිරීමේ සාධක ගණයට ගත යුතු නොවේ. මාරු භුක්තියේ බලපෑම් එය ක්‍රියාත්මක වන කුඹුරු කැබැල්ල සම්බන්ධයෙන් දක්වන තොරතුරුවලට වඩා යමක් ඇතැයි පෙනේ. පළමු කොටම ඇල මාර්ගයට පහළින් හෝ ඉහළින් පිහිටියත් අනෙකුත් කැබලි කිහිපයකටම බලපාන යාබද පිහිටි සමහර වාරිමාර්ග හා ජලවහන මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට හට්ටුමාරු කට්ටිමාරු පංගු කරුවෝ අසමත් වෙති. එක් සාමාජිකයෙකු ගේ ප්‍රමාද යෙන් අනෙක් සියලු ම දෙනාට අයහපත් බලපෑම් ඇති වෙන එකිනෙක මත රඳා පවත්නා තත්ව යකි, වී වගා කරන්නන් අතර ඇත්තේ. දෙවනුව, මූලික වටිනාකමක් ඇති දෙය නම්, වී ගෙ ගොවිතැනේ ආචාර විධි කෙරේ මාරු භුක්තියෙන් කෙරෙන බලපෑම යි. සෑම කුටුම්භයක්ම තම බිම් කැබැල්ල සම්බන්ධයෙන් ස්වාධීන කළමණාකාරයෙකු වන අතර, මනො විද්‍යාත්මකව ඉතාම සැලකිය යුතු ප්‍රමාණයකින් එකිනෙකා අතර ඔවුනොවුන් ගේ සහයෝගය බලාපොරොත්තුවෙති. වගා කරන කාලය හා වගා ක්‍රමවල ස්වභාවය අනුව ගමින් ගමට වෙනස්කම් තිබුණ ද සමස්ථිය යට අන්තර් ග්‍රාමිය සමගිය ඉහළ තත්වයකින් පවතී. සමහර වගා ක්‍රම හා වගා කරන කාලය පිළිගැනීම හා පවත්වා ගෙන යෑම අප කවුරුත් කරන දේ හා සමාන වේ. ගොවියන් පැහැදිලිවම මේ ගැන දන්නා අතර, උදාහරණයක් වශයෙන් 'X' හෝ 'Y' එසේ කරන විට ඔවුහු ද ගොවිතැන් කටයුතු ඇරඹීමට ආනතියක් දක්වයි. අලුත් වී වර්ග කෙරේ එතරම් උනන්දුවක් නොදක්වන ප්‍රදේශ හෙයින් මාරු භුක්තිය බොහෝ පොදු කුඹුරු කට්ටි කෙරෙහි මෙවැනි අනුකූලතාවයක් (අනුගමනය කිරීම) විශේෂයෙන් ම පොදු ලක්ෂණයකි. මෙසේ නව වී වර්ග භාවිතා නොකරන නිසා භාවිතා කරන වී වර්ගයට යෝග්‍යය ;එනම් නියම වගා කිරීම කාල චක්‍රය සකස් කිර ගැනීම, පොහොර භාවිතය, කෘමි පළිබෝධ වර්ග මර්ධනය, වල් පැලෑටි මර්ධනය ආදියෙහි දී ගොවියා විශේෂයෙන් ම ඔහු ගේ අසල්වැසි ගොවියාට සමීප වෙමින් ස්ථාපිත ගතානුගතික වගා ක්‍රම පිළිවෙත් කෙරේ පහසුවෙන් ම නැඹුරු වේ. එවැනි පරිසරයක වී ගොවිතැනේ ආයෝජන අධෛර්ය කරන කුමන විදියේ භුක්ති ක්‍රමයක් වුවත් ගොවිතැනේ තත්වය හීන කරන ආකාරයේ බලපෑම් ඇති කිරීමට ඉඩ තිබේ. මාරු භුක්තිය, ඕනෑම ආකාරයේ කෘෂිකාර්මික නවීකරණයන් අත් හදා බැලීම් පවා පහළ හෙළීමට මුල් වේ. නවීකරණය වූ ගොවියා යන්නෙන් නව වී වර්ග භාවිතා කරන කෘමි නාශක භාවිතා කරන වල් නාශක භාවිතා කරන රසායනික පොහොර විශාල වශයෙන් භාවිතා කරන පුද්ගලයෙකුම අදහස් නොකරන අතර, නවීකරණීය භාවය යන්නට ඊටත් වඩා පුළුල් පදනමක් ඇත. නොකඩවා කරන අත්හදා බැලීම් සමඟ තමා ගේ කටයුතු නව මාවතකින් කිරීමට ගොවියා මෙහෙය වන මානසික ආකල්පය නවීකරණීය භාවය වශයෙන් හැඳින්විය හැකි ය. නව මාවතක් යනු නව යෙදවුම් පමණක් නොව පැරණි යෙදවුම් හෝ කාර්ය විධි නව්‍යතාවයකින් එක් කර සකස් කර ගැනීම වේ. වගා දින

දර්ශනයේ දින කිහිපයක් ඉදිරියට තබා තම වැඩ කටයුතු අවසන් කිරීම, වගා කාලයේ මධ්‍යයේ දී පමණ දීර්ඝ වශයෙන් ගොයමට වතුර නොබැඳ තබා එය අස්වැන්න කෙරේ බලපාන ආකාරය පරීක්ෂා කිරීම, පොහොර වැඩි වශයෙන් කුඹුරේ එක් කොනක පමණක් එක්කාසු වීමේ ප්‍රතිඵල පරීක්ෂා කිරීම, යූරියා සහ කටු පොහොර වර්ග එක්කාසු කර යොදා ගැනීමේ අත්හදා බැලීම් කිරීම, ආදී කටයුතුවල නියැලුනේ නම් හේ නව්‍යකරණය වූ ගොවියෙකි. නව්‍ය කරණ ගොවියා අළුත් වී වර්ග හා රජයේ නිර්දිෂ්ට වගා ක්‍රම අනෙකක් අයට වඩා ඉක්මණින් ම යොදා ගනී. එසේ ම තම කුඹුරට එයින් වඩාත් යෝග්‍ය ක්‍රමක් දැයි සෙවීම පිණිස අනෙක් අය සමඟ එක් වී අත්හදා බැලීම් වලට පෙළඹෙයි. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය දියුණු කිරීමේ දී පවත්නා ප්‍රයත්නයේ එවැනි ආකල්ප වටිනා ජාතික වස්තුවකි. අළුත් වී වර්ග බෝ කරන්නෝ විශේෂ ප්‍රාදේශීය තත්වයන්ට යෝග්‍ය අළුත් වී වර්ග විශාල ප්‍රමාණ වශයෙන් නිපදවා පිට කරති. දැන් බහුල වී වර්ග අතරින් සුදුසු වර්ගය තෝරා ගැනීමේ කාර්ය ද අපහසු වී ඇති අතර, කෘෂිකර්ම සේවා ව්‍යාප්ති අංශයට ද ඒ ඒ ප්‍රදේශවලට හා ගම්වලට යෝග්‍ය වී වර්ග පුළුල් වශයෙන් සහතික කිරීම අසීරු වී ඇත. මේ නිසා ගොවියන් ම අත්හදා බැලීම් කළයුතුව ඇත. නව්‍යකරණ ගොවියෙකු වීමට නම් පෙනෙන විදියට වාර්ෂිකව දිගටම වගා කර ගෙන යන එකම ඉඩමක් හෝ එසේ කැබලි කිහිපයක් තිබිය යුතු ය. මාරු භුක්ති ඇති ගොවියාට මෙය කිරීමට නොහැකි ය. අවුරුදු පහකට වරක් වගා වාරය එන ගොවියෙකුට අත්හදා බැලීම් නිසියාකාරව කළ නොහැකි ය. ඔහු ගේ වගා වාරය අතර තුර කාල යේදී ලබා ගත හැකි වී වර්ග, පොහොර මිශ්‍රණ, යෙදවුම් හා නිමැවුම් මිළ මට්ටම් ආදිය සෑහෙන තරමකින් වෙනස් විය හැකි හෙයින් සවිර සසඳා බැලීමක් කළ හැකි නොවේ.

වී වගාවේ ආචාර විධි සම්බන්ධයෙන් තට්ටුමාරු කට්ටිමාරු භුක්තියෙන් ඇති වන අනතුරු දායක බලපෑම් පරීක්ෂණයකට ලක් කළ නොහැකි වීම අභාග්‍යයකි. ක්ෂේත්‍රයේ විෂයාත්මක අත්දැකීම් තුළින් එකී අදහස් මතු විනි. ශ්‍රී ලංකාවේ වී වගා කාර්ය සිද්ධිවල ප්‍රාදේශික රටා මගින් ද සමහර අදහස් තහවුරු විය. දිවයිනේ මාරු භුක්තිය බහුල ප්‍රදේශවල තම ආදායම් වැඩි කර ගැනීමේ මාධ්‍යයක් වශයෙන් වී වගාවට වැඩි ආයෝජනයක් නොකරන්නේ එකී ප්‍රදේශවාසීන්ට වෙළඳාම හා රජයේ අංශයේ රැකියා මගිනුත් ආදායම් මාර්ග පාදා ගත හැකි වීම යි. කෙසේ හෝ තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රමයේ පැවැත්ම නිසා උද්ගත අඩු තරමින් එක් කාර්ය කොටසක් හෝ පැහැදිලි අතර, ඒ හා බැඳී ඇති තාවකාලික සම්බන්ධතාවයන් ගේ අවුල් බේරුම් කිරීමේ ක්‍රම සෙවීම පවා අසීරු ය.

වී වගාවේ උනන්දුව මාරු භුක්තිය විසින් මන්දෝත්සාහි කරන බව විය හැක්කකි. වී වගා වට වඩා වෙනත් ප්‍රධාන ආදායම් මාර්ග තිබීම නිසා මාරු භුක්තිය යටතේ වී වගාවේ නොයෙදීමට හේතු වේ. මාරු භුක්තිය වී වගාවේ අස්වැන්න අඩු කිරීමට වඩා පුළුල් ලෙස වෙනත් බොහෝ දෑ කෙරේ මුල් වන බව පෙනේ. පුද්ගලික භුක්තිය තෙක් එය වෙනස් වීමට සැල සීම මගින් වී ගොවිතැනේ නිෂ්පාදනය වැඩි වෙනු ඇත.

## 11. කුඹුරු ඉඩම් අර්බුද (ඉඩම් ආරවුල් සහ ගැටළු).

වගා කාර්ය හා අස්වැන්න කෙරේ ඇති කෙරෙන හානි කර බලපෑම්වලට දෙවනු වශයෙන් මාරු භුක්තිය හේතුවෙන් ඇති වන ආරවුල් හා ගැටුම් ද ගැමියන් මෙකී භුක්ති ක්‍රමයට අසතුටු වන්නේ මන්ද යන්නට හේතු වේ. (9 වැනි කොටස). බොහෝ මාරු භුක්ති සාහිත්‍යයන් මෙකී භුක්ති ක්‍රමය අවුල් හා ගැටුම් වලට හේතු වන බට පෙන්වා ඇතත්, හැම නිරීක්ෂකයෙක්ම එයට එකඟ වී නැත. ගනේවත්ත පවසන්නේ මාරු භුක්ති අවිනිශ්චිතතාවලට හා ගැටුම්වලට හේතු වන නමුත්, මාරු භුක්තියෙන් ඉඩම් කැබලි වීම හා ඉඩම් නොමැති භාවය යන අංශවලට විසඳුම් දී ඇති නිසා තට්ටුමාරු කට්ටිමාරු ක්‍රමය අවුල් හා අවිනිශ්චිතතාවයන් අඩු කිරීමට ආනති යක් දක්වන බව ය. (පිටුව 9). තට්ටුමාරු කට්ටිමාරු පංගු අයිතියට කෙලින් ම සම්බන්ධ කිසිම අවුල් වියවුල් හෝ ගැටුම් තත්වයක් ඔහු සඳහන් නොකරයි.

වගුව 6.

නියැඳි ග්‍රාමයන් ගේ මාරු භුක්තියේ සංකීර්ණතාවයේ මට්ටම.

| ගම | මාරු භුක්තිය යටතේ අක් කර ප්‍රමාණය | මාරු භුක්තිය යටතේ ඇති කුඹුරු ඉඩම් වල ප්‍රතිශතය | මාරු භුක්තිය යටතේ ඇති ඉඩම් වලින් ඒ ඒ භුක්ති ප්‍රතිශතය | | | 10 කට අධික උරුමකරු ප්‍රමාණයක් වගා කරන ප්‍රත්‍යෙක යන්ගේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | | | තනි තට්ටු මාරු % | තනි කට්ටු මාරු % | සම්බන්ධ තට්ටුමාරු/ කට්ටිමාරු% | |
| මැදගම[1] | 18.9 | 100 | – | – | 100 | 100 |
| මහගම[2] | 187.0 | 68 | 1 | 11 | 89 | 98 |
| ඉහළ ලේල්වල[3] | 123.4+ | 40+ | 6* | 61* | 33* | 20* |
| උන්දුරුව[4] | 10.8 | 15 | 58 | 42 | – | – |
| මහගන්ගොඩ[5] | 15.9 | 7 | 21 | – | 79 | 11 |

1. ඔබේසේකර 2. වීරවර්ධන සහ කොලොන්නගේ 3. අප ගේ විෂය අධ්‍යයනය
4. ගනේවත්ත 5. අප ගේ විෂය අධ්‍යයනය

* දත්තයන් ගමේ ඉඩම් වලින් 1/2 කටත් වඩා අයිති වූ මාරු භුක්තිය යටතේ ඇති නියැඳි ප්‍රත්‍යෙකයන් ගෙනි.

නියැඳි ග්‍රාමයන් ගේ තට්ටුමාරු කට්ටිමාරු භුක්තීන් ගේ සංකීර්ණත්වයේ මට්ටම පිළිබඳව වූ 6 වැනි වගුවේ තොරතුරු වලින් මාරු භුක්තිය හා එහි අවුල් හා ගැටුම් පිළිබඳ අදහස්වල ප්‍රති විරුද්ධත්වයන් (අපසරණයන්) කෙරෙහි විය හැකි හේතු නිගමනය වේ. සංකීර්ණත්වයේ ප්‍රමාණය මැනිය හැකි ශුද්ධ මිම්මක් නැතත් 6 වැනි වගුවේ අවසාන (කොටස්) තීරු දෙකෙන් එවැනි

ප්‍රත්‍යක්ෂ පිට් කිහිපයකින් දෙකක් ගෙන හැර පා ඇත. ඒවා පිළිවෙළින් සම්බන්ධ තට්ටුමාරු කට්ටිමාරු හුක්තිය යටතේ ඇති ප්‍රමාණය හා අයිති වගාකරුවන් 10 කට වැඩි කොටසක් අයිතිය හුක්ති විඳින ප්‍රත්‍යෙකයන් ගේ ප්‍රමාණය ද වේ. අදාළ ගම් තීරුවලට වෙන් කිරීම සියළු ම ප්‍රත්‍යෙකයන් වල සමාන වන අතර, තීරුවලට බෙදා වෙන් කර ඇති මාරු හුක්තිය යටතේ ඇති ගමේ සම්පූර්ණ කුඹුරු ප්‍රමාණයට ද අනුකූල වේ. නමුත් ප්‍රත්‍යක්ෂ ලෙස මේ ගම් ප්‍රදේශ පගේ ම හුක්ති ක්‍රමයේ චර්යාව අතර වෙනස්කම් ඇත. සමහර නිරීක්ෂකයෝ එක ගමක පමණක් දක්වන ලක්ෂණ ඇසුරෙන් හුක්ති ක්‍රමයේ සංකීර්ණත්වය නිගමනය කෙරේ. මේ අනුව ඒ නිරීක්ෂණ මගින් වෙනස්ව නිගමන වලට එළඹීම පුදුමයට හේතු නොවේ. ගැටුම් පිළිබඳ ප්‍රශ්නයට අදාළව මෙම අදහස 7 වගුවේ දී මනාව පැහැදිලි කර පෙන්වයි. නියැදි ග්‍රාම ප්‍රදේශ සියල්ලෙහිම ගැටුම් හා අදාළ කාරිය සිද්ධි පිළිබඳ සම්පූර්ණ සංසන්දනාත්මක තොරතුරු අප සතුව නැතත් ඇති තොරතුරු ස්වල්පය අනුව බොහෝ අවුල් වියවුල් හා ගැටුම් හුක්ති ක්‍රමයේ සංකීර්ණත්වයේ වැඩිමත් සමඟ ම වැඩි වී ගිය බව පෙන්වා දීමට හේතු සාධක ඇත.

වගුව 7.

නියැදි ග්‍රාමයන් ගේ මාරු හුක්තියේ සංකීර්ණත්වය හා විරුද්ධ වාදිකම් (අවුල් සහ ගැටුම්).

| නියැදි ග්‍රාම ප්‍රදේශයේ මාරු හුක්තියේ සංකීර්ණත්වයේ ප්‍රමාණය – පංගු උරුමකරුවන් ගෙන් 10+ ප්‍රමාණයක් නියැලී සිටින ප්‍රත්‍යෙකයන් ගේ ප්‍රතිශතයට අනුව නිගමනය කෙරේ. | විරුද්ධවාදිකම් (අවුල් හා ගැටළු කාරිය ආදිය) පිළිබඳ ලබා ගත හැකි තොරතුරු. |
| --- | --- |
| 1. මැදගම (බොහෝ සංකීර්ණ) | සංඛ්‍යා නැතත්, තට්ටුමාරු කට්ටිමාරු හුක්ති බොහොම යක්ම අවුල් හා ගැටුම් වලින් බහුල ය. |
| 2. මහගම (බොහෝ සංකීර්ණ) | අවුල් බොහෝ පොදු ය. 1970/71 වර්ෂයේ ගොවි කාරක සභාව වාර්තා අනුව තට්ටුමාරු කට්ටි මාරු ඉඩම් වලින් සෑම අක්කර 1 1/2 කටම එක් ගැටළුවක් බැගින් වාර්තා වී ඇත. |
| 3. ඉහළ ලේල්වල (මධ්‍යස්ථ) | සාකච්ඡාවට ලක් වූ පංගු උරුවකරුවන් ගෙන් 37% පැවසුවේ අවුල් ගැටළු හුක්ති ක්‍රමයේ අවාසිදායක එක් තත්වයක් බව ය. |

| | | |
|---|---|---|
| 4. | මහගන්ගොඩ (සාපේක්ෂව සරල) | සාකච්ඡා කළ උරුමකරුවන් ගෙන් 7% ක් කීවේ ගැටළු හා අවුල් භුක්ති ක්‍රමයේ අවාසිදායක ප්‍රතිඵල බව ය. |
| 5. | උඩුරුව (සරල) | ගැටළු සඳහන් වී නැත. මාරු භුක්තිය සහනයට හේතුවක් බව ප්‍රකාශ වී ඇත. |

මෙම භුක්ති ක්‍රම සංකීර්ණත්වය හා පංගු අවුල් පිළිබඳ සහසම්බන්ධය බලාපොරොත්තු වූවා සේ ය. අප ගේ දැනීමේ හැටියට මාරු භුක්ති විස්තර සවිස්තරව කොහෙත්ම ලිය වී නැත. සංකීර්ණත්වය කොතෙක් ද යන්න පංගු උරුමකරුවන් එකිනෙකාට පැටළුණු අවුල් වියවුල් වලින් වෙලී සිටීම, ඒ උරුම පිළිබඳ බොහෝ සවිස්තර කරුණු මතකයේ රඳවා ගැනීම හා ඒවා මතකයෙන් ඈත් වීමට හෝ අහෝසි වීමට දීර්ඝ කාල චක්‍රයක් ගත වේ ද යන්න පිළිබඳව කල්පනා කිරීමෙන් පැහැදිලි වේ. සරල භුක්ති ප්‍රභේදයක දී පවා මේ සිදු විය හැකි ය. සරල භුක්ති ක්‍රමයන්වල ද ප්‍රතිපත්තිමය වශයෙන් වුව ද, උරුම අයිතීන් නිරවුල් නැත. බොහෝ අයිතීන් පිළිබඳ අවිනිශ්චිතතාවයන් පැන නැඟුනුයේ කසාද උරුමය හා පරම්පරික උරුමය පිළිබඳ නීති රීතිවලට අනුව ය. යටත් විජිත යුගයට පෙර උරුම භුක්ති පිළිබඳ දේශීය සම්ප්‍රදාය ප්‍රාදේශිකව වෙනස් විය. ලන්දේසීන් ගේ රෝම ලන්දේසි නීතියත්, බ්‍රිතාන්‍යයන් ගේ ඇංගලියානු නීතියත් හඳුන්වා දීමෙන් පසු භුක්ති උරුමය පිළිබඳ ස්ත්‍රී උරුම කරුවන් ගේ උරුමය ස්ථිර විය.[19] මෙහි ප්‍රතිඵලය හා බලපෑම අද දක්වාම තිබේ. පරම්පරා දෙක හෝ තුනකට ඉහත දී මළ අයෙකු ගේ දේපලක උරුමයේ වටිනාකම රඳා පවත්නේ මුල සිට උරුම රීති ප්‍රකාරව උරුමය පැවැත්ම පැහැදිලිව නොකඩවා පෙළ ගස්වා ගැනීමෙනි. මෙවැනි උරුම ක්‍රම භුක්ති අවුල්වලට බොහෝ සේ හේතු වේ.

තට්ටුමාරු කට්ටිමාරු උරුම පිළිබඳ අවුල් හා මතභේද පැන නඟින්නේ ඉහතින් කියන ලද පරිදි උරුමය පිළිබඳ මතකය අහෝසි වීමෙන් හෝ අව්‍යාජ උරුම පටහැනිකම් හෝ මතට පමණක් නොවේ. අනෙක් අය ගේ අයිතිය බලයෙන් අල්ලා ගැනීමට හිතා මතා කරනු ලබන පොරකෑම් ද හේතු වේ. කොටස් පීළ දී ගැනීමෙන් තම අයිතිය බලයෙන් නීතියට පිටින් අනෙක් කොටස් මතට ද ව්‍යාප්ත කිරීමට උත්සාහ කරන පිටගම්වැසියන් ගෙන් පරිදිම දිගු කලක් පංගු භුක්ති විඳ ගෙන ආ අයවළුන් ගෙන් එවැනි අවුල් ඇති වේ. මෙම කලහකරුවෝ නොයෙක් උපක්‍රම පාවිච්චි කරති. ශාරීරික හිංසා හා ජීවිතයට තර්ජනය පවා කරති. මොවුහු තම වගා මුරයෙන් පිට හෝ නියර කඩා කුඹුරු ලොකු කිරීමේන් හෝ බලය අල්ලා ගැනීමට වෙහෙසති. මෙවැනි කලහ කරුවන්ට කෘෂිකාර්මික විනිශ්චය සභා, සාම මණ්ඩල, පලදා වර්ධන කමිටු හෝ ගොවි කාරක සභා මඟින් වෙනත් දේ හෝ දේශපාලන බලපෑම් හෝ කළ හැකි නම් එයින් ද තම විරුද්ධකරුට හිරිහැර කිරීමට පෙළඹෙති. අන්තිමට උසාවි වලට පවා යති. මෙහි දී බලපුළුවන්කාර පක්ෂය හිතුරු පක්ෂයට විරුද්ධව නොයෙක් උපාය මාර්ග අනුගමනය කරති. නඩු තීන්දුවක් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් නොව විරුද්ධ කරුට හිරිහැර පැමිණවීමේ අභිප්‍රායෙන් ඔවුහු නඩු මඟට බසිති. දුප්පත් එදිරිකරුට නීති උපදෙස්වලට හා උසාවි ගාස්තු වශයෙන් අධික මුදලක් වැය කිරි මට සිදු වන හේසින් ඔහු එකී වියදම් නොකර සිටීමෙන් කෙලින් ම පරාජය පිළිගනී. අනෙක් උපක්‍රමය නම් තට්ටුමාරු

කට්ටිමාරු බෙදා ගැනීමට පසුබිම සකස් කර ගැනීමට පටලවා ගැනීම පිණිස අවුල් පිළිබඳව නීති මඟට බැසීමේ මුවාවෙන් එවැනි දෙයකට ඉඩකඩ සලසා ගැනීම යි. 1951 ට පෙර තිබුණ, 1861 ඉඩම් බෙදීමේ ආඥා පණත යටතේ ඕනෑම උරුමකරුවෙකුට ඉඩම් බෙදා ගැනීමට නීති මගින් කටයුතු කළ හැකි වූ අතර, ගාස්තුව ඒ ඒ උරුමකරු අතර ඔහු ගේ පංගුවේ ප්‍රමාණයට බෙදනු ලැබේ[20]. ඔබේසේකරට අනුව (පිටු 178) මේ ආඥා පණතට අනුව බොහෝ මාරු භුක්ති ඉඩම් බෙදා ගන්නා ලදී. 1951 ඉඩම් බෙදුම් පණතින් විශාල සහනයක් ඇති විය. (ඉඩම් බෙදා ගැනීම සඳහා විශාල නැමියාවක් ඇති විය) ඒ අනුව මුළු ඉඩම් යායම බෙදීම අවශ්‍ය නොවීය. අනෙක් උරුම කරුවන් පොදු භුක්තියට කැමැති වුවත් එක් උරුමකරුවෙකුට අයිති කොටස බෙදා වෙන් කර ගත හැකි විය[21]. ඔබේසේකර කියන්නේ මෙම නීතිමය ප්‍රතිසංස්කරණයේ ප්‍රායෝගිකව වැදගත්කමක් දක්නට නැති බව යි. (පිටු 181–182). නමුත් නීතියේ ඒ ඒ විධි විධානයන්ට අනුව පොහොසත් උරුමකරු වෙකුට නීති මඟට බැසීමෙන් අනෙක් පංගු කරුවන්ට කරදර හා වැඩි බර පැටවීමෙන් ඔවුන් ද බෙදුම්කාරයාට පොළඹවා ගැනීමට හැකියාව තිබීම සැලකිය යුත්තකි.

නීතියෙන් හෝ එයින් පිට අනෙක් පංගු උරුමකරුවන්ට අවහිරතා කරමින් ඉඩම් මිල දී ගන්නවුන් හට්ටුමාරු කට්ටිමාරු පංගු ගැනීමට මුදල වැය කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව සැලකිය යුතු විස්තරයක් ඔබේසේකර දෙයි (පරිච්ඡේද 7). පළමුව ඉඩම් උරුමකරුවන් කවුරු දැයි සොයා බලා, ඔවුන් බැහැර ගොස් ඇත්නම්, ගැහැණු උදවිය විවාහ වී ගොස් ඇත්නම්, සමහර විට ඔවුන් තම අයිතිය ගැන නොදැන සිටිනා අවස්ථාවල දී පවා ඔවුන් හමු වී මුදල් ගෙගෙවීමෙන් පංගු කිහිපයක් උරුම කොට ගෙන අන්තිමට එකම අව්‍යාජ උරුමකරු තමා සේ පෙනී සිටීම එවැන්නන් ගේ පොදු උපායකි. වීරවර්ධන හා කොලොන්නහේ (පිටු 54 සහ 64–65) යන දෙදෙනා එම වර්ගයේ ම සංසිද්ධීන් වාර්තා කරයි. අපට ද ඉහළ ලේල්වල දී එයටම සමාන තොරතුරු ලැබී ඇත. මේ අනුව භුක්ති ක්‍රමය බොහෝ සංකීර්ණ වූ විෂය අධ්‍යයන තුනක පමණ එවැනි තත්වයන් පැහැදිලිව දක්නට ඇත්තේ. මේ සංකීර්ණතාවය එවැනි කොල්ලකෑම්වලට අනිවාර්ය වී පසුබිමක් වෙයි.

පුද්ගලික අවුල් හා බේද පිළිබඳ මනා විග්‍රහයක් ඔබේසේකර ගේ ග්‍රන්ථයේ අඩංගු වන හෙයින් උදාහරණ වශයෙන් ඒවා නැවත සඳහන් කිරීම අනවශ්‍ය ය. ඒ නිසා ඒ සියළු ම විස්තර කොකොටස් වෙන් කර ගනිමින් අවුල් වියවුල් සහගත බව හා ගැටුම් පිළිබඳව නිදර්ශනාත්මකව පෙන්වා දෙමු. මේ බොහෝ භුක්ති ගැටළු ප්‍රභේදයන් හේතු සාධක ඇතිව අවුල් වීමෙන් නැත්නම් අවුල හෝ අව්‍යාජ අවිනිශ්චිතතාවය නිසා හෝ ඒ කරුණු දෙකම මිශ්‍ර වී නිර්මාණය වූන හෝ මුල් හේතු වලින් යුක්ත ය.

(1) ගැටුම්වලට හේතු වන මූලික කාරණය, උරුමකරුවන් තම අයිතියට වඩා ඉඩම් ප්‍රමාණයක් වගා කිරීමට උත්සාහ කිරීම යි. ඔවුහු තම මුරයට ඉක්මවා වගා කිරීමට හෝ තම මුරය පැමිණීමට පෙර වගා කිරීමට උත්සාහ කිරීම හෝ අයිති බිම් ප්‍රමාණයට වඩා වගා කිරීමට හෝ පෙළඹෙති. මේ සඳහා නියර වෙනස් කිරීම ආදී කටයුතු ද

කෙරේ. එක් පුද්ගලයෙකු ඉඩම විශාල කිරීමට උත්සාහ කිරීම තවත් අයිතිකරුවෙකුට අඩු වන බිම් ප්‍රමාණය නැවත ලබා ගැනීමට සටන් කිරීමට හේතු වේ.

(2) ඉඩම් භුක්තියේ සංකීර්ණත්වයෙන් ප්‍රයෝජනයට ගැනීමට හෝ නියම පංගු කරුවෙකු අසනීප වන, දුර්වල වන හෝ තාවකාලිකව නොපැමිණෙන අවස්ථා හෝ ප්‍රයෝජනයට ගැනීමෙන් භුක්තිය තම අතට ගැනීමට උත්සාහ කරන පිටගන්කාරයන් ගේ ක්‍රියා ද අවුල් වලට හේතු වේ. මෙම බලපුළුවන්කාර එවැන්නකු එක් වරක් එසේ භුක්ති විඳ ඊළඟ මුරයේ ද එම අයිතිය මත භුක්ති විඳියි. භුක්ති පිළිබඳ ලිඛිත වාර්තා නොමැතිකම මෙවැනි දෑ වලට තදබල පදනමක් වී ඇත.

(3) ඉහතින් විස්තර කරන ලද පිටගන්කාරයන් ගේ බලහත්කාරකම් හා අයිතිය නැති වී ගිය උරුමකරුවන් නැති වූ අයිතිය නැවත ලබා ගැනීමට දරන උත්සාහයන් අතර, ප්‍රායෝගික පැහැදිලි වෙනසක් හඳුනා ගැනීමට අපහසු ය. මිනිසුන් ගේ පංගු උරුම අහෝසි වී යාමට බොහෝ හේතු තිබේ. බොහෝ අවස්ථාවල තම උපන් ගම හැර ඈත පළාතක ජීවත් වන විට මෙවැනි දෑ සිදු වේ. ඔවුන් ගමේ ජීවත් වන කාලයේ දී ද වෙනත් ආදායම් මාර්ග තිබූ හෙයින් ගොවිතැනට දැක්වූයේ මඳ සැලකිල්ලකි. ඔවුන් තම කුඹුරු අඳයට දී තිබුණා විය හැකි යි. මේ අයුරින් කාලයක් ගත වන විට වගා කරන්නා ගේ අයිතිය තහවුරු වේ.

සමහර විට අඳ ගොවියන් ආදායමෙන් බිම් කුලිය වශයෙන් කිසියම් ප්‍රමාණයක් අළුත් අවුරුදු උත්සවය සඳහා නගරයේ සිටින ඉඩම් හිමියාට ගෙන ගොස් දීමට පුරුදුව සිටි යහ. කාලයක් යාමේ දී ගමන් වියදම් අධික වූ විට මේ සිරිත් අතහැර දැමීමට සිදු විය. මෙසේ කිසිවක් නොගෙවා දිගු කලක් වගා කිරීම නිසා වගා කරන්නා ගේ අයිතිය තහවුරු වේ. මුල් අයිතිකරු විශ්‍රාම ගැනීමකින් පසු ගමට පැමිණ ඉඩම වගා කිරීමට හෝ විකුණා දැමීමට සූදානම් වන විට වශ කරන්නාගේ විරුද්ධත්වය මතු වේ. මුල් උරුමකරු මිය ගොස් ඇති බැවින් මීට පෙර ගමට කලාතුරකින් පමණක් පැමිණ ඇති ඔහු ගේ කිසියම් උරුමකරුවෙකු විසින් අයිතිය ඉදිරිපත් කිරීමේ දී මෙවැනි විරුද්ධතාවයන් බොහෝ සේ මතු වේ.

උරුමකරුවන් ඔවුන් අතර අසමගිතාවයන් හා නොඑකඟතාවයන් ඇති කර ගනී. ස්ත්‍රී උරුමය පිළිබඳ විවිධ ධර්මතා පැවතීම එයට හේතු වයි. දෑවැද්දක් දුන් විවාහක ස්ත්‍රියකට තම පවුල් උරුමය පිළිබඳ ස්වජාතික සම්ප්‍රදාය හා මෙරටෙහි ස්ථාපිත පිට රට නීති රීති අතර වෙනසක් තිබේ. ස්ත්‍රී උරුමකරුවෙකු විවාහයෙන් පසු ගමේ ජීවත් වනුයේ පිරිමි උරුමකරුවන්ට වඩා සාපේක්ෂව අඩු වශයෙනි. පවුලේ පිරිමි සාමාජිකයන් අතරේ භුක්ති විඳි තට්ටුමාරු කට්ටිමාරු කුඹුරු ඉඩම්වලට විවාහය නිසා පිට ගමක පදිංචියට ගිය විවාහක සහෝදරියක ගේ දරුවන් ඔවුන් ගේ පංගු උරුමය සඳහා ඉදිරිපත් වීමට පුළුවනි.

තට්ටුමාරු කට්ටිමාරු පංගු සඳහා උරුමකරුවන් ගේ සංඛ්‍යාව සම්බන්ධයෙන් විශේෂයෙන් සංකීර්ණ ප්‍රභේදයන්හි නිත්‍ය ප්‍රමාණයක් නැති අතර, සම්බන්ධ වූ ප්‍රතිලාභී ස්වභාවය අනුව එය වෙනස් විය හැකි ය. යම් යම් ප්‍රතිලාභ ලබා ගැනීමේ ආශාවෙන් බොහෝ අය නිසැක උරුමයන් ඉදිරිපත් කරති. වීරවර්ධන හා කොලොන්නගේ ඔවුන් ගේ මහගම විශිෂ්ට අධ්‍යයනයෙන් උරුමයට ලියා පදිංචි වූ 4045 අතුරින් 1077 ඉදිරිපත් කිරීම් කළ අය කිසි විට කුඹුර වගා කොට හෝ අස්වැන්න පංගුවක් අත්පත් කර ගෙන හෝ නැති බව පෙන්වා දී ඇත. (පිටු 95).

(4) නැති වූ උරුමය පිළිබඳ අවුල් වලින් වැඩි කොටසක් අයිතිය විකුණූ ඒවාට සම්බන්ධ වේ. ඔබේසේකර (පිටු 174) මීළ දී ගත් අය එසේ කොට ඇත්තේ උරුමකරුවන් ගේ නීතිමය අයිතිය ඔවුන්ට පෙන්වා දීමෙනි. මෙවැනි අවස්ථාවල වගා කරන අය පිටගම්වැසියන්ට එකී භුක්ති අහෝසි වී ගිය ඉඩම්වල භුක්තිය නොදී විරුද්ධව කටයුතු කරති.

(5) කාල චක්‍රය බොහෝ සේ දීර්ඝ වූ විට උරුමකරුවන්ට විශේෂයෙන් ම ඔවුන් ගේ වාරය අමතක වේ. බොහෝ කල් පසු වී පැමිණි විට පිළිවෙළ ද අමතක වේ. මෙහි දී තම නැති වී ගිය මුරය එම වර්ෂයේ ම හෝ ඊළඟ වර්ෂයේ ලබා ගැනීමට උත්සාහ කිරීමෙන් අනෙක් උරුමකරුවන් සමඟ ගැටුම් ඇති වෙනවා පමණක් නොව, තම කොටස් වෙන් කොට නියර වැටි නැවත ඇඳීමට ද පෙළඹේ.

(6) ඉහළ ලේල්වල මෙන් තට්ටුමාරු කට්ටිමාරු කුඹුරු සම්බන්ධව කලාවිට නම් ගොඩ ඉඩම් කැබැල්ලක් පිහිටා ඇත. මෙහි එළවළු වර්ග වගා කෙරේ. මෙම 'කලාවිට' හිමියන් කුඹුරුවලට පාඩු වන සේ තම ගොඩ බිම් විශාල කරති. මෙසේ කුඹුර ප්‍රමාණයෙන් කුඩා වීම නිසා කුඹුර වගා කරන්නන් අතරේ තම තම නියම උරුම බිම් ප්‍රමාණය පිළිබඳව අවුල් ඇති වීමට ඉඩ තිබේ.

(7) තනි කට්ටුමාරු හා සම්බන්ධ තට්ටුමාරු කට්ටිමාරු ප්‍රභේද උරුමකරුවන් අතර කට්ටිමාරු ක්‍රමය අවසාන කරමින් සරු සාර බිම් කොටස් දිගටම වගා කිරීමට පෙළඹීම නිසා බොහෝ අවුල් ඇති වේ. උරුමකරුවන් එක් කණ්ඩායමක් හොඳම ඉඩම් කැබැල්ල තෝරා ගෙන අනෙක් උරුමකරුවන්ට පාඩු වන අන්දමින් දිගටම වගා කර ගෙන යෑමට උත්සාහ කරති.

(8) ප්‍රතිපත්තියක් වශයෙන් සියලු ම පංගුකරුවන් ඉඩම බෙදා වෙන් කිරීමට කැමැති වුව ද, ඉඩම බෙදීමේ දී ඒ ඒ පංගුව විශේෂයෙන් ලබා ගැනීම සඳහා අවුල් ඇති කර ගනී. මෙයට හේතුව විවිධ බිම් කැබලි සරු සාරත්වයෙන් එකිනෙකට වෙනස් වීම යි. ඉඩම බෙදීමට මුල්ව අදහස් ඉදිරිපත් කරන අය මාරු භුක්ති ඉඩමේ සාරවත්ම කුඹුරු කැබැල්ල බෙදා ගැනීමට පෙළඹෙන බව අප ගේ ක්ෂේත්‍රීය කාර්ය වලින් පැහැදිලි වී ඇත. ඉඩම බෙදීමට මුල දී අදහස් ඉදිරිපත් කළ අය අනෙක් උරුමකරුවන් ගේ කැමැත්ත ලබා ගත්තත් ඔහු එහි මූලිකයා ලෙස කටයුතු කරයි. නීතිමය බලය ලබා ගැනීම සඳහා උසාවියට ඉදිරිපත් කිරීමේ

දී නීතමය වියදම් සියල්ලම ඔහු විසින් දරන අතර, අනෙක් උරුමකරුවන් ඔවුන් ගේ උරුම ප්‍රමාණයට සරිලන කොටස පෙර කී මුල් වූ පුද්ගලයාට ගෙවිය යුතු ය. මේ අනුව නඩු තීන්දු වෙන් පසු ඉඩම බෙදීමේ කටයුතුවල දී එක්කෝ තමාට අයිති ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් නැත්නම් ඉතාම හොඳ කුඹුරු කැබැල්ල හෝ ලබා ගැනීමට උත්සාහයක් ඔහු තුළ තිබිය යුතු බව අවබෝධ කර ගැනීම අපහසු නොවේ.

මෙසේ තට්ටුමාරු කට්ටිමාරු භුක්තිය පිළිබඳ අර්ථය හා ගැටුම් පිළිබඳ ගැටලු බොහොමයක් පුළුල් ලෙස පෙළ ගැසී ඇත. බොහෝ භුක්ති ප්‍රත්‍යක්ෂ පැහැදිලි ආරවුල් තත්වයක් නොමැතියව වගා කෙරුණත් පොදු වශයෙන් පැහැදිලිව කරුණක් නම් භුක්ති ක්‍රම සහනකාරී තත්වයකට වඩා ආරවුල් ගත තත්වයකට සාමාන්‍ය වශයෙන් මෙහෙයැ වී ඇති බව ය. කෙසේ වුව ද, මාරු භුක්ති ක්‍රම ග්‍රාමීය අසමගිය හා අවුල් වියවුල් කෙරෙහි ඉතාම ප්‍රබල ලෙස බලපාන බව කිව හැක.

12. අහෝසියද? ප්‍රතිසංස්කරණය ද? මැදිහත් නොවීම ද?

මාරු භුක්තියේ හානි කර ප්‍රතිඵල අඩු කිරීම පිණිස රජය විසින් ගත හැකි පියවරයන් කිහිපයකි. වීරවර්ධන සහ කොලොන්නගේ අනුව යමින් (පිටු 84-85) පහසුව තකා එවැනි පියවරයන් ප්‍රධාන කොටස් කිහිපයකට සාරාංශ කොට වෙන් කළ හැකි ය.

(1) සියලු ම යායන් ස්ථිරව වෙන් වූ ලියැදි (කැබලි) වලට බෙදා ඒවා වර්තමාන උරුම කරුවන්/වගා කරන්නන් සියල්ලටම හෝ කොටසකට ඔවුන් ගේ උරුම ප්‍රමාණ අනුව බෙදා දීම.

(2) මෙය ඉහත (1) හා සම්බන්ධ උපක්‍රමයක් වශයෙන් එක්තරා ක්‍රමයක ඉඩම් ඒකාබද්ධ කිරීමේ ක්‍රමයකි. විශාල කුඹුරු ඉඩම් කොටසක් තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ඉඩම් වන බොහෝ වගාකරුවන්ට එවැනි භුක්ති ප්‍රත්‍යක්ෂ කිහිපයක උරුමකම් තිබෙන ගමක, එම සියලු ම තට්ටුමාරු කට්ටිමාරු ඒකක ඒකාබද්ධ කිරීමේ ශක්‍යතාවයක් සේම හැකියාවක් ද ඇත. එසේ නැත්නම් තට්ටුමාරු කට්ටිමාරු යායවල් බෙදීම අනෙක් සියලු ම කුඹුරු ඉඩම් ඒකාබද්ධ කිරීමේ වැඩ පිළිවෙළ හා එකට සිදු වන කොටසක් සේ විය යුතු ය.

(3) දැනට උරුම අයිතිය ඒ ආකාරයට පවත්වා ගෙන යමින් වගා කිරීමේ දී සියලු ම යාය වල් එක බිම් කට්ටියක් සේ සළකා සියලු ම උරුමකරුවන් වගා වියදම් සමහර විට ශ්‍රමය පවා යොදවමින් අස්වැන්න බෙදා ගැනීම යෙදවීම හා ලාභය යායෙන් තම තමාට අයිති ප්‍රමාණය අනුව විය යුතු ය.

(4) ඉහත (3) හා සමාන ලෙස සියලු ම පංගු කරුවන් ගේ එකඟත්වයෙන් යාය ස්ථිර

බදුකරුවෙකුට වගා කිරීමට පවරා අස්වැන්නෙන් ලැබෙන බිම් කුලිය ඒ ඒ පංගු උරුම කරුවන්ට අයිති ප්‍රමාණය ලෙස බෙදා ගැනීම.

(5) අවසාන වශයෙන් සියළු ම තට්ටුමාරු කට්ටිමාරු ඉඩම් අත්පත් කර ගෙන අයිතිකරුවන් වන්ට වන්දි ගෙවා ඉඩම් කැබලි වලට ස්ථිරවම බෙදා ඉඩම් නැති අයට හෝ වෙනත් වර්ගයක පුද්ගලයන් අතර බෙදා දීම.

පොදු වශයෙන් මෙම උපක්‍රම ජගේ ප්‍රතිඵලයක් වශයෙන් මාරු භුක්ති ක්‍රමය අවසාන කරමින් ස්ථිර වගා කරන්නෙකු (හෝ වගා කණ්ඩායමක්) හඳුන්වා දිය හැකි ය. දැනට පවතින සංවිධානය යටතේ මාරු භුක්ති කරුවන් අකාර්යක්ෂමත්වයක සිටින නිසා ප්‍රතිසංස්කරණය සඳහා වන ඕනෑම උත්සාහයක මෙය මූලික අභිප්‍රාය විය යුතු අතර, අපේ අදහසේ හැටියට තවත් අභිප්‍රායයන් තිබිය හැකි ය. එනම් වැදගත්කම අනුව බලනවා නම් පරිපාලනමය ශබ්‍යතාවය නැති වී යන අයිතිය ගැන අසතුටු වන උරුමකරුවන් ගේ කොටස් බලයෙන් අත්පත් කර ගැනීමේ ප්‍රමාණය අවම කිරීම, ප්‍රතිසංස්කරණ කටයුතු කෙරෙන කාලයේ වන අර්බුද අවස්ථාවන් අවම කිරීම සහ ප්‍රතිසංස්කරණයෙන් පසු ආයතනික සැකසුම් ආදිය වේ. මෙම සියළු ම අභිප්‍රායයන් කල්පනාවට ලක් කිරීමේ දී පැහැදිලි වනුයේ ඉහත කී උපක්‍රම පහ අතුරෙන් එකක් වන කුඹුරු යාය ස්ථිර කැබලිවලට උරුමකරුවන් අතරේ බෙදීමේ පිළිවෙළ ප්‍රබල සත්‍යතාවයකින් යුක්ත බවයි. පස්වන උපාය මාර්ගය මගින් කියන යාය අත්පත් කර ගෙන කොටස් වලට බෙදා දීම පිළිබඳව නම් කිසිම සහයෝගයක් ලබා ගත හැකි බවක් නොපෙනේ. මෙම උපාය මාර්ගය මගින් මාරු භුක්තිය බොහෝ පොදු ගමක වැඩි දෙනෙකුට ඉඩම් අයිතිය නැති වීමට ඉඩ තිබෙන අතර, එය බොහෝ දූප්පත් පවුල් වලින් වීමට ද ඉඩ තිබේ. ඉඩම් ප්‍රතිසංස්කරණයේ දී මෙන් නොව, මෙම සුළු ඉඩම් අයිතිය දූප්පතුන් ගේ ප්‍රතිලාභය තකා නැප නො කළ හැකි තරමේ ය. III වන හා IV වන උපාය ක්‍රමය එක්කාසු වූ අයිතිය පිළිබඳ (සංධි වූ අයිතිය) මූල ධර්මය අත් නොහැර ඇතත් මාරු භුක්තිය නැති කර දමයි. මේවා සමහර වෙලාවට සමූපකාර මූල ධර්මයන්ට සමාන ලෙස විනිශ්චය කෙරී ඇත. මෙම උපාය මාර්ගවලින් එකක් යොදා ගැනීමේ හෝ පිළිගැනීමේ දී එයට අහිතකාරී සංදර්භයක් වැද ගැනීමෙන් එම වටිනා මූල ධර්මයන් ගේ උසස් අර්ථයන් අවමානයට ලක් වීමට ඉඩ තිබේ. තට්ටු මාරු කට්ටිමාරු භුක්ති ක්‍රමයේ පොදු අයිතිය නැත්නම් සංධි වූ අයිතියට පවා ඇති ප්‍රධාන විරුද්ධත්වය නම් එහි සුළු දෙයක් හෝ සුළු ලාභයක් තකා විශාල වශයෙන් සංවිධානමය මට්ටමක් පැවැතීමයි. බොහෝ මාරු භුක්ති ප්‍රත්‍යෙක විශාල උරුමකරු සංඛ්‍යාවකින් හා අඩු අක්කර ප්‍රමාණයකින් යුක්ත ඒවා ය. (දෙවැනි උප ග්‍රන්ථය) උරුම ප්‍රමාණය එකිනෙකා අතර විවිධ වේ. (3 වැනි කොටස). බොහෝ උරුමකරුවෝ ඉඩම පිහිටි ගමේ පදිංචි වී නැත. අද ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ සමූපකාර ව්‍යාපාර හා මාරු භුක්ති ක්‍රමවල අයිතියේ සංකීර්ණතාවය ආදිය සඳහා ලද තොරතුරු අනුව සංධි වූ අයිතිය සේම සංධි වී වගා කිරීම ආදිය කාර්යක්ෂම සේම ප්‍රතිඵල සහිත දෙයක් වීම ඇති ඉඩකඩ උපරිමය II වැනි උපාය සංවිධාන මාර්ගයට අනුව තට්ටුමාරු කට්ටිමාරු කැබලි ස්ථිරව කොටස් කඩා වෙන් කිරීම, කුඹුරු ඉඩම් ඒකාබද්ධ කිරීමේ ප්‍රතිපත්තියේ අංගයක් ලෙස සැලකිය හැකි සේම හිත්

ඇඳ ගන්නා සුළු ය. බොහෝ ඉඩම් ඒකාබද්ධ කිරීමේ උත්සාහයන් එතරම් සාර්ථක වී නැත. මෙවැනි ව්‍යාපාරයකට පුළුල් ලෙස සහයෝගයක් හෝ එය ගෙන යා හැකි පරිපාලන මය හෝ තාක්ෂණික විභවයක් පිළිබඳ ලකුණක් වත් දැන ගන්නට නැත. මෙකී තට්ටුමාරු කට්ටිමාරු ප්‍රතිසංස්කරණ වැඩ විය හැකි සමස්ථ කුඹුරු ඉඩම් ඒකාබද්ධ කිරීමේ පිළිවෙළක් තෙක් පමා වී මෙන් භුක්ති ක්‍රම මීට වඩා සංකීර්ණ වී ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය සම්පූර්ණයෙන් නොසලකා හැරීමට පවා යෝග්‍ය වීමට පිළිවන.

උපාය ක්‍රම විකල්පයන් ඉවත් කිරීමේ දී ශක්‍යතාවක් ඇති උපාය ක්‍රමයක් වශයෙන් ඉතිරි වනුයේ තට්ටුමාරු කට්ටිමාරු ඉඩම් උරුමකරුවන් ටික දෙනෙකු හෝ සියළු ම දෙනා අතර ස්ථිරව වෙන් කරන ලද කැබලි බෙදා හැරීම යි. මෙහි ද අනෙක් ඒවාට වඩා හැකියාවන් කිහිපයක් අඩංගු වනවා විනා එය සුදුස්සා ලෙස අන්තිමටම තෝරා ගත්තා නොවේ. ප්‍රකාශිත අභිප්‍රායන් ගෙන් පරිපාලනමය පහසුතාවය, ඉඩම් අහිමි වන්නන් ගේ ප්‍රමාණය හා ආරවුල් අවම කිරීමට හැර තවත් ප්‍රබල වාසිදායක බවක් එනම් මූලමනින් ම නම්‍යතාවයකින් යුත් ප්‍රවේශන ස්වරූපයක් මෙහි තිබේ. මහා උපාය මාර්ගයක් ගෙන යෑමේ දී ඒ සඳහා පුළුල් පිළිවෙළකින් යුත් විවිධ මාර්ග තිබේ. ඒ ඒ පවත්නා තත්වයන් සමනය කර ගනිමින් ලබා කර ගන්නා ජයග්‍රහන ප්‍රමාණයන්ට අනුව සහ අත්දැකීම්වලට අනුව නියම ප්‍රවේශකයක් සකස් කර ගැනීමට හැකි ය.

## 13. ප්‍රතිසංස්කරණ ක්‍රමෝපායයන්.

මාරු භුක්තිය උරුමකරුවන් අතර බෙදා දීමේ උපක්‍රමයක් යොදා ගැනීමට රජයට අවශ්‍යව ඇත්නම් ඒ පිළිබඳ තීරණය ගැනීම සම්බන්ධ ප්‍රතිපත්තිමය කාරණා දෙකක් (කට්ටල්) ඇත. පළමු ප්‍රතිපත්තිමය කාරණා එකතුව වශයෙන් දැක්විය හැක්කේ බෙදන්නට ඇති ඉඩම් ප්‍රභේදක අඳුනා ගැනීමේ කාර්යය යි. මේ තීරණය සකසා ගත හැක්කේ උරුමකරුවන් ගේ ප්‍රකාශ මගින් නැත්නම් උරුමකරුවන් ගේ අයැදීම් මත ද? මෙහි දී උරුමකරුවන් ගෙන් ලබා ගන්නා වාචික තොරතුරු මත තීරණ ගන්නේ නම් එකී වාචික ප්‍රකාශනයේ දී සියළු ම මාරු භුක්ති ක්‍රම නැති කළයුතු ද? නැත්නම් ඒවායෙන් තෝරා ගත් උප කොටසක් පමණක් ද? යන්න දැන ගත යුතු ය. උරුමකරුවන් ගේ ඇයැදීම මත තීරණ ගන්නේ නම් සියල්ලගේ ම ඒකමතික කැමැත්ත අවශ්‍ය ය. ඒකමතික කැමැත්ත අවශ්‍ය නොවේ නම් උරුමකරුවන් වැඩි දෙනෙකු ගේ අවශ්‍යතාවය කුමක් ද? එය වැඩි සංඛ්‍යාවකින් තෝරා ගැනීමක් වුවත් මුළු උරුම කරුවන් ගේ සංඛ්‍යාවට අනුව එකී සංඛ්‍යාව සුළු නම් හෝ හැම උරුමකරුවකුම ඒ ඒ කට්ටිකරුට උරුම බිම් ප්‍රමාණයට අනුව අවධානය යොමු කොට ඇත්නම් ආදී දෑ විමසීමට ලක් විය යුතු ය. අඳ ගොවියා සම්බන්ධ තත්වය කුමක් ද? බෙදීමට ඇති භුක්ති ප්‍රභේදක හඳුනා ගැනීම සිදු වන්නේ උරුමකරුවන් ගේ වාචික ප්‍රකාශන හෝ ඔවුන් ගේ ඉල්ලීම මත වුව ද, එක්කෝ එකවරම මුළු රටටම පැනෙන ඉඩම් ඒකාබද්ධ කිරීමේ වැඩ පිළිවෙළක් ද නැත්නම් ප්‍රදේශයෙන් ප්‍රදේශයට ක්‍රමයෙන් ක්‍රියාත්මක කෙරෙන පිළිවෙළක් ද යන්න ප්‍රථම කොට තීරණය කර ගත යුතු ය.

බෙදා වෙන් කිරීමේ ප්‍රත්‍යෙක හඳුනා ගත් විට ඊළඟට මතු වන ප්‍රශ්නය නම් කිනම් කොටසට ස්ථිර අයිතිය ලැබේ ද යන්නයි. සියලු ම උරුමකරුවන්ට ඔවුන් ගේ අයිති ප්‍රමාණයට සරි ලන ලෙස කැබලි වෙන් කරන්නේ ද? හෝ කැබැල්ලක අවම විශාලත්වයක් එහි දී තිබිය යුතු ද? යන්න විමසීම වැදගත් ය. එසේ අවමයක් තිබිය යුතුව ඇත්නම් එය කොපමණ ද? වෙනත් ඉඩම් අයිතිය මෙහි දී සැලකිල්ලට ගත යුතු ද? (උදා : වෙනත් තැනක ඉඩම් නැති අයෙකු ඇති විට ඔහු අක්. 1/10 ඉතාම කුඩා කොටසක් නියම ලෙසට වගා කරනු ඇතැයි බලාපොරොත්තු වීම අසීරු ය. නමුත් වෙනත් තැනක ඉඩම් ඇති පුද්ගලයෙකු නියම ගොවියෙකු වශයෙන් එම කුඩා කැබැල්ල භාර ගැනීමට පෙළඹේ). උරුම කරුවන් ගේ අයිතිය සම්පූර්ණයෙන් ම නැතිව යන්නේ නම් ඔවුන්ට වන්දියක් ගෙවිය යුත්තේ කෙසේ ද? අඳ ගොවියාට ඇති වන තත්වය කුමක් ද? ඔවුන් ඉඩම් හෝ වන්දි ලැබීමට සුදුසු ද?

ඉඩම් බෙදා වෙන් කිරීමේ උපාය ක්‍රමය යොදා ගැනීමේ හරියාකාර විධිය කෙරෙහි සැකසිය යුතු තීරණයන් තුළට කාරණා කිහිපයක් ඇතුළත් විය යුතු ය. මෙම කාරණා කිහිපය ප්‍රතිපත්ති සකස් කරන්නන් ගේ අදහස් හෝ පරිපාලන සහ තාක්ෂණික සම්පත් ලබා ගැනීමේ හැකියාව ගැන හෝ නොවේ. සමාන ලෙස, තෝරා ගැනීමේ හැකියාවන් විසින් අත්දැකීම් තුළින් ඉගෙන ගැනීමේ පුළුල් ඉඩ ප්‍රස්ථාව වෙන් කරවයි. මෙය වැදගත් කාරණයකි. අප ගේ අධ්‍යයන් ගෙන් ලබා ගත් දැනීමේ හැටියට භුක්ති ක්‍රම ක්‍රියාත්මක වීම ගමෙන් ගමට පුළුල් ලෙසම වෙනස් වේ. අප ගේ ක්ෂේත්‍ර අධ්‍යයන පහ මගින් වැදගත් සාධකයන් පිළිබඳ තොරතුරු රැස් කොට නැතිවා වෙන්නට පිළිවන. වෙන වෙනම වටහා ගන්නවාට වඩා අධ්‍යයන පහ සංසන්දනය කර තිබීම නිසා යමක් තේරුම් ගත හැකි ය. සමහර විට එහි විශාල කොටසක් තවත් ඉගෙන ගැනීමට තිබිය හැකි ය. මේ කාරණා නිසා ඉඩම් බෙදා වෙන් කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති තීරණයන් ගේ පුළුල් (පෙල්) ගැස්මෙහි ගුණ හා අගුණ දිගින් දිගටම සාකච්ඡා කිරීමට උනන්දු වීමට හෝ ගත යුතු උප රීම ප්‍රතිපත්ති සඳහන් කොට පෙන්වීමට මෙහි දී අප එකඟ නොවෙමු. පහළින් අප කර ඇති යෝජනාවන් අප ගේ විෂය අධ්‍යයන වලින් උගත් දේ මත පදනම් වී ඇත.

අප ප්‍රධාන නිර්දේශය නම් හිදිසි බෙදීමේ ක්‍රියා වලියක් අධු ගණනේ ආරම්භ කළයුත්තේ ස්වේච්ඡා පදනමක් මත ය. මෙම නිර්දේශය සොයා ගත්තේ ඉතා වැදගත් පරීක්ෂා කර බැලීමකිනි. ලාභ හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමේ ක්‍රමයක් නොමැති හෙයින් හංගත්වයට පත් ඉඩම් බෙදීම කෙරේ උරුමකරුවන් ගේ ඉතා පුළුල් කැමැත්තක් ඇත. ඉතා සරළ ප්‍රත්‍යෙක පවා කැමැත්තෙන් වූ එකඟතාවයකින් බෙදා වෙන් කර ඇත. මේ පිළිබඳව සාමාන්‍යයෙන් පොදු සාක්ෂි ස්වල්පයක් ඇත[10]. බොහෝ සංකීර්ණ භුක්ති ඉඩම් කැමැත්තෙන් බෙදා ගැනීමේ බාධා කිහිපයක් ඇත. පළමු එක නම් උරුම ස්වභාවයේ සංකීර්ණත්වය නිසා බෙදීමෙන් පසුව ගැටුම් හෝ අර්බුද ඇති වීමට හේතු වේ යයි උරුමකරුවන් බිය වීම ය. තම උරුමය ගැන සහතිකයක් අවශ්‍ය විට නීතිමය ලෙස උස් වියකින් බලපාන බෙදුම් කරණයකට කැමැති වන්නේ එහි දී වන පමා වීම් හා මුදල් වැය වීම් ද දරා ගනිමිනි. යමෙකු ගේ උරුම පංගුව ඉතා කුඩා වුවත් නීතිමය බෙදා ගැනීමක දී දැරීමට වන වියදම් හා පමාව එක සමාන ය. දෙවැනි එක නම් බෙදුම්කර සඳහා එකඟත්වයෙන් පිළිවෙළ සංවිධානයකට තරම් සෑහෙන යෝග්‍ය ආය

තන නැතිකම යි. බොහෝ සංකීර්ණ භුක්ති බිම්වල උරුමකරුවෙකු ඉතා වියදම් දරා බෙදුම්කරයක් පිළියෙළ කර සකස් කර ගෙන යන කල්හි ඔහුට අනවශ්‍ය සතුරන් හා විරුද්ධවාදිකම් එල්ල විය හැකි ය. මෙවැනි පුද්ගලයන් සමහර විට එවැනි වැඩ පිළිවෙළක දී විරුද්ධවාදිකම් මැද ඔවුන් ගේම වාසි තකා කටයුතු සකස් කර ගැනීමට පෙළඹීම පුදුමයට හේතු විය යුතු නැත (11 වැනි කොටස). නීතිමය බලතල හා පසුබිමක් ඇති 'බෙදුම් විනිශ්චය සභා' වැනි ආයතනයක් පිහිටුවීමෙන් උසාවිවල පවත්නා උසාවි වියදම් හා පමාව බැහැර කොට ලීමෙන් බොහෝ තට්ටුමාරු කට්ටිමාරු භුක්ති පංගු උරුමකරුවන් ගේ අවධානය ඒ කෙරෙහි යොමු කර ගත හැකි ය. ඔවුන් සේවය ලබා ගැනීම සඳහා එයට වඩාත් සමීප වනු ඇත. මෙම විනිශ්චය සභාව කඩිනමින් හා ලාභ ලෙස කටයුතු කළයුතු අතර, අවශ්‍ය බිම් මැනීම් හා අනෙක් සේවක මණ්ඩලයකින් යුක්ත විය යුතු අතරම ඉඩම් පිහිටි ගම්වල අවශ්‍ය කාලයක් රැඳී සිටීමේ අවශ්‍යතාවයට ද සූදානම් විය යුතු ය. මෙම 'බෙදුම්කර විනිශ්චය සභා' අලුත් ආයතන විශේෂයක් වශයෙන් හෝ නැත්නම් පවතින විශේෂයකට විශේෂිතව යොදා ගැනීමක් ද ආදී වශයෙන් සකස් කර ගත හැකි ය. උදා : පිහිටුවීමට යෝජිත ගම් සභා උසාවි.

බෙදුම්කර විනිශ්චය සභා කටයුතුවලට අදාළව, ප්‍රත්‍යෙකයක උරුමකරුවන් ගෙන් වැඩිපුර ප්‍රමාණයක පමණක් කැමැත්ත අවශ්‍ය වන විට දී, ඒ සඳහා විමසිලිමත් වීමේ දී, එවැනි එකඟත්වයකට බොහෝ ප්‍රත්‍යෙකයන්හි දී පවා ළඟා වීමට හැකි තත්වයක් ඇත්දැයි අනුමාන සහිත ය. මනුෂ්‍ය ස්වභාව අනුව හිතුවක්කාරීත්වය හැර ඉඩම් අයිතිය පිළිබඳ වෙනස් වන සුළු නීතිමය හෝ අර්ධ නීතිමය වශයෙන් නිගමනයන් මගින් එකඟතීවය ඇති කෙරෙන්නේ දැයි යන්න ද සැක සහිත ය. මෙසේ එකඟත්වය ලබා ගත්තේ වී නමුත් වෙන කවරෙකු තුළ හෝ තිබූ බලාපොරොත්තුවකට අනුව සමහර විට දුර්වල හෝ සැබෑ නොවූ අයිතීන් ඉදිරිපත් කිරීමෙන් විරුද්ධ පාර්ශවයක් වශයෙන් ලියා පදිංචි වීමට ඉඩ තිබේ. මෙවැනි අවස්ථාවක අයිතිය ඉදිරිපත් කළ එවැන්නෙකුට වෙනත් යම් යම් මාර්ගවලින් බලපෑම් කිරීමට හැකියාව තිබිය හැකි ය. (දේශපාලනික හෝ අල්ලස් දීමේ මාර්ග හෝ පුද්ගලික කරදර පැමිණවීමෙන්) මෙහි දී ඔහු සූදානමින් සිටින්නේ ටිකක් පාඩු විඳ බොහෝ ප්‍රමාණයක ලාභයක් ගැනීමට ය. මෙවැනි උපාය ශීලී පිළිවෙළවල් භුක්ති ක්‍රමයේ එදිනෙදා පැවැතෙන ක්‍රමයෙහි තිබෙනවාට වඩා [illegible] අහෝසි කර දැමීමේ වැඩ පිළිවෙළවල් වල ඇත්තේ සුළු වශයෙනි.

බෙදුම්කරයකට සියළු ම උරුමකරුවන් ගේ එකඟත්වය අනවශ්‍ය වීමට තවදුරටත් හේතුවක් ම ඇත. අඩු ගණනේ සමහර ප්‍රදේශවල හෝ භුක්ති ක්‍රමය අත්‍යවශ්‍යයෙන් ම අතුගා දැමිය යුතු නම්, ඔවුන් ගෙන් යම්කිසි ප්‍රමාණයක ගේ අයිතිවාසිකම් නැති වී යාම නොවැළැක්විය හැක් කකි. මෙයට හේතුව බොහෝ උරුම පංගු ඉතාම සුළු ප්‍රමාණයේ කොටස් වීම ය. අදාළ දත්තයන් 11 වන වගුවේ දී සාරාංශ කොට ඇත. මහගම ගමේ උරුම ප්‍රමාණයන්ට අනුව ස්ථිර කැබැලි වලට බෙදුව හොත් ඒවායින් 98% ක් ම අක්කර 1/4 ට අඩු ඒවා වීමට ඉඩ ඇති බව පෙනේ. අනෙක් ගම් දෙකේ ද එසේම අවසාන බෙදුම් කැබලි එම ප්‍රමාණයම ව වන බව පෙනේ. එසේම වන්දි දීමට සූදානම් වුවහොත් බොහෝ උරුමකරුවන් බෙදුම්කරයට විපක්ෂ වීමට ඉඩ තිබේ. බොහෝ කුඩාම පංගු උරුම නැතිව යාම වැළැක් විය නො

හැකි ය. එසේම අක්කර 1/10 කට අඩු කැබලි බෙදීමේ දී ශබ්‍යතාවයෙන් තොර ය. මේ නිසා අවම බිම් කැබැල්ලක ප්‍රමාණය කල් තියා කල්පනා කළ යුතු අතර, ඒ ඒ ප්‍රදේශවලට අනුව වැඩි අස්වැන්නක් ගෙන දෙන යෝග්‍ය නව වී වර්ග හා ක්‍රම ශිල්ප ක්‍රම අනුව ගොවිතැන් කිරීමේ දී ආර්ථිකමය අවම බිම් ප්‍රමාණය පිළිබඳ කෙරෙන විග්‍රහ මත එය පදනම් වේද? මේ ආකාරයෙන් ම අර්ධ කාලීන ගොවිතැන් කිරීමේ අභිප්‍රායයන් පිළිබඳ කල්පනාවන් ද සැලකිල්ලට ගත යුතු වේ. පූර්ණකාලීනව ගොවිතැනෙහි යෙදුණු පවුල්වලට වඩා කෘෂි අංශයේ නොවන රැකියා වල යෙදුන පවුල් ඉතාම නරක හෝ ඉතාම හොඳ ගොවිතැන් කරන්නෙකු බිහි කරන්නේ ද? ජාතික මට්ටමෙන් මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය නොහැක. වී ගොවිතැනේ අස්වැන්න කෙරේ අඳ භුක්තිය බලපෑම සම්බන්ධව දැක්වෙන සමහර සාක්ෂි මගින් එක් අදහසක් ද, තවත් සාක්ෂි සමහරක් මගින් වෙනත් අදහස් ද, ආදී වශයෙන් විවිධ අදහස් පෙන්වයි. විශේෂ ආයතනයක ප්‍රතිඵල එක සමාන නොවන ... නමුත් එය රඳා පවතින්නේ ඒ ප්‍රදේශයේ සමාජ සංදර්භය මත ය[22]. තවදුරටත් පර්යේෂණ මගින් නුදුරු අනාගතයේ දී එකී ප්‍රකාශනයන් නිරවුල් කළ හැකි ද හෝ නිරවුල් වේ ද යන්න කෙරේ බලාපොරොත්තු වීමට මගින් මතයක් ඇති විය හැකි ය. මෙම විවාදයන් බොහෝ කාලයක් පැවතීම පුළුවන. වී අස්වැන්න සහ ඉඩමේ ප්‍රමාණය හා එයට වශ ක්‍රම යොදා ගැනීම අර්ධ කාලීන ගොවිතැන් කිරීම ආදියට සම්බන්ධතාවයට පිළිගත හැකි නිගමනයන්ට ලඟා වීමට නොහැකි නම් එවැනි අවස්ථාවල මෙම සාධක තට්ටුමාරු කට්ටිමාරු ඉඩම් බෙදීමේ දී සැලකිල්ලට නොගත යුතු ය. තාක්ෂණික නිර්නායකයක් මතම තීන්දුවන බෙදා වෙන් කිරීමට පසු බිහි වන ඉඩම් කැබැල්ලේ විශාලත්වය ප්‍රමාණය කිරීමේ අවම ප්‍රමාණයක් තිබිය යුතු ය. ඉඩම් කැබැල්ලක් අයෝග්‍ය ලෙස කුඩා වන්නේ කුමන අවස්ථාවේ දී ද? මේ හැර අවම ඉඩම් අයිතිය බැහැර වීමේ මූල ධර්මය ද අනුගමනය කළ යුතු ය. දළ මඟ පෙන්වීමක් වශයෙන් සමමර විට අවම වශයෙන් අක්කර 1/4 ක ප්‍රමාණයක ඉඩම් කැබැල්ලක් යෝග්‍ය ය.

සමහර ප්‍රදේශවල බෙදුම්කරු නියම ලෙසම කර ගෙන ගිය හොත් (එකොලොස් වැනි වගුවෙන් පැහැදිලි කර ඇති පරිදි) අවම ඉඩම් විශාලත්වයට යටත්ව ඉඩම් අයිතිය අත් කර ගැනීමට නිසා උරුමකරුවන් වැඩි කොටසකට අයිතිය නැති වීමට ඉඩ තිබේ. මෙවැනි කොටස්වලින් බෙදුම්කරවලට විරුද්ධව නැඟී ඒම නම් ස්ථිරය. සංකල්ප වේදීය විරෝධතා ඇති අය ගෙන්ත් එවැනි විපක්ෂතා මතු විය හැකි ය. ඔබේසේකර ගේ කෘතියෙන් පැහැදිලි කර ඇති, සමාජ විද්‍යාඥයන් අතර ඇති අදහසක් නම් ගමක කුඹුරු ඉඩම් අයිතිය සමාජ වස්තුවක් වශයෙන් ගම් අඛණ්ඩතාවයට අත්‍යවශ්‍යම සුදුසුකමක් ලෙස ගැමියන් විසින් සලකන ලදී. මෙම අදහසට අනුව ඉතාම කුඩා තට්ටුමාරු කට්ටිමාරු උරුම කොටසේහි (ඔවුන්ට වෙනත් තැනක ඉඩම් නැති විට පවා) මෙම වැදගත් හා විටිනා සමාජ තත්වය පවරා දීමට ගිය හොත් එය ඔවුනට විශාල පාඩුවකි. මෙය ඇති විය හැකි ඉඩම් අභිප්‍රායකට විරුද්ධවීමට කෙටි පියවරක් නමුත් එක් සරල හේතුවකි. මෙම අදහස සමඟ අප ගේ යම්කිසි එකඟත්වයක් තිබේ. කෙසේ හෝ ප්‍රතිපත්ති මූලික අවධානය දශක කිහිපයකින් මෑතක දී විය යුතු ය. තෙත් කලාපයේ පහත හා මධ්‍ය රට ප්‍රදේශයේ ජනගහණයෙන් වැඩිම ප්‍රමාණයක වෙනත් කුමන ආකාරයකින් වුව ද, ඔවුන් ගේ ම ඉඩම් විශාල වශයෙන් තිබී ඇත ද, ග්‍රාමීය සාමාජිකත්වයට ඇති උරුමය අශේසි

වී ගොස් ඇත. පසුව වූ ප්‍රෝඩා හා බෙදුම් හා ඉඩම් විකිණීමේ නීතිමය බලයන් ආදියේ අවාසනාවන්ත සංකලනය නිසා බෝහෝ ගැමියන්ට ඔවුන් ගේ පාරම්පරික ඉඩම් අයිතිය නැති වී ගිය අතර, ඉඩම් අහිමි ගණයට වැටුණි. මේ නිසා කුඩා සංඛ්‍යාවත් තම අයිතීන් තට්ටුමාරු කට්ටිමාරු භුක්තිය මගින් පවත්වා ආරක්ෂා කර ගනිමින් සිටී.

පාරම්පරික ඉඩම් අයිතිය නැති වීම පිළිබඳව තත්වයට වඩා බෙදුම්කර ක්‍රියා විධියේ තවත් වැදගත් අංශයක් තිබේ. බෙදුම්කර කෙරේ එහි ක්‍රියා විදිය කෙසේ සම්බන්ධ වුවත් අදූෂය, අපක්ෂපාත, බෙදුම් විනිශ්චය සභා නිලධාරී මණ්ඩලයක් සිටිය දී වුවත් සමහර උරුමකරුවන් ගේ වියදම් ද දැරීමෙන් යම් ප්‍රතිලාභයක් ගනී. බෙදීම් ක්‍රියාවලිය කාර්යාලයීය ක්‍රම අනුව නීතිමය අර්ථයෙන් අනුනව සැලසුම් කළ මුද්‍රිත පෝර්ම මගින් ගන්නා තොරතුරු මත පදනම් වුව ද, සමහරු මේ තත්වයෙන් ද ප්‍රයෝජන ගැනීමට පෙළඹෙති. මුදල් ඇති සෑහෙන අධ්‍යාපනයක් ලත් අය නූගත් උරුම පංගු පිළිබඳ නියම අයිතීන් හා තත්වයන් පෙන්වීමට අපොහොසත්. දුප්පත් අය වෙනුවෙන් මුදල් වියදම් කිරීමෙන් හා වෙනත් කරුණු සඳහා පෙනී සිටීමෙන් වාසිදායක තත්වයක් ලබා ගැනීමට ද පෙළඹෙති. මේ තත්වයන් අවම කිරීම සඳහා සරල ක්‍රියා පිළිවෙළක් මගින් ලාභදායක හා උසස් සේවයක් ඉටු කළ හැකි නමුත් ඒවා සම්පූර්ණයෙන් මුලිනුපුටා දැමීම නම් අසීරු ය. මෙය බෙදුම්කරයන්ට විපක්ෂව තර්ක ඉදිරිපත් කිරීමක් නොවේ. මෙවැනිම පුද්ගල කණ්ඩායම් උසාවි බෙදුම් නඩුවල දී[23] හා තට්ටුමාරු කට්ටිමාරු භුක්ති ක්‍රමයේ එදිනෙදා පැවැත් මෙන් පවා ප්‍රයෝගාකාරයෙන් වාසිදායකත්වයක් ලබා ගන්නෝ වෙති.

තට්ටුමාරු කට්ටිමාරු ප්‍රභේදයන් බෙදා වෙන් කිරීම පහසු කිරීම සඳහා ගත හැකි ප්‍රතිපත්ති තීරණයන් පැහැදිලිවම තෝරා බේරා ගැනීම අසීරු කාරියකි. බෙදීමේ විනිශ්චය සභාව පිහිටු වීමේ දී ඒ සඳහා විශේෂ නීති රීති හා ව්‍යවස්ථා අවශ්‍ය වන අතර, එසේම එය ක්‍රියාත්මක වීමේ ක්‍රමය පිළිබඳ බොහෝ තීරණ හා නිගමනයන් ගැනීමට ඇති අවශ්‍යතාවය සහ සමහර උරුමකරුවන් සඳහා නීතිමය ලෙස ඉඩම් වෙන් කර ගැනීමට (වන්දි සමඟ) බොහෝ ඉඩකඩ තිබීම ආදිය ලෙස විමසිලිමත්ව බැලීමෙන් ම බෙදුම්කර කාර්ය සිද්ධීන් ගේ සංකීර්ණත්වය (උප ග්‍රන්ථය 3) මොනවට පැහැදිලි වේ. මෙම ක්‍රමයෙන් සිදු විය හැකි ප්‍රධාන අනතුර නම් ප්‍රශ්නයට අදාළ සියළුම ඉඩම් සම්බන්ධයෙන් යොදා ඇති ප්‍රතිපත්ති සහ ක්‍රියා පිළිවෙළක් අනුගමනය කිරීමට පෙළඹීම යි. කාර්ය කඩිම හා නියම පිළිවෙළට කිරීම පොරොන්දු නොවන යම්කිසි ව්‍යාපාරය (වැඩ පිළිවෙළ) පිහිටුවනවාට රාජ්‍ය නිලධාරී අංශය උනන්දු නොවේ. එවැනි කාර්ය පිළිවෙළවල් ආරම්භයේ දී එහි සරල භාවය, ශඛ්‍යතාවය හා උපරිම ස්වේච්ඡා සහභාගිත්වය ප්‍රබෝධ කෙරෙන විදියේ පැහැදිලි ඒත්තු ගැන්වීමේ පිළිවෙළක් තිබීම යෝග්‍යය. හැකිතාක් දුරට උරුමකරුවන් කණ්ඩායම් බෙදුම්කරවලට ඔවුන් ගේ කැමැත්ත දෙන්නේ ද? කෙසේ දිය යුතු ද යන්න ගැන සෙවීමට හා තීරණය ගැනීමට ඉඩ දිය යුතු ය. නමුත් බොහෝ සංකීර්ණ වූ හා උරුමකරුවන් බොහෝ වූ පංගු කොටස් ඉතාම කුඩා වූ භුක්ති ප්‍රභේදයන්හි මෙකී ස්වේච්ඡා ප්‍රවේශය සිදු විය නොහැකි ය. නමුත් බොහෝ සංකීර්ණ වූ හා උරුමකරුවන් බොහෝ වූ පංගු කොටස් ඉතාම කුඩා වූ භුක්ති ප්‍රභේදයන්හි මෙකී

ස්වේච්ඡා ප්‍රවේශය සිදු විය නොහැකි ය. නමුත් භුක්ති ක්‍රමයේ ස්වභාවය අධ්‍යයනය කිරීම තුළින් හා බෙදුම්කර ක්‍රියා කිරීමේ ගැටළු අධ්‍යයනය කිරීම් තුළින් යන පිළිවෙළවල් මගින් ස්වේච්ඡා නියායානුකූලව බෙදුම්කර ආරම්භ කිරීමේ හා කුමන දියුණුවක් ද ලබා ගත හැක්කේ යන්න මැන බැලීමට නම් බොහෝ ඉඩකඩ ඇති බව පෙනෙන්නට තිබේ. අත්දැකීම් තුළින් ලැබෙන ආලෝකය මත ප්‍රතිපත්ති හා ක්‍රියා පිළිවෙළවල් අවශ්‍ය පරිදි වෙනස් කර සකස් කර ගත යුතු ය.

## 1 වැනි උප ග්‍රන්ථය.

### මාරු භුක්ති ක්‍රම කාර්ය සිද්ධි ව්‍යාප්තිය පිළිබඳ සංඛ්‍යා විද්‍යාත්මක විග්‍රහය.

අප ගේ මාරු භුක්ති ක්‍රම ව්‍යාප්තිය පිළිබඳ සංඛ්‍යා විද්‍යාත්මක විග්‍රහය තෙත් කලාපයේ මධ්‍ය හා පහත රට මාරු භුක්ති ක්‍රමය සාමාන්‍යයෙන් පොදු දිස්ත්‍රික් හයකට පමණක් සීමා කෙරේ. (වගුව 1 බලන්න) භුක්ති ක්‍රමය දුර්ලභ කොහේ හෝ ප්‍රදේශයක අර්ථවත් සංඛ්‍යා විද්‍යාත්මක විග්‍රහයක් කිරීම පහසු නොවේ. මෙම දිස්ත්‍රික්ක හය තුළ දී වුව ද, මාරු භුක්ති කාර්ය සිද්ධිය ඉහළින් පෙනෙන්නට තිබුනේ පූර්ණ කාලීන වගා කරන්නන් ඉහළ ප්‍රමාණයක් සිටි ප්‍රදේශ වල ය. පූර්ණ කාලීන හා අර්ධ කාලීන කාර්ය සිද්ධි ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු (ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය) ලබා ගත හැක්කේ 1962 කෘෂිකර්ම සංගණනයෙන් පමණි. කුඹුරු ඉඩම්වල මාරු භුක්ති කාර්ය සිද්ධිය හා ව්‍යාප්ති පිළිබඳ දත්ත ලබා ගත හැක්කේ 1975 වර්ෂය සඳහා පමණක් වන අතර, එය කෘෂි කාර්මික පලදා වර්ධන කොමිටි මට්ටම කින් පමණකි. මෙම දත්ත ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශ මට්ටමට පෙරළා ගැනීමට හැක්කේ මාතර, ගාල්ල, කළුතර සහ රත්නපුර යන දිස්ත්‍රික්කවල පමණක් බව ද පැහැදිලි විය. මේ නිසා සංඛ්‍යා විද්‍යාත්මක විග්‍රහය අදාල වනුයේ 1962 තොරතුරු වලට අනුව දිස්ත්‍රික්ක හතරක ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශ 22 ක් සඳහා පමණි.

මාරු භුක්තිය ඒකාන්තයෙන්ම පූර්ණ කාලීනව ගොවිතැන් කරන ගොවියන් ප්‍රමාණය හා සමාගමය වී ඇත, යන උපකල්පනය පහත ප්‍රතිපායන සමීකරණ මගින් විභාග කොට ඇත.

| | | |
|---|---|---|
| පරායත්ත විචල්‍යය (Y) | = | 1975 මාරු භුක්තිය යටතේ ඇති කුඹුරු සියයට ප්‍රමාණය |
| විවරණ විචල්‍යය (X) | = | 1962 පූර්ණ කාලීන ගොවියන් වූ සුළු ඉඩම් හිමියන් ගේ ප්‍රතිශතය. (මොවුන් වගා කෙලේ අක්කර 50 කට අඩු ඉඩම් ප්‍රමාණයකි) |
| Y | = | $- 18.238 + 0.853X$ |
| $R^2$ | = | $0.55$ ; $P \angle 0.001$ ; N = 22 (ප්‍රා.ආ.නි. කොට්ඨාශ) |

සංඛ්‍යා විද්‍යාත්මක අර්ථයෙහි මාරු භුක්තියේ කොට්ඨාශාන්තර විචල්‍යතාවයෙන් 55% ක ප්‍රමාණයක් පූර්ණ කාලීන ගොවියන් වූ පුරි ඉඩම් හිමි ප්‍රමාණයේ කොට්ඨාශාන්තර විචල්‍යතාවය මගින් පැහැදිලි වී තිබේ. මාරු භුක්තිය යටතේ ඇති කුඹුරු ඉඩම් අධික ප්‍රමාණය හා පූර්ණ කාලීනව වගා කරන්නන් ප්‍රමාණයේ අධිකත්වය එකට දැකිය හැකි ලක්ෂණයකි. මේ අනුව පූර්ණ කාලීන වගා කිරීම හා මාරු භුක්තිය අතර සංඛ්‍යා විද්‍යාත්මක සම්බන්ධයක් පෙන්විය හැකි ය. මෙම සම්බන්ධය පැහැදිලි කෙරෙන්නේ කෙසේ ද යන්න ඉහත සමීක්ෂණයෙන් සාකච්ඡා වෙයි.

2 වැනි උප ග්‍රන්ථය : නියැඳි ග්‍රාමීය ප්‍රදේශයන්හි මාරු භුක්ති ක්‍රමය පිළිබඳ සංඛ්‍යා විද්‍යාත්මක දෘෂ්ටි කිහිපයක්.

වගුව 8. නියැඳි ග්‍රාමයන් ගේ මාරු භුක්ති ප්‍රත්‍යෙක ව්‍යාප්තිය - අක්කර වලින්.

| ගම (1) | (අක්කර ප්‍රමාණය) ∠1.00 | 1.00-1.99 | 2.00-2.99 | 3.00-4.99 | 5.00+ | මුළු ගණන | අක්.2.0+ වූ මාරු භුක්ති ප්‍රත්‍යෙකයන් ගේ % |
|---|---|---|---|---|---|---|---|
| මැදගම | - | - | - | - | 1 | 1 | 100% |
| මහගම* | 9 | 17 | 12 | 6 | 1 | 45 | 63% |
| ඉහළ ලේල්වල* | 16 | 18 | 6 | 8 | 1 | 49 | 65% |
| උඩුරුව | 2 | 4 | - | 1 | - | 7 | 28% |
| මහගන්ගොඩ | 4 | 2 | 1 | 2 | - | 9 | 70% |

(1) අධ්‍යයන කතුවරයන් දැන ගැනීම සඳහා වගුව 6 බලන්න.
* නියැඳි ප්‍රත්‍යෙකයන්ට පමණක් අදාළ ය.

වගුව 9. නියැඳි ග්‍රාමයන් ගේ මාරු භුක්ති ප්‍රත්‍යෙකයන් ගේ ව්‍යාප්තිය ඉඩම් උරුමකරුවන් සංඛ්‍යාව මගින්.

| ගම | ඉඩම් උරුම සංඛ්‍යාව. 1-4 | 5-9 | 10-19 | 20-49 | 50-99 | 100+ | මුළු ප්‍රත්‍යෙක |
|---|---|---|---|---|---|---|---|
| මැදගම | - | - | - | 1 | - | - | 1 |
| මහගම* | - | 1 | 3 | 22 | 6 | 13 | 45 |
| ඉහළ ලේල්වල* | (22)** | (20)** | (4)** | (3)** | - | - | 49 |
| උන්ඩුරුව | 5 | 2 | - | - | - | - | 7 |
| මහගන්ගොඩ | 3 | 5 | 1 | - | - | - | 9 |

* නියැඳි ප්‍රත්‍යෙකයන්ට පමණක් අදාළව ය.
** වගා උරුම නියම වශයෙන් අභ්‍යාසයෙහි යෙදෙන ඉඩම් කරුවන්ට පමණක් අදාළව ය.

වගුව 10. සමීක්ෂණය සිදු වූ වර්ෂයේ මාරු භුක්තිය යටතේ ඇති ඉඩම් කැබලි ව්‍යාප්තියේ ප්‍රතිශතය – ක්‍රියාත්මක ප්‍රදේශය මගින්.

| ගම | සමීක්ෂණය කෙරුණ වර්ෂයේ ක්‍රියාකාරීව පැවැති ඉඩම් කැබලි බිම් ප්‍රමාණය (අක්කර). | | | | | |
|---|---|---|---|---|---|---|
| | ∠0.25 | 0.25–0.49 | 0.50–0.99 | 1.00–1.99 | 2.00+ | මුළු ගණන |
| මැදගම | – | 13 | 25 | 50 | 13 | 100 |
| මහගම | දැන ගැනීමට නැත. | | | | | |
| ඉහළ ලේල්වල | 37 | 22 | 29 | 10 | 2 | 100 |
| උඩුරුව | 00 | 6 | 69 | 25 | – | 100 |
| මහගන්ගොඩ | – | 16 | 47 | 37 | – | 100 |

* නියැඳි ප්‍රත්‍යෙකයන්ට පමණක් අදාළ ය.

වගුව 11. ඒ ඒ උරුම ප්‍රමාණයට මාරු භුක්ති ඉඩම් සියළු ම ඉඩම් හිමියන් අතර බෙදා හැරිය හොත් බිහි වන බිම් කැබලි ව්‍යාප්තියේ ප්‍රතිශතය (1)

| ගම | ඉඩම් හිමිකරුවෙකු ගේ අක්කර ප්‍රමාණය | | | | මුළු ගණන | එක් ඉඩම් හිමිකරුවෙකුට හිමි ඉඩම් විශාලත්වයේ (අක්කර) සාමාන්‍යය |
|---|---|---|---|---|---|---|
| | ∠0.25 | 0.25–0.49 | 0.50–0.99 | 100+ | | |
| මැදගම | 42 | 27 | 31 | – | 100 | 0.39 |
| මහගම* | 98 | (2) සැලකිය යුතු නොවේ | | | 100 | 0.02 |
| ඉහළ ලේල්වල* | (74)** | (7)** | (11)** | (6)** | 100 | (0.16)** |
| උඩුරුට | 17 | 22 | 61 | – | 100 | 0.47 |
| මහගන්ගොඩ | 61 | 24 | 9 | 6 | 100 | 0.29 |

(1) එක ප්‍රත්‍යෙකයකට වඩා පුද්ගලයෙකු ගේ උරුම පංගු විසිරී පැවති විට ඒ අයිතිය වෙන් වෙන්ව ගන්නා ලදී.

* නියැඳි ප්‍රත්‍යෙකයන්ට පමණක් අදාළ ය.

** නියම වශයෙන් ම තම උරුමය භුක්ති විඳින ඉඩම් උරුමකරුවන් පමණ යි.

3 වන උප ග්‍රන්ථය.

බෙදුම්කාරයන් ගේ කාර්ය පරිපාටිමය පිළිවෙළ පිළිබඳ අදහස් කිහිපයක්.

ඉඩම් බෙදුම් වැඩ සංකීර්ණත්වයක් පෙන්වන අතර, විශේෂයෙන් ම තට්ටුමාරු කට්ටිමාරු ප්‍රත්‍යතයන් ගේ අධි සංකීර්ණත්වයක් පෙන්වන ප්‍රදේශ කෙරෙහි එය විශේෂ වේ. බොහෝ ඉඩම් වෙන් කර දීමේ තීරණ සැකසෙනුයේ ඒ හා සම්බන්ධ ලැබෙන තොරතුරු මත වන පැහැදිලි කාර්ය පරිපාටියක් මගිනි. වැදගත්, සැලකිල්ලට ගත යුතු කරුණ නම් ක්‍රියා පරිපාටි පිළිවෙළවල් හැකිතාක් සරලව තබා ගැනීම යි. ඥාණාන්විත දෙය නම් පටන් ගැනීමේ දීම සත්‍ය ලෙස තම උරුම මැතක් වන තුරුම භුක්ති නොවිඳි සියළු ම ඉඩම් හිමියන් බැහැර කිරීම යි. මේ නිසා ගැන මැන බැලීමේ කාර්යයන් හා පාඩු හා හානි කර තත්වයන් සැලකිය යුතු පරිදි සරල හා පහසු කර ගැනීමට හැකි වෙනු ඇත.

මෙහි ඇති වගුවට අනුව ඉඩම් හිමි පංගු විශාලත්වය පිළිබඳ විස්තරය සරල ය. 3 වැනි කොටසේ නියැදි ක්ෂේත්‍ර අධ්‍යයනය මත මෙම වගුවෙන් උදාහරණ පදනම් වී ඇත. මෙහි දී පැහැදිලි කර දීමේ අරමුණ සඳහා අඳ ගොවියන් බැහැර කොට ඉඩම් උරුමකරුවන් පමණි ගෙන ඇත්තේ. ඉඩම් විශාලත්වය පිළිබඳ තොරතුරු ලැබුනේ කුරුණි අනුව ය. එනම් වපසරියේ පිම්ම යි. මෙම ගමේ අක්කරයකට කුරුණි 12 ක් ඉසියි. කැබලි 'අ' සහ 'ආ' එකිනෙක කුරුණි 20 ක ප්‍රමාණයකි. කැබලි 'අ' කුරුණි 15 ක ඉඩමකි. මුළු යායම කුරුණි 55 ක ඉඩමකි. මෙම වගුවේ දී රාමුව තුළ අඳ ගොවියා ගේ අයිතිය ඇතුළත් කිරීමට පහසු වී තිබේ. එක්තරා ප්‍රතිපත්ති තීරණයක් මගින් අවුරුදු 5 කට වඩා ඉඩම් භුක්ති විඳි අඳ ගොවියාට ඉඩමෙන් 1/2 හා ඉතිරිය උරුමකරුට අයිති වන විදියේ පිළිවෙළක් යෙදුනා යයි අප සිතා ගත හොත් මෙම වගුවේ දී වැඩිපුර තීරුවක් සියළු ම අඳ ගොවියන් සඳහා වෙන් කර ගත හැකි ය. මේ අනුව මේ වගුවට සම්බන්ධ භුක්ති උරුම ගැන මැන බැලීමේ කාර්ය ස්වභාවය මනාව පැහැදිලි ය. මෙවැනි කාර්යක්ෂම වගුවක ප්‍රයෝජන නම් ඉඩම් හිමිකරුවන් පිළිබඳ පැහැදිලිතාවයක් හා උරුමතාවයන් සඳහා විග්‍රහාත්මක පදනමක් සැලසීම යි.

| චක්‍රයේ වර්ෂය | දර්ශන වර්ෂය | ඉඩම් හිමි කරුවන් ගේ නම් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජසිනෝනා | රයිනිස් | ඇලිස්නෝනා | සාර්ලිස් | සීමන් | පීටර් | එල්.එල්.6 | මුළු ගණන |
| 1 | 1976/1977 | 20 | 20 | 15 | – | – | – | – | 55 |
| 2 | 1977/1978 | 15+20 | – | – | 10 | 10 | – | – | 55 |
| 3 | 1978/1979 | 20 | – | 15 | – | – | 20 | – | 55 |
| 4 | 1979/1980 | 15+20 | – | 20 | – | – | 20 | – | 55 |
| 5 | 1980/1981 | 20 | – | 15 | – | – | – | 20 | 55 |
| 6 | 1981/1982 | 15+20 | 20 | – | – | – | – | – | 55 |
| චක්‍රය පුරා ඉසින ලද කුරුණි ප්‍රමාණය | | 165 | 60 | 45 | 10 | 10 | 20 | 20 | 330 |
| මුළු යායේම උරුම ප්‍රමාණ සියයට | | 50% | 18.2% | 13.6% | 3.0% | 3.0% | 6.1% | 6.1% | 100 |

කුඹුරු යායේ උරුම පංගුව ඉතාම කුඩා වූ හෙයින් ඉඩම් අයිතිය අහිමිව ගිය විට පුද්ගලයන්ට වන්දි ගෙවීමේ දී ගෙවිය හැකි ප්‍රමාණය තීරණය කිරීම දෙවැනි ප්‍රධාන ගැටළුව යි. පහත සඳහන් ක්‍රියා පිළිවෙත සළකා බැලිය හැකියි.

(I) ඉහතින් දී ඇති වර්ගයේ වගුවක පදනම මත, යායේ ඒ ඒ උරුමකරුට අයිති උරුම ප්‍රමාණය සොයා ගැනීම යි.

(II) මෙම උරුම ප්‍රමාණයන් අක්කරවලට හරවා ගැනීම. උදාහරණ වශයෙන් නාමික උරුමය අඩංගු වන ආකාරය පහත දැක්වේ. (උදාහරණමය ප්‍රතෙයකයකි මගින්).

| ඉඩම් හිමිකරු ගේ නම | ජසිනෝනා | ඒයිනිස් | නෝනා | ඇලිස් සාර්ලිස් | සීමන් | පීටර් | එල්.එල්. මුළු 6 ගණන |
|---|---|---|---|---|---|---|---|
| යායෙන් උරුම සියයට ගණන | 50 | 18.2 | 13.6 | 3.0 | 3.0 | 6.1 | 6.1 | 100 |
| නාමික පංගුව අක්කරවලින් | 2.29 | 0.83 | 0.62 | 0.14 | 0.14 | 0.28 | 0.28 | 4.58* |

4.58 අක්කර = 55 කුරුණි ÷ 12

(III) නාමික උරුමය අක්කර වලින් ගත් විට කිසියම් නියමිත ප්‍රමාණයකට පහළ නම් ඒ අය ගේ නම් බැහැර කර දැමීම, **උදාහරණ** වශයෙන්, නියමිත අවම ප්‍රමාණය අක්කර 1/4 නම් සාර්ලිස් හා සීමන් යන දෙදෙනා ගේ උරුම මෙම ප්‍රමාණයකයෙන් බැහැර කෙරෙයි.

(IV) මීට පසුව ඔවුන් ගේ නාමික උරුම කොටස් දෙක වෙන්දේසියේ විකිණීමට ඉදිරිපත් කිරීමට සිදු වේ. මෙවිට අනෙක් උරුම කරුට හෝ පිට කවරෙකුට හෝ මිළ දී ගත හැකි ය. මෙම සුළු උරුමකරුවන් දෙදෙනා ගෙන් අයෙකු එම සුළු කැබැල්ලක් මිල දී ගැනීමෙන් ඔහු ගේ කැබැල්ල අවම ප්‍රමාණයට වඩා විශාල වන නිසා ඔහුට උරුමකරුවෙකු වශයෙන් තවදුරටත් සිටිය හැකි වේ.

උදා : සාර්ලිස් ගේ කොටස වන අක්කර 0.14 සීමන් මිල දී ගැනීමෙන් ඔහු ගේ පංගුව අක්කර 0.14 + අක්කර 0.14 = අක්කර 0.28 වීමෙන් අවම විශාලත්වය අභිබවා සිටින බැවින් ඔහුට තවදුරටත් උරුමකරුවෙකු වශයෙන් සිටිය හැකි ය.

(V) මෙසේ උරුමයෙන් පහ වෙන සුළු ඉඩම් හිමියන්ට වන්දි වශයෙන් එම ඉඩම් කොටස වෙන්දේසිකර ලබා ගත් මුදල ගෙවිය හැකි ය.

ඊළඟ ප්‍රශ්නය නම් ඉහත සඳහන් ක්‍රියා පටිපාටිය අනුව නාමික අයිතිය ඉතිරි ව උරුමකරුවන් අතරේ ඉඩම් බෙදා දීම යි. මේ සඳහා කරුණු දෙකක් ඉදිරිපත් කළ හැකි ය. එකක් නම් ඉඩමේ ගුණාත්මක විවිධතාවයන් (පසේ විවිධත්වය – ජලය ලබා ගැනීමේ පහසුව ජල ගැලීමට ලක්වීමේ හැකියාව හා වදල සහිත විශාල ගස්) සිතේ තබා ගනිමින් ඒ ඒ උරුමකරු ගේ උරුම ප්‍රමාණය අක්කර වලින් සකස් කර ගැනීම යි. දෙවනු එක නම් එක්තරා විශේෂ පුද්ගලයෙකුට වෙන් කරන්නේ කෙසේ ද යන්නයි. මෙහි දී යායක සියළු ම කොටස් එක සමාන වටිනාකමකින් ඇත්තේ කොහේ ද? එසේම සියළු ම අයිතිකරුවන්ට සමාන ප්‍රමාණයක උරුම කම් බෙදී ඇත්තේ කෙසේ ද? යන්න සොයා ගැනීම පහසුම ක්‍රමය යි. අනතුරුව චක්‍රයේ අවසාන

අවුරුද්දවල වගා කරන පුද්ගලයා විසින් බිම් කැබලි වෙන් කරනු ලැබේ. ඒ අනුව උරුමකරුවන් විසින් තම වාරයට අනුව බිම් කැබලි තෝරා ගනී. ආරම්භය චක්‍රයේ වර්ෂයේ උරුමකරු ය. මේ අනුව මාරු භුක්ති කුඹුරු කැබැල්ල ගුණාත්මක වටිනාකම් අනුව අනෙක් උරුමකරුවන් ගේද සහයෝගයෙන් කැබලි වෙන් කරනු ලබන්නේ භුක්ති චක්‍රයේ අවසාන වාරය හිමි උරුමකරු ය. තම තම කැබලි තෝරා ගැනීම කෙරෙනුයේ භුක්ති චක්‍රයේ ආරම්භයේ සිට ක්‍රියාත්මක වන මුර පිළිවෙළට ය. මේ අනුව පළමුව කැබැල්ල තෝරා ගනුයේ භුක්ති ක්‍රමයේ ආරම්භක පුද්ගලයා ය. ඊළඟට දෙවෙනියා ය. මේ පිළිවෙළට යන විට අවසාන කැබැල්ල හිමි වනුයේ කැබලි වෙන් කිරීමේ කාර්ය කළ පුද්ගලයාට ය. මේ නිසා සාධාරණ ලෙස සමයේ කොටස් බෙදීමට ඔහු පෙළඹේ.

මෙසේ කොටස් බෙදා කට්ටිකරුවන්ට දුන් විට මේ කාර්යය සඳහා ගිය වියදම් සියළු ම පංගු උරුමකරුවන් ගෙන් ඒ ඒ උරුම අනුපාතයට අය කර ගනු ලැබේ. සම්පූර්ණ මුදල් අය වූ පසු ඉඩම් ඔප්පු කරුවන් වෙත නිකුත් කළ හැකි ය.

ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කළ සැකැස්ම සාධාරණත්වය හා පැහැදිලි ක්‍රියා පිළිවෙළ යන අභිප්‍රායයන් මත සකසන ලද්දකි. සමහර විට සර්ව සම්පූර්ණ නොවිය හැක. එසේම අවුල් බවක් පෙනෙන්නට තිබෙන්නාක් මෙන් ම සෑහෙන නීතිමය හා මිණුම් කටයුතු පිළිබඳ ප්‍රගුණත්වයක් ද අවශ්‍ය ය. එසේම සම්බන්ධ විය හැකි නිලධාරී කටයුතු පිළිබඳ වන පක්ෂපාතී හා දූෂ්‍යත්වයන් ගැන ද සාපේක්ෂ අවධාරණයක් තිබිය යුතු ය. යෝජිත කාර්ය විධියට අනුව සෑම උරුමකරුවෙකුම ඔහු ගේ වගා මුරයට අනුව පංගු තෝරා ගන්නා නිසා කිසිම වන්දියක් ගෙවිය යුතු නොවේ. තාර්කිකව පහසු වූවත්, කට්ටි පැවරීමේ හා වන්දි ගෙවීමේ කාර්ය චක්‍රයට ගෙවෙන මහන්සියේ තරමට ලැබෙන ප්‍රතිලාභ බොහෝ පහළ විය හැකි ය.

මේඅනුව බෙදීමේ ක්‍රියාකාරත්වයේ ප්‍රතිඵල වශයෙන් ප්‍රශ්න රාශියක පැටලේ. ක්‍රියා පිළිවෙළ කෙටුම්පත් කිරීමේ දී හා ක්‍රියාවලිය විමර්ශනය කිරීමේ දී හා නීතිමය නිල ක්‍රියාකාරීත්වය ඉහළින් ක්‍රියාත්මක විය හැකි අතරම මෙකී ගැටළු වලින් අන්තරායකාරී වන දර අඩු විනිශ්චයකට පවා සෑහෙන තරම් ඉඩකඩ තිබේ. අවශ්‍ය නීතිමය හා මිණුම් ප්‍රගුණතාවයක් ඇතියා විරහිත උපාධි ධාරීන්ට විශේෂ නියමිත කාලයක් තුළ ප්‍රගුණ කිරීමෙන් ලබා ගත හැකි ය. මෙවැනි ක්‍රියා පිළිවෙලක් සඳහා කාලයක් ගත වන නමුදු බොහෝ ප්‍රතිලාභ සහිත ය. අවශ්‍ය පරිදි සේවය ලබා ගැනීමට අපහසු වෘත්තීය නීතිඥයින් ගේ හා මිණුම් දෝරුවන් ගේ සේවයට වඩා මෙම පිළිවෙළ ලාභ සහිත සේම කාර්යක්ෂම ය. ප්‍රධානම අවශ්‍යතාවය නම් සේවයට සූදානම හා අභිප්‍රාය ලබා ගැනීම යි.

4 වැනි උප ග්‍රන්ථය : ගොඩ බිම් සම්බන්ධයෙන් සංඝීය අයිතිය.

එකම දේපලක කුඹුරු ඉඩම් මාරු භුක්තියක පවතින්නා සේම ගොඩ ඉඩම් සංඝීය උරුමයක පවතී. උදාහරණ වශයෙන් තට්ටුමාරු කට්ටිමාරු භුක්තියක පංගුවක් උරුමය ඔහු ගේ දරුවන්

දෙදෙනා අතර බෙදී යයි. ගොඩ බිමේ උරුමය භුක්ති විඳින්නේ ඉඩමේ පොටසක ගෙයක් සාදා ගැනීමෙන් හා එලදාව කොටසක් ලබා ගැනීමෙනි. බොහෝ විට පලදාවේ කොටස ගනු යේ ස්ථිර භෝග වලිනි. යමකු ඉඩමේ එලවළු වගා කර ගන්නේ නම් එහි සම්පූර්ණ අයිතිය වගා කර ගත් අයට ය. එහෙත් යමෙකු පොල් කැඩුව හොත් එයින් උරුමකරුවන් ගේ පංගු බෙදා දිය යුතු ය.

බොහෝ ප්‍රදේශවල මෙම ගොඩ බිම් පිළිබඳ පොදු උරුමය සාමාන්‍ය ය. ඔබේසේකර අධ්‍ය යන කළ මැදගම ගමේ ගොඩ බිම මුල දී එක් දේපලක් වූ අතර දැන් උරුමකරුවන් පොදු අයිතිය මත භුක්ති විඳිති. ඉහළ ලේල්වලට ද මේ පොදු ය. පොදු අයිතිය ඇති ඉඩම් සම්බන්ධයෙන් කුමන කුමන පුද්ගලයාට උරුමය හා බලය කෙසේ පැවරෙන්නේ ද යන අවයාජ පිළිවෙත් කෙරේ අපට ඇත්තේ සාපේක්ෂ වශයෙන් අඩු දැනුමකි. ඔබේසේකර වඩා උනන්දු වී ඇත්තේ කුඹුරු ඉඩම් කෙරෙහි ය. ගොඩ බිම් කෙරේ මාරු භුක්තිය ක්‍රියාත්මක නොවේ. කෙසේ වූවත් ඉඩම් ආන්තික වශයෙන් ම කැබලි වී ගොස් ය. සියළු ම උරුමකරුවන්ට සෑම කොටසකටම උරුම කීම අපහසු වී ඇත්තේ මේ නිසා ය. එහෙත් ගොඩ ඉඩම් කැබලි ඉතා කුඩා වූවත් එහි වටිනාකම අධික වීමේ උපනතියක් පෙනේ. මේ නිසා බොහෝ උරුමකරුවන් නාමික අයිතිය දිගටම පවත්වා ගෙන යයි. උරුම ප්‍රමාණයට දීර්ඝකාලීන භෝග වැනි දෑවල එලදාවේ කොටස් ලබා ගනී. මේ නිසා උරුමයට වටිනාකමක් ලැබෙන අවස්ථාවක් කෙරේ අයිතිය පවත්වා ගැනීමට හැකි වේ. උදා: රජයේ පොදු කාර්යයකට ඉඩම් අත්කර ගැනීමේ දී වන්දි වශයෙන් හෝ තම උරුමයට ද වටිනාකමක් ලැබේ.

උරුමකරුවන් තම නාමික උරුමය දිගටම පවත්වා ගෙන යෑම සඳහා දරණ සමහර ප්‍රයත්න බොහෝ විට අසල්වැසියන්ට මෝඩ හා කෝලම් සහිත ලෙස පෙනේ. මෑතක දී ඉහළ ලේල් වල කුණාටුවට අසු වී කොස් ගසක් ඉදිරි වැටුනි. සතියක් යන තුරු එය එසේම තිබුනි. පසුව ඉඩම් ජීවත් වන්නා එය කපා ඉරා ගැනීමට තීරණය කෙලේ ය. එවිට අසල්වැසි උරුමකරු තම අයිතිය ඉදිරිපත් කෙලේ ය. දෙදෙනා අතර මුදල් බෙදා ගැනීමට තීරණය විය. පසුව කොස් ගසේ විකුණුම් මිළ පිළිබඳ දෙදෙනා අතර අවුලක් ඇති විය. මේ ආරංචිය පැතිරයත්ම අනෙක් උරුමකරුවෝ ද තම උරුමයන් ඉදිරිපත් කලෝය. මේ නිසා එකඟත්වයකට ඒමට සෑහෙන කාලයක් ගත විය. ඉහළ ලේල්වල 1951 කොස් ගස් තුනක් විකුණා ඇත්තේ රු.50.00 කට ය. ග්‍රාම සේවක ගේ උපකාර ඇතිව මේ පිළිබඳව ලබා ගත් පූර්ණ විස්තර අනුව එම ඉඩමේ උරුමකරුවන් අතර එම මුදල බෙදී ගිය අයුරු සතස් කිරීමට අපට හැකි විය. ඒ පහත සඳහන් පරිදි ය.

| උරුමකරු ගේ නම | පංගුව | මුදල් වටිනාකම |
| --- | --- | --- |
| ජේ.පී.ඩී.ඒ. ද සිල්වා | (1/5 X 1/2) + (1/5 X 1/2 X 1/5) + (1/5 X 1/2 X 1/5 X 1/2) + (1/5 X 1/8 X 1/2) + (1/5 X 1/8 X 1/2 X 1/3) + (1/5 X 1/8) + (1/5 X 1/3 X 1/8 X 1/2) + (1/ (1/5 X 1/3 X 13/20) + (1/5X1/2) (1/5 X 1/2 X 1/4) | රු. 18.40 |
| බී.ටී. අන්ද්‍රයස් | (1/5 X 1/2 X 2/5) + (1/5 X 1/3 X1/5 X 1/2 X 1/4) | රු. 6.43 |

මීට අමතරව පිළිවෙළින් රු.7.60, 4.70, 1.68, 0.55, 0.82, 0.55, 1.95, 1.80, 1.95, 0.97, 0.73, 0.46 සහ 0.46 බැගින් උරුම වූ උරුමකරුවන් 14 දෙනෙක් ද විය.

පොදු උරුමය යටතේ ඇති ගොඩ ඉඩම්හි අයිතිය අවස්ථානුකූලව පොල් ගෙඩි කිහිපයක් කඩා ගැනීම හෝ ආදී ක්‍රියා මගින් ඉදිරිපත් වුවත් මාරු කුඹුරු ඉඩම් හි මාරු භුක්තිය අයිතියට වඩා අවිනිශ්චිත හා පැටලිලි සහිතය. ලබා ගත හැකි වාර්තා පරීක්ෂාවෙන් බැලීමෙන් අමතක වූ උරුම බොහෝ ඇති බව පැහැදිලි ය. මෙවැනි තත්වයක දී යම් කිසි තරඟකරුවෙකු සියළු ම අමතක වී ගිය උරුම මිළ දී ගැනීමට තීරණය කළ විට උරුමය පිළිබඳ එකී අය ගේ විශ්වාසය පැහැදිලි කර ගැනීමේ දී බොහෝ අපහසුතාවයන්ට ලක් වීමට ඉඩ තිබේ.

ගොඩ ඉඩම් සම්බන්ධ පොදු උරුමය කෙරෙහි බලන විට එය නිෂ්පාදනය කෙරේ ඇති කරන හානි කර බලපෑම් සුළු වන අතර, කුඹුරු ඉඩම්වල මෙන් නොව, බෙදුම්කර ප්‍රවණය කිරීමට ඇත්තේ බොහෝ අඩු ප්‍රබලත්වයකි. එසේම පවතින තත්වය බොහෝ සංකීර්ණය. එසේ හෙයින් මෙකී භුක්තිය සම්බන්ධ යටගිය අවුල් මතු කර ගැනීම ප්‍රදාගෝචර නොවේ.

i.

සටහන්.

1. පී. ගනේවත්ත ; 'තට්ටුමාරු සහ කට්ටිමාරු' කුඹුරු ගොවිතැනේ මාරු භුක්ති ක්‍රමය. වාර ප්‍රකාශන මාලා අංක 6. ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, කොළඹ. 1974. පිටු 1-3. ජී. ඔබේසේකර, 'ලංකාවේ ග්‍රාමීය ඉඩම් භුක්තිය' කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයීය මුද්‍රණාලය, 1967. පිටු 35-36. අයි.කේ. වීරවර්ධන සහ අයි. කොලොන්නගේ 'තට්ටුමාරු කට්ටිමාරු අධ්‍යයනය' ග්‍රාමීය පලදා වර්ධන නීති අංශය, කොළඹ. 1971. ගල් අච්චුවේ මුද්‍රණය කරන ලදී. පිටු 14-24.

2. වීරවර්ධන හා කොලොන්නගේ - පිටු 17.

3. වීරවර්ධන හා කොලොන්නගේ පිටු 22-23.

4. ගොවිතැන් කිරීමේ ශිල්ප ක්‍රම පිළිබඳව පසුව එන සාකච්ඡාව තට්ටුමාරු කට්ටිමාරු භුක්තිය බොහෝ සේ සංකේන්ද්‍රනය වූ ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ පහත මධ්‍ය රට ප්‍රදේශවලට අදාළව ය.

5. තෙත් කලාපයේ පහත හා මධ්‍ය රට ප්‍රදේශවල අස්වැන්න බිත්තර වී ප්‍රමාණය මෙන් දහ ගුණයක්ව වැඩි ය. පැරණි මිනිසුන්ට එයටත් අඩු අස්වැන්නක් තිබූ කාලවල් මතකය. රටෙහි අනෙක් ප්‍රදේශවල අස්වැන්න සාමාන්‍යයෙන් මේ ප්‍රමාණයට වඩා බොහෝ වැඩි ය.

6. මෙම ශබ්ද විග්‍රහාත්මක ගැටළු හේතුවෙන් ඔබේසේකර කියන්නාක් මෙන් (පිටු 36) නිල සංඛ්‍යා ලේඛන සත්‍යය නිවැරදි මාරු භුක්ති කාර්ය සංසිද්ධි ව්‍යාප්තිය පිළිබඳව අධි ප්‍රකාශිතත්වයකට වඩා ඌණ ප්‍රකාශිත තත්වයක් ගන්නා බව පෙනේ. ඒවා ලබා ගන්නා ලදුව ඇත්තේ 'ඔබ ගේ කොට්ඨාශයේ තට්ටුමාරු කට්ටිමාරු භුක්ති යටතේ කොපමණ ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා ද? ආදී ප්‍රශ්න නිලධාරීන් ගෙන් ඇසීමෙනි.

7. වීරවර්ධන හා කොලොන්නගේ පිටු 6. මෙහි සංඛ්‍යා බොහෝ නිවැරදි යයි සලකනු ලැබේ.

8. වියළි කලාපයේ මාරු භුක්තිය දුර්ලභ වීමට සාධක තුනක් පෙනේ. එකක් නම් සිංහල නොවන (මුස්ලිම් හා දෙමළ) ජන කොටස් විශාල ප්‍රමාණ වශයෙන් සිටීම යි. දෙවනුව බොහෝ ඉඩම් විශාල ගොවි ජනපද ව්‍යාපාර විසින් අස්වද්දා බෙදා දෙන ලද මෑත අතීතයක් ඇති ඒවා ය. තෙවනුව පැරණි වැව් යටතේ වගා කෙරෙන පැරණි ගම්මාන වල මෙම භුක්තිය අවශ්‍ය නොවුනා සේම හැකියාවක් ද නොතිබුණි. වැවට ලැබෙන ජල ප්‍රමාණය අනුව පයිර වගා කරන බිම් ප්‍රමාණය තීරණය වූයේ. ඒ අනුව බෙත්ම වගාවල ද වැවේ ජලයට සරිලන සේ උරුම ----------------------------------------

ප්‍රමාණ අනුව බෙදා ගෙන වගා කරන ලදී. (ඊ.ආර්.ලීච් - පුල්එළිය : 'ලංකාවේ ගමක්' කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයීය මුද්‍රණාලය. 1965. පරිච්ඡේද 5).

9. ඔබේසේකර. පරිච්ඡේද 7.

10. උදාහරණ - මහගන්ගොඩ අප ගේ විෂය අධ්‍යයනයේ 1976 තට්ටුමාරු ප්‍රත්‍යෙකයන් 9 ක් තිබුණ අතර, තවත් ප්‍රත්‍යෙක තුනක් (එකක් සරල කට්ටිමාරු සහ දෙකක් සරල තට්ටුමාරු) පසුගිය වසර තුන ඇතුළත උරුමකරුවන් ගේ පොදු කැමැත්ත පිට ස්ථිරව බිම් කැබලි වලට බෙදා ගන්නා ලදී.

11. දිස්ත්‍රික්කය තුළ එකක් වශයෙන් ගත් විට සාපේක්ෂ වශයෙන් වඩාත්ම උග්‍ර තට්ටුමාරු කට්ටිමාරු කාර්ය සිද්ධි කුඹුරු ඉඩම් 47% ක වූ අතර, අවමය 18% ක් විය. (දත්ත මූලාශ්‍රය I වැනි වගුවේ පරිදිම ය).

12. ඔබේසේකර ඔහු ගේ අධ්‍යයනයේ දී ප්‍රාදේශීය ව්‍යවහාර අනුගමනය කලේ සාමාන්‍යයෙන් හඳුන්වන කට්ටිමාරු හා අප විසින් නම් කර ඇති සම්බන්ධ තට්ටුමාරු කට්ටිමාරු යන දෙකටම 'තට්ටුමාරු' යන්න යොදා ගනිමිනි.

13. ඔබේසේකර 'මැදගම' ගමෙහි පරියේෂණය කෙරෙන කාලය තුළ සිටි ජනගහණය 289 ක් හෙයින්. (පවුල් 47 කි).

14. අනෙකුත් දේ අතර, කුඹුරු අස්වැන්න සඳහා රක්ෂණය සංවිධානයට ද එය ඉතාම අසීරු නිසා ය.

15. ඔවුන් අධ්‍යයනය කළ ගම්මානයේ මාරු භුක්තිය යටතේ වූ කුඹුරු අක්කර ප්‍රමාණය 188 කි. මේ ඉඩම වගා කිරීම සම්බන්ධයෙන් 1970/71 ආරවුල් සහ පැමිණිලි 122 ක් වූ බව ගොවි කාරක සභාව නිල වශයෙන් වාර්තා කොට ඇත. (පිටු 58-68).

16. මාරු කරන පංගු සඳහා වන්දි ලබා ගැනීමේ හැකියාවන්ට උත්තරකරුවන් ඉදිරිපත් වූයේ ද (කැමති වූයේ ද නැද්ද) යන්න පිළිබඳ වාර්තාවෙන් පැහැදිලි නොවේ.

17. ගනේවත්ත ක්ෂේත්‍ර අධ්‍යයනයේ ප්‍රීතිදායක හා බොහෝ අදාළ වැදගත් කොටසක් ඇත. (පිටු 8).

'එක් ගොවියෙකු පැහැදිලි කර පෙන්වූයේ .......... එළදාව මත තට්ටුමාරු කට්ටිමාරු බලපෑම ........... පිළිබඳ සිංහල ග මි වහරේ එන කියමනක් වන 'ආඩි හත්දෙනා ගේ කැඳ හැලිය වාගේ' යන්න : මෙහි වචනාර්ථය ගත් කළ එක්තරා (තැන තැන යාම පුරුද්දක් කොට ගත්) කණ්ඩායමක් පිළියෙළ කර ගත් හාල් කැඳ

ආහාරය වශගේ යන්න යි. (එක් උදෑසනක ආඩි නම් තැන තැන යන එක්තරා ශ්‍රෝත්‍රිය කුලය කට අයිති හත් දෙනෙකු ගෙන් යුත් ආහාරය සඳහා කැඳ පිළියෙළ කිරීමට සිදු විය. හැම කෙනෙක් ම තම කොටස වශයෙන් මුට්ටියට හාල් මිට මිට දැමිය යුතු විය. හැම කෙනෙක් ම එපරිදි කරන බව මුට්ටිය ළඟට යෑමෙන් ඇඟෙව්වේ ය. නමුත් කිසිවෙක් එපරිදි කර තිබුනේ නැත. සියල්ලෝ ම අනුන් ගේ පොටසින් යැපීමට සිතා සිටියෝ ය. අන්තිමට බීමට තිබුනේ නටන වතුර පමණි.)

18. මේ තොරතුරු මහගන්ගොඩින් නොලැබේ.

19. ඔබේසේකර පිටු 166-178, ටී. නඩරාජා 'අධිකරණ පරිපාලනය'. 1976 සිට 1948. II නිතිය. කේ.එච්. ද සිල්වා (සංස්කාරක). ලංකා ඉතිහාසය වෙළුම 3. 19 වන සියවසේ ආරම්භයේ සිට 1948 දක්වා. කොළඹ 1973.

20. ඔබේසේකර. පිටු 179-182.

21. ඔබේසේකර. පිටු 181.

22. පී.එච්. පීරිස්, 'ශ්‍රී ලංකාවේ පංගු අඳ ක්‍රම හා භුක්ති ප්‍රතිසංස්කරණ'. 'සිලෝන් ජර්නල් ඔ/ෆ් හිස්ටරිකල් ඇන්ඩ් සෝෂල් ස්ටඩීස්'. එන්.එස්. 6(1). ජනවාරි - ජූනි, 1976.

23. ඔබේසේකර. පරිච්ඡේද 7.